2022 ජූලි 25
2022 யூலை 25
25th July 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 03
பதினோராவது தொகுதி - 03
Eleventh Volume - 03

## රාජ්‍ය අරමුදල්
## அரசாங்க நிதியங்கள்
## Government Funds

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



**විගණකාධිපති ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව (2018,2019,2020)**

**------------------------------------------------------------------**

**පටුන**

**---------**


| අංකය<br>----------- | අරමුදලේ නම<br>------------------- | පිටු අංකය<br>--------------- |
|---|---|---|
| | සාරාංශය | 3-4 |
| 01 | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 5-6 |
| 02 | මිනුම් ඒකක,ප්‍රමිති සහ සේවා අරමුදල | 7-8 |
| 03 | සිරකරු සුභසාධක අරමුදල | 9-12 |
| 04 | අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරය | 13-14 |
| 05 | සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල | 15-17 |
| 06 | වන සත්ත්ව සංරක්ෂණ අරමුදල | 18-22 |
| 07 | සංචාරක සංවර්ධන අරමුදල | 23-24 |
| 08 | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල | 25 |
| 09 | හින්දු සංස්කෘතික අරමුදල | 26-27 |
| 10 | පොලිස් ත්‍යාග අරමුදල | 28-29 |
| 11 | දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල | 30 |
| 12 | ජාතික ආරක්ෂක අරමුදල | 31-32 |
| 13 | අපි වෙනුවෙන් අපි අරමුදල | 33-34 |
| 14 | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | 35-38 |
| 15 | ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | 39-44 |
| 16 | සමාගම් අරමුදල | 45-47 |
| 17 | බුද්ධිමය දේපළ අරමුදල | 48-50 |
| 18 | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල | 51-59 |
| 19 | රේගු අතිකාල,නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු  හා තාක්ෂණ සන්නිවේදන අරමුදල | 60-62 |
| 20 | සුරාබද්දු තැගි අරමුදල | 63-66 |
| 21 | සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදල | 67-69 |
| 22 | හිමිකම් රක්ෂණ අරමුදල | 70-71 |
| 23 | මහනුවර ඇසළ පෙරහැර භාරය | 72-73 |
| 24 | රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල | 74-76 |
| 25 | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල | 77-79 |
| 26 | ගොවිජන සංවර්ධන අරමුදල | 80-81 |
| 27 | මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල | 82-86 |

| | | |
|---|---|---|
| 28 | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාභාරය | 87-92 |
| 29 | ත්‍යාග හා දිරිදීමනා අරමුදල (මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව) | 93-94 |
| 30 | ගොවීන්ගේ භාරකාර අරමුදල | 95-103 |
| 31 | සමූපකාර අතිරික්ත අරමුදල | 104-106 |
| 32 | සමූපකාර සංවර්ධන අරමුදල | 107-109 |
| 33 | ශ්‍රම වාසනා අරමුදල | 110-113 |
| 34 | ජාතික ක්‍රීඩා අරමුදල | 114-117 |
| 35 | ධීවර ත්‍යාග අරමුදල | 118-123 |
| 36 | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය කළමනාකරණ භාරය | 124-132 |
| 37 | සේවක අර්ථසාධක අරමුදල | 133-150 |
| 38 | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල | 151-154 |
| 39 | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 155-158 |
| 40 | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 159-161 |
| 41 | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය | 162-163 |
| 42 | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල | 164-165 |
| 43 | උද්භිද උද්‍යානභාර අරමුදල | 166-167 |
| 44 | තුරුසවිය අරමුදල | 168-170 |
| 45 | වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල | 171-176 |
| 46 | COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල | 177-181 |
| 47 | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල | 182-191 |
| 48 | ජනාධිපතිවරයාගේ අරමුදල | 192-198 |
| 49 | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල | 199-202 |

## සාරාංශය

-------------------------------

නිශ්චිත පරමාර්ථයක් ඉටු කර ගැනීම අරමුණු කර ගෙන ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 62ක් ස්ථාපිත කර ඇති අතර එම සියළුම අරමුදල් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් යටතේ ක්‍රියාත්මක වනු ලබයි. මෙම අරමුදල්වලින් 55 ක් පමණක් පනතක්, අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් හා නියමාවලින් යටතේ ස්ථාපිත කර තිබූ අතර අනෙක් අරමුදල් 07 ක් භාර ඔප්පුවක් මඟින් ස්ථාපිථ කර ඇත.

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව දන්වා ඇතත් අධිකරණ යටිතල පහසුකම් භාර අරමුදල පමණක් 2020 වර්ෂයේදී වසා දැමීමට කටයුතු කර තිබුණි.තවද එම ඡේදය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීති ගත කිරීමට කටයුතු කළ යුතු වුවත් 2020 වර්ෂය තුළදී ඉතිරි භාරයන් 06 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2018,2019 හා 2020 වර්ෂයන් සඳහා මෙම අරමුදල්වලින් අරමුදල් 08 ක මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබූ අතර ඉදිරිපත් කර තිබූ අරමුදල් 54 කින් අරමුදල් 4 ක් සඳහා ප්‍රමාණවත් විගණන නිරීක්ෂණ ඉදිරිපත් නොවූ අතර තවත් අරමුදල් 02 ක් 2020 වර්ෂයේදී ආරම්භ කර තිබුනි. තවද, එක් අරමුදලක් ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලයේ අවසන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර පවත්වාගෙන යනු ලබයි. විගණන වාර්තා නිකුත් කරන ලද අරමුදල්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයන් පිළිබඳ සාරාංශයක් පහත පරිදි වේ.

| | තත්ත්වාගණනය නොකළ මතය (පැහැදිලි මතය) | තත්ත්වාගණනය කළ මතය | මතය ව්‍යාවනය | අහිතකර මතය |
|---|---|---|---|---|
| 2018 | 14 | 31 | 04 | 02 |
| 2019 | 12 | 32 | 04 | 03 |
| 2020 | 13 | 36 | 04 | 00 |

ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල සහ කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

2020.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ අරමුදල් 54 කින් අරමුදල් 52 කට අදාලව පැවති මුළු වත්කම් ශේෂය රු. 361,871,668,905 ක් විය. අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල ඇවර කර මුදල් ශේෂය මහා භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කර තිබූ අතර විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල මණ්ඩලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර තිබුණි.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අරමුදල්වලින් අරමුදල් 37 ක මුදල් ශේෂයක් පවතින අතර අරමුදල් 14 ක ශේෂයන් භාණ්ඩාගාරයේ පවත්වාගෙන යන පොදු තැන්පත් ගිණුමකට එකතු කර තිබුණි. තවද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත වී ඇති අරමුදල් 03 ට අදාලව එකතු කරනු ලබන දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පොදු ගිණුමට ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබූ අතර දායක මුදල් ගෙවීම පොදු ගිණුම මඟින් කරනු ලබයි.

**1.** විගණන අස්තිත්‍යයේ නම - **විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5 වන වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතනවල සේවය කර සේවය අවසන් වූ සේවා දායකයන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂය නිදහස් කිරීමට අදාළ ප්‍රමාද කාලය වෙනුවෙන් ගෙවූ පොළිය චක්‍රලේඛ ප්‍රකාරව වගකිව යුතු නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ප්‍රමාද කාලය සඳහා ගෙවන ලද මුළු පොලී වටිනාකම හඳුනාගත නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව සහ පනතේ 95 වගන්තිය ප්‍රකාරව ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ප්‍රමාද පොලිය අදාළ වගකිව යුතු නිලධාරින්ට අධිභාර කිරීමට කටයුතු කළ යුතු බව. | ප්‍රමාදයට හේතුව නිළධාරීන්ගේ වරද මතම නිශ්වය කළ නොහැකි අතර පරිපාලනමය ක්‍රියාපටිපාටිය (අතීත දත්ත රැස් කිරීම) සඳහා ගතවන කාලය බවයි. ඒ අනුව මේ පිළිබඳව තවදුරටත් සාකච්ජා කර විධිමත් විසඳුමක් ලබාදීමට කටයුතු කරගෙන යනු ලබන බව. | දිගින් දිගටම සිදු වෙමින් පැවති ප්‍රමාදයන් මේ දක්වා මගහැරී නොමැති අතර කොමිෂන් සභා චක්‍රලේඛ අංක 155 හි සඳහන් කර තිබූ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය යන වගන්තිය ඉවත් කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට 2021 දෙසැම්බර් 29 දින පැවති කොමිෂන් සභාවේදී නිර්දේශ කර ඇත. |
| (ආ) | උසස් අධ්‍යාපන ආයතන වෙතින් කොමිෂන් සභාවේ ලේකම් වෙත අයදුම්පත යොමු කිරීම ආයතනයේ වරදක් මත මාස 02 කට වඩා ප්‍රමාදවීම හේතුවෙන් දායකයාට පොලී | නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව මත සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කළ යුතු බව. | විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ මතය වනුයේ ප්‍රමාදයට හේතුව නිළධාරීන්ගේ වරද මතම නොව තොරතුරු සැපයීම හා එක්රැස්කිරීම සඳහා ගතවන කාලය බවයි. ඒ අනුව මේ වන විට අදාළ | දිගින් දිගටම සිදු වෙමින් පැවති ප්‍රමාදයන් මේ දක්වා මගහැරී නොමැති අතර කොමිෂන් සභා චක්‍රලේඛ අංක 155 හි සඳහන් කර තිබූ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය යන වගන්තිය ඉවත් |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීමට සිදු වුවහොත් එම පොලිය අදාළ වගකිව යුතු නිලධාරියාට අයිභාර කළ යුතුව ඇත. අයදුම්පත යොමු කිරීම මත දායකයාට ගෙවීම් කරන දිනට පෙර මාසය දක්වා පොලී ගණනය කර ගෙවා තිබුණ ද අදාළ ප්‍රමාදයන්ට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන අයිභාර කිරීමට කටයුතු කර නොතිබුණි. | | චක්‍රලේඛයට අවශ්‍යය සංශෝධනය කිරිමට කටයුතු කරගෙන යමින් පවතින බව. | කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට 2021 දෙසැම්බර් 29 දින පැවති කොමිෂන් සභාවේදී නිර්දේශ කර ඇත. |
| (ඈ) | 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ වටිනාකම රු.48,891,896 ක් වූ නිකුත් කළ නමුත් හිමිකම් නොපෑම හේතුවෙන් අවලංගු වූ චෙක්පත් 473 ක් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණ ද, එම අරමුදල් ගෙවා නිදහස් කිරීමට කළමනාකරණය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | හිමිකම් නොපාන ලද ශේෂයන් පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කර නිරවුල් කිරීමට පියවර ගත යුතු බව. | හිමිකම් නොපෑ අවලංගු චෙක්පත් සඳහා හේතු වී ඇත්තේ නිසි පරිදි සාමාජිකයා විසින් බැංකු ගිණුම් විස්තර සපයා නොතිබීම වේ. මේ පිළිබඳව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සුපරීක්ෂණ කමිටුවේ නිර්දේශ වලට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ආදාල නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කර ඇති බව. | මෙම අරමුදල් ගෙවා නිදහස් කිරීම 2022 පෙබරවාරි 01 දින දක්වා සිදු වී නොමැත. |

2. විගණන අස්ථිත්‍යයේ නම - **මිනුම් ඒකක,ප්‍රමිති සහ සේවා අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------ | -------------------- | ------------------- | ----------------------------- |
| (අ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනතේ 20(1) (අ) සහ 37 වගන්තිය. ප්‍රකාරව වෙළඳාමේදී භාවිතාවන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාක්ෂණය කළ යුතු වුවද, එසේ සෑම උපකරණයක්ම සත්‍යාක්ෂණය කරන බව තහවුරු කරගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල ස්ථාපිත කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව නිසි ක්‍රමවේදයක් අරමුදල තුළ ස්ථාපිත කළ යුතු බව. | 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි වෙළඳ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව. | නියාමන ව්‍යාපෘතියක් ලෙස කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලයේ දැනට වෙළඳ දත්ත පද්ධතිය පවත්වා ගෙන යනු ලබයි. දිස්ත්‍රික්කාර්යාල වල තොරතුරු පද්ධතිය හා ප්‍රධාන කාර්යාලය සමඟ පාලනය කිරීමට වූ ව්‍යාපෘතිය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යවා ඇත. ඒ අනුව වෙළඳාමේදී භාවිතාවන සෑම මිනුම් උපකරණයක්ම සත්‍යාක්ෂණය කරන බව තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම ආරම්භ කර ඇත |
| (ආ) | 2020 වර්ෂය සඳහා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණෙන් අරමුදලේ කටයුතු අඛණ්ඩ පදනමක් මත සමාලෝචනයට භාජනය වී නොතිබුණි. | විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතු බව. | කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලැබූ අභ්‍යන්තර විගණන තනතුර සඳහා නැවත සේවා දීර්ඝ කිරීමට ඉල්ලුම් කර ඇති බව. | 2021 වර්ෂය තුළදීත් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | අරමුදලෙහි ජංගම ගිණුමෙහි 2020 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. මිලියන 219 සිට රු. මිලියන 426 ක් දක්වා පරාසයක ශේෂයක් පවත්වාගෙන ගොස් තිබූ අතර මෙම ශේෂය අරමුදලේ මාසික අවශ්‍යතාවය හා සසඳන විට සියයට 80 ට වැඩි අතිරික්ත මුදලක් බව නිරීක්ෂණය විය. මෙම අතිරික්ත ශේෂය ආයෝජනය කර අරමුදල සඳහා පොළී ආදායම් උපයා ගත හැකිව තිබුණද කළමනාකරණය විසින් ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. | ජංගම ගිණුමෙහි අතිරික්ත ශේෂය ආයෝජනය කර අරමුදල සඳහා පොළී ආදායම් උපයා ගත යුතු බව. | අරමුදලට අයත් ජංගම ගිණුමේ ඇති මුදල් ශේෂය සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුමකට මාරු කරමින් මූල්‍ය කළමනාකරණය සිදු කරන බව. | 2020 ජුනි 29 දින ආරම්භ කරන ලද සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 255 ක් පවතින අතර පොලිය ලෙස රු.7,149,705 ක් ලැබී ඇත වෙනත් ඵලදායී ආයෝජනයන් කෙරෙහි මේ දක්වා යොමු වී නැත. |

3. විගණන අස්ථිත්‍යයේ නම - **සිරකරු සුභසාධක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ජාතික රාජ්‍ය සභාවේ 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදලේ සංශෝධන පනත 4"අ" වගන්තිය ප්‍රකාරව පොදු තැන්පත් ගිණුමේ හා සේප්පුවල තිබුණු වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම් නොපාන ලද වේතන හා පෞද්ගලික මුදල් රු.4,554,557 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදලට බැර කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පොදු තැන්පතු ගිණුමේ පවතින පුද්ගලික මුදල් 2021 නොවැම්බර් 30 දිනට පෙර සිරකරු සුභසාධක අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව | ශේෂය තවදුරටත් පොදු තැන්පත් ගිණුමේ පවති. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 876 (2) (ආ) ඡේදය ප්‍රකාරව අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේයැයි හෝ අපේක්ෂිත අරමුණු රාජ්‍ය අයවැය යටතේ ඉටුකරගත හැකි බව | ආදායම් මාර්ග වැඩි කර ගැනීම හෝ අරමුදල තවදුරටත් පවත්වාගෙනයාම අවශ්‍ය නොවේ නම් චක්‍රලේඛය උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම සිදුවිය යුතු බව. | මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර අරමුදලේ කටයුතු අවසන් කිරීමට හෝ ආදායම් මාර්ග වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව. | චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වී කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පෙනි යන්නේනම් එම අරමුදල්වල කටයුතු අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. නමුත් මෙම අරමුදලේ ශේෂය සුභසාධක කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන නිසා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂවල මුදල් ඒ සඳහා වැයකලද 2020 දෙසැම්බර් 31 දින වන විටද චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | බන්ධනාගාරවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගි කළ යුතු සිර/ සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය ඇතුළත්ව පූර්ව සැලසුම් සකස්කර නොතිබූ අතර කාර්යසාධක දර්ශක හඳුන්වා දී ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා අරමුදලේ අරමුණු ඉටුකිරීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය. | අරමුදලේ වැඩසටහන් සඳහා පූර්ව සැලැස්මක් ද එම සැලැස්මට අනුව කාර්යසාධනය ඇගයීමට කාර්යසාධන දර්ශක හඳුන්වා දී ඇගයීම් සිදු කොට ප්‍රගතිය වාර්තා කළ යුතු බව. | කාර්යසාධක දර්ශක හඳුන්වා දීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත උපදෙස් ලබා දී ඇති බව. | වර්තමානයේ දී ද පූර්ව සැලසුම් සකස් කිරීම හා කාර්යසාධන දර්ශක හඳුන්වා දී ප්‍රගතිය මැන බැලීමක් සිදු නොකරයි. |
| (ඇ) | සිරකරුවන් නිදහස්කල පසු ඔවුන්ගේ පුනරුත්ථාපනයට උපකාරවන පශ්චාත්භාර සේවා සඳහා අරමුදලෙන් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. | පශ්චාත්භාර සේවා සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක විය යුතු බව. | ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව. | අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | සිරකරු සුභසාධක අරමුදලක් පිහිටුවීම, සිරකරුවන්ගේ පොදු ශුභ සිද්ධිය සඳහා එයින් වියදම් දැරීම හා ඊට සම්බන්ධ අනුෂාංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනත පිහිටුවා තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේ සිරකරුවන්ගේ සුභසාධක වැඩසටහන් සඳහා අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇති බව. | 2021 වර්ෂයේ දී ද සිරකරුවන්ගේ සුභසාධක වැඩසටහන් සඳහා අරමුදලින් වියදම් සිදු කර නොමැත. |
| (ඊ) | 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් මුදල් රෙගුලාසි 877 (2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2020 වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව. | 2021 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තා නිවැරදිව සකස් කර මූල්‍ය ප්‍රකාශන පිටපත් සමඟ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් තබා ගත් බව. | අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (උ) | 2006 දෙසැම්බර් 26 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය අනුව 2018, 2019 හා 2020 වර්ෂවලට අදාළ අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර අදාළ අනුමැතීන් සහිතව සැප්තැම්බර් 30 දිනට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතු බව. | 2022 වර්ෂය සඳහා අරමුදලේ ප්‍රමාණවත් ශේෂයක් දැනට පවතින අතර අයවැය සකස් කිරීමට කටයුතු සම්පාදනය කරන බව. | අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කර නොමැත. |

04. විගණන අස්ථිායයේ නම - **අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාරය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------- | ---------------------- |
| (අ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (ආ) ඡේදය ප්‍රකාරව පවත්වාගෙන යැම තවදුරටත් අවශ්‍ය නොවන භාරයන් වල අතිරික්ත මුදල් අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට පියවර ගතයුතු වුවද ඊට පටහැනිව 2019 දෙසැම්බර් 31 දිනට රු.3,786,197 ක ශේෂයක් භාරයේ බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු බව. | 2020.12.31 දිනට සියලු බැරකම් ගෙවා මුදල් පොතේ ශේෂය වූ රු.3,373,977.53 ක මුදල 2021 මාර්තු 09 දින මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කර ඇති බව. | 2020.12.31 දිනට භාරයේ කටයුතු අවසන් කර ඇත. |
| (ආ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව මෙම භාරය වසාදැමීමට 2017 අගෝස්තු 09 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණ කර නොතිබුණි. තවද | භාරය වසා දැමීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු අතර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | 2020.12.31 දිනට භාරය වසා ඇති බව. | 2020.12.31 දිනට භාරයේ කටයුතු අවසන් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව කඩිනමින් භාරය වසා දැමිය යුතු වුවද 2020 ජූනි 23 දිනය වන විටත් භාරය වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | 2007 ජූලි 07 දිනැති භාරකාර ඔප්පුවේ 1 (A) වගන්තිය අනුව අධිකරණ නිල නිවාස, ලේඛන හා නඩු භාණ්ඩ කාමර, විනිශ්චයකාරවරුන්ගේ කාමර, රෙජිස්ට්‍රාර් කාර්යාල, නඩුකාරවරුන්ගේ පුස්තකාල යනාදිය නඩත්තු කිරීම, තොරතුරු තාක්ෂණය, ලී බඩු උපකරණ යනාදිය සඳහා අරමුදල් සැපයීම මෙම අරමුදලේ ප්‍රධාන අරමුණු වුවද ඒ පිළිබඳ අවධානය යොමු නොකර කොළඹ මහාධිකරණ කලාපයට කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා 2018 වර්ෂයේ දී රු.3,582,550 ක් වැයකර තිබුණි. තවද භාරය වසාදැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදීත්, අධිකරණ කලාප 08ක් වෙනුවෙන් 2019 වර්ෂයේ දී ද රු.5,453,741 ක් කාර්යාල උපකරණ මිලදී ගැනීමට වැයකර තිබුණි. | භාරකාර ඔප්පුවේ 1 (A) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන අරමුණු ඉටු වන පරිදි කටයුතු කළ යුතු අතර භාරය වසා දැමීමට ක්‍රියා කළ යුතු බව. | අධිකරණ කලාපවලින් ඉදිරිපත් කර තිබුණු ඉල්ලීම් අනුව භාණ්ඩ හා උපකරණ සැපයීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව සිදු කරන බව | 2020.12.31 දිනට භාරයේ කටයුතු අවසන් කර ඇත. |

05. විගණන අස්ථිත්‍යයේ නම - **සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වටිනාකම් රු.9,584,223 ක් වූ මෝටර් රථ 04 ක් 2014 වර්ෂයේ සිට 2020 වර්ෂයේ අවසානය දක්වා භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව. | i. මෙම රථ වාහන වලින් අලුත්වැඩියා කල හැකි වාහන අලුත්වැඩියාවට යෙදවීම.<br>ii. අපහරණය කළ යුතු වාහන අපහරණ කමිටුවේ නිර්දේශයට යැවීම. | මෝටර් වාහන 04 ක් 2022 ජනවාරි වන විටත් භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. |
| (ආ) | රිදියගම සෆාරි උද්‍යානයේ රු.මිලියන 7.2 ක ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන 06 ක් 2018 මාර්තු 22 වන දින අවසන් කර තිබුණද 2020 ජූනි දක්වා භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි. | ගිවිසුම පරිදි කටයුතු කළ යුතු බව. | මෙම විකුණුම් මධ්‍යස්ථාන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දීමට කටයුතු කරමින් පවතින බව. | මෙම ගොඩනැගිලි 2022 ජනවාරි වන විටත් නිශ්කාර්යව පවතී. |
| (ඇ) | අරමුදලේ 2020 මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර සටහන්හි දක්වා ඇති ආරම්භක හා අවසාන ශේෂ සැසඳීමේදී පිළිවෙලින් රු.33,801,932 ක හා රු.33,230,026 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතු බව. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මඟින් එම එක් එක් වර්ෂයේ සිදුව ඇති වෙනස සඳහා සැසඳීම් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මේ වන විටත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම හා අරමුදලේ ශේෂය අතර වෙනසක් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපියේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් සත්වෝද්‍යානවල පවත්වාගෙන යනු ලබන වෙළඳසැල් 2019 අප්‍රේල් සිට ජූනි දක්වා වසා තබන ලද කාල සීමාවට අදාළව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව දන්වා තිබුණි. එසේ වුවද, 2020 වර්ෂය අවසන් වන විටත් තීරණයක් ගෙන නොතිබුණ අතර එම හේතුවෙන් මාස 03ට අදාලව රු.4,782,701 ක් වූ හිඟ බදු කුලිය 2020 වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් 03 වන සිහිකැඳවීමද සිදු කර ඇති බව. | හිඟ මුදල් 2022 පෙබරවාරි වනවිටත් අය කරගෙන නොතිබුණි. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(ii) වගන්තිය ප්‍රකාරව තරඟකාරී බව ප්‍රවර්ධනය කළ හැකි බවට සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ කාර්යභාරයක් වන නමුත් විදේශීය පක්ෂීන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය සැලසුම් කිරීමේදී සියළු පක්ෂීන් විදේශීය පක්ෂීන් වීම, ශ්‍රී ලංකාව තුලදී අදාල සැපයුම සම්පූර්ණ කළ හැකි සැපයුම්කරුවන්ගේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2022 පෙබරවාරි වනවිටත් මෙම පක්ෂීන් ප්‍රදර්ශනය සඳහා හම්බන්තොට සෆාරි උද්‍යානයේ කූඩු ඉදිකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සීමිත බව, වැනි කරුණු හේතුවෙන් දේශීය තරඟකාරිත්වය සීමාවීමේ හැකියාව පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සලකා බලා නොතිබුණි. | | | |
| (ඊ) | විදේශීය පක්ෂීන් මිලදී ගැනීම් ප්‍රසම්පාදනයේදී “එකම සැපයුම්කරුවකු විසින් පක්ෂීන් වර්ග 32 කම සැපයිය යුතුය” යනුවෙන් කොන්දේසියක් පනවා පිරිවිතර පටු කිරීම හේතුවෙන් ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් තිදෙනාගෙන් දෙදෙනෙකු පක්ෂීන් කිහිප දෙනෙකු සඳහා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු නිසා ප්‍රතික්ෂේප වී තිබුණි. එලෙස ප්‍රතික්ෂේප කරන ලද සැපයුම්කරුවන් ඉදිරිපත් කර තිබුණු මිලට වඩා වැඩි මිල ගණන්වලට තෝරා ගත් සැපයුම්කරුගෙන් පක්ෂීන් 53 දෙනෙකු මිලදී ගෙන තිබුණි. මේ හේතුවෙන් අරමුදලට රු.17,860,085 ක පාඩුවක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2022 පෙබරවාරි වනවිටත් මෙම පක්ෂීන් ප්‍රදර්ශනය සඳහා හම්බන්තොට සෆාරි උද්‍යානයේ කූඩු ඉදිකර නොතිබුණි. |

06. විගණන අස්ථිත්‍යයේ නම - **වන සත්ත්ව සංරක්ෂණ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනතේ 37 වන වගන්තිය ප්‍රකාරව කිරන හෝ මනින උපකරණවල නිවැරදිතාවය මාස දොළහක කාල සීමාව තුල පරීක්ෂකවරයෙකු විසින් සහතික කළයුතු වුවද, උඩවලව අලි රූදවුම් මධ්‍යස්ථානයේ ඇති පාලම් තරාදියෙහි නිවැරදිතාවය 2019 වර්ෂයේදී පරීක්ෂා කර නොතිබුණි. | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2019 ඔක්තෝබර් 13 දින සිට 2022 පෙබරවාරි දක්වා පාලම් තරාදිය ක්‍රියා විරහිත තත්වයේ පවතී. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 132(2),(4),(5) වගන්ති ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වියදම් අනුමත කිරීමේදී අදාළ සැපයුම නියමිත ප්‍රමාණයෙන් පවතින බවටත් ඒවා පරීක්ෂා කොට නිවැරදි ලෙස භාරගෙන තිබෙන බවටත් අනුමත කරන නිලධාරියා තහවුරු කර ගත යුතු වුවත්, ඊට පටහැනිව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පාලම් තරාදිය අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානයට කොළ අතු මිලදී ගැනීම සඳහා අවිධිමත් ක්‍රමවේදය අනුව සැකසූ අනුමාන බර වාර්තා මත පදනම්ව 2020 වර්ෂයේදී රු.8,896,827 ක් ගෙවා තිබුණි. | | | |
| (ඇ) | 2019 ජුනි 13 දිනැති හා අංක 01/2018 (**i**) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සියයට 15 කින් ඉහළ දැමිය යුතුය. එසේ වුවද 2006 පෙබරවාරි 20 දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික රක්ෂිතයක හෝ අභය භූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිත කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අය කරනු ලබන රු.250 ක බලපත්‍ර ගාස්තුව 2020 වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ගැසට් පත්‍රය සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සිදු කරන බව. | 2022 පෙබරවාරි වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 පෙබරවාරි 11 දිනැති අංක 16/2002 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 1.1 හා 1.2 ඡේද ප්‍රකාරව ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2022 පෙබරවාරි වන විටත් අදාල මුදල් අරමුදලට බැර කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආදායමින් අය කරනු ලබන සේවා ගාස්තු කාර්ය මණ්ඩලය අතර බෙදාහැරීමේදී වැටුප් රහිත නිවාඩු දින 01 සිට දින 10 දක්වා ලබා ගත් අයගෙන් සියයට 10 ක් හා දින 11 ට වඩා වැටුප් රහිත නිවාඩු ලබා ගත් අයගෙන් සියයට 50 ක් වශයෙන් අඩුකර ගනු ලබන සේවා ගාස්තුව වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට නැවත බැර කළ යුතු වුවද, 2020 වර්ෂයේදී නිලධාරීන් 14 දෙනෙකුගෙන් අඩුකර ගන්නා ලද රු.1,829,200 ක මුදල බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | 2018 වර්ෂය වන විට තර්ජනයට ලක් වූ වනජීවී විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුති (CITES) සැසිවාර 17 හිදී එළඹුණු නිර්දේශයන් පාදක කර ගනිමින් සත්ව හා ශාක වෙළඳාම සහ අභිජනන කටයුතු විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට සුදුසු පරිදි නව නීති පද්ධතියක් හඳුන්වාදීම අවශ්‍ය වන නමුත් 2019 අප්‍රේල් 30 දින වන විටත් නීති පද්ධතියක් හඳුන්වාදී නොතිබුණි. | ශ්‍රී ලංකාවට සුදුසු පරිදි නව නීති පද්ධතියක් හඳුන්වා දිය යුතු බව. | නව නීති පද්ධතියක් හඳුන්වා දීමට අවශ්‍ය කෙටුම්පත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | 2022 පෙබරවාරි වන විටත් නව නීති පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි. |
| (ඊ) | උඩවලව අලි රැඳවුම්හලේ උසාවි නියෝග මත රඳවා සිටින අලින් 13 දෙනාගේ ජල අවශ්‍යතා සපුරාලීම | ව්‍යාපෘති සැලසුම් කිරීමට පෙර අවශ්‍යතා මත පදනම්ව විධිමත් | ජල පොකුණෙහි ඇති ජල කාන්දුව පිළිසකර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව. | 2022 පෙබරවාරි අවසන් වන විටත් ජල පොකුණ පිළිසකර කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා 2019 වර්ෂයේදී රු.628,383 ක වියදමක් දරා කුඩා ජල පොකුණක් ඉදිකර තිබුණද ඒවා පිළිසකර කර නොතිබුණි. ඉතිරිවන ආහාර කොටස් පොකුණ තුළ ගොඩගසා තිබුණි. | අධ්‍යයනයක් සිදු කල යුතු බව. | | |
| (උ) | ප්‍රචණ්ඩකාරී අලින් රඳවා තැබීම සඳහා ඉදිකළ හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට 2015 සැප්තැම්බර් 04 දින සිට 2019 ජුනි 25 දක්වා ප්‍රචණ්ඩකාරී අලින් 51 ක් රඳවා තිබුණද, ඉන් අලින් 12 ක් විවිධ හේතූන් මත මියගොස් තිබුණි. 2019 ජුනි මස පවත්වන ලද අලි සංගණන වාර්තාවට අනුව අලින් 9 දෙනෙකු සිටින බව දක්වා තිබුණි. අලින් 30 දෙනෙකු සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය. | සතුන් සම්බන්ධව නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | අලින් 30 දෙනා සම්බන්ධව සාක්ෂි 2022 පෙබරවාරි වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය. |
| (ඌ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් 28 ක් සඳහා රු.367,357,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක ගත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2022 පෙබරවාරි වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. |
| (එ) | 2018 වර්ෂයේ සැලසුම් කල ගිලුණු නැව් පිළිබඳව සිදු කරනු ලබන ජෛව විවිධත්ව සමීක්ෂණය (2019) (biodiversity | ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොමැත. | 2022 පෙබරවාරි මාසය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුනි. |

| | | | | |
|---|---|---|---|---|
| | survey and declaration of ship wrecks) ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට රු.2,956,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර ව්‍යාපෘතිය සැලසුම් කල පිහිණුම් උපකරණ සියල්ල 2019 මාර්තු 31 දින වන විට මිලදී ගෙන තිබුණි. එසේ වුවද 2020 වර්ෂයේ අවසන් වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | | | |
| (ඒ) | 2012 වර්ෂයේදී රු.11,730,808 ක් වැය කර ඉදිකර තිබුණු විල්පත්තුව ජාතික උද්‍යානයේ පිහිටි කොල්ලන්කනත්ත (වීවල) සංචාරක බංගලාවේ ජල ගැටළු පැවතීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට භාවිත නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | ජල ගැටළුව නිරාකරණය කර සංචාරකයින් සඳහා විවෘත කළ යුතු බව. | ජලනල එළීමේ කටයුතු සඳහා 2021 වර්ෂයේ ප්‍රතිපාදන නිදහස් කර ඇති බව. | 2022 පෙබරවාරි වන විටත් නිශ්ක්‍රීයව පැවතුනි. |

07. විගණන අස්ථිත්‍යයේ නම- **සංචාරක සංවර්ධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කල මතය

2019 - තත්ත්වාගණනය කල මතය

2020 - තත්ත්වාගණනය කල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ----------------- | -------------------- | ----------------------- | ------------------------- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට පටහැනිව, බැංකු ගිණුම් දෙක අතර මුදල් ගලායාම් සහ මුදල් ගලාඒම් සැලකිල්ලට ගැනීම හේතුවෙන් සංචාරක සංවර්ධන බදු, අපගමන බදු සහ වෙනත් ලැබීම් වශයෙන් මුදලින් ලද රු.962,402,030 ක වටිනාකම රු.1,111,441,038 ක් ලෙස ද, මුදලින් ගෙවූ වෙනත් ගෙවීම් රු.6,150,647ක වටිනාකම රු.155,189,670 ක් ලෙස ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | අරමුදලේම ගිණුම් දෙක අතර සිදුවී ඇති මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම් මුදල් ප්‍රවාහය ප්‍රකාශණයට ඇතුලත් නොකළ යුතු බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2021 ගිනුම් වර්ෂයට අදාලව මෙම වරද නිවැරදි කරගෙන ඇති බව. | 2022 ජනවාරි 31 දිනට 2021 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කරනොතිබූ බැවින් මුදල් ප්‍රවාහයේ නිවැරදිතාවය සනාථ කරගත නොහැකි වුනි. |
| (ආ) | අරමුදලේ මූල්‍ය ප්‍රකාශය හා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය අනුව ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සැසඳීමේදී පිළිවෙලින් රු. 232,723 ක් හා රු. 699,908කවෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව. | නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේIII වන පරිච්ඡේදයේ 23(2)(අ) වගන්තිය අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එකතු කර අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබන අපගමන බදු ආදායමින් 1/3 ක කොටසට අදාලව 2020 වර්ෂයේදී සේවා ගාස්තු ලෙස සියයට 2.5 ක් හෙවත් රු.12,551,372 ක් අඩු කර ගැනීම සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සලසා නොතිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. | 2019.01.29 දිනPF/R /4/019 යන ලිපියෙන් මහා භාණ්ඩාගාරය එකගවූ බව. | පනතේ විධිවිධාන සලසා නොතිබුණි. |
| (ඈ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ24(3)වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත 2020 වර්ෂයේ පරිපාලන වියදම් රු. 3,315,209 ක් ගෙවා තිබුණි. | පනතේ වගන්ති සංශෝධනය කළ යුතු බව. | පනත සංශෝධනය කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පනත සංශෝධනය කර නොතිබුණි |
| (ඉ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා බැංකුවට සෘජුව ප්‍රේෂණය කරන ලද රු. 51,933,332 ක මුදල නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගත කරනු වෙනුවට ජංගම වගකීම් යටතේ ඉදිරියට ගෙන එමින් පැවතුණි. | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව. | මාර්ගගත ක්‍රමයට සංචාරක සංවර්ධන බද්ද ගෙවීමේදී SLTDA ලියාපදිංචි අංකය සඳහන් නොකිරීම නිසා මෙම ගැටලුව පැනනැගී ඇති බව. | සෘජු ප්‍රේෂණ හඳුනා ගෙන නොතිබිණි. |

08. විගණන අස්ථිත්‍යයේ නම - **වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදල**

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මහේස්ත්‍රාත් අධිකරණය විසින් අයකරගෙන තිබූ නමුත් දෙපාර්තමේන්තුව වෙත එවා නොතිබූ එකතුව රු.702,500 ක් වූ දඩ මුදල 2021 ජූලි 05 වන විටත් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ දඩ මුදල් කඩිනමින් ලබා ගැනීමට හැකි ක්‍රමයක් සකස් කර ගත යුතු බව. | අදාල දඩ මුදල් එවීමට කටයුතු කරන ලෙස දන්වා අදාල මහේස්ත්‍රාත් අධිකරණ වෙත ලිපි යොමුකර ඇති බව. | දඩ මුදල් එවීමට කටයුතු කරන ලෙස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ලිපි මඟින් දන්වා යවා ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම දඩ මුදල් ලැබී නොතිබුණි. |
| (ආ) | වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලින් ත්‍යාග ගෙවීම් කිරීමේ මාර්ගෝපදේශ හා උපමාන, 2017 මැයි 09 දිනැති සහ අංක 2018/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර තිබුණි. ඒ අනුව 2017 වර්ෂයේ සිට ත්‍යාග ගෙවීම් කිරීම ආරම්භ කර තිබුණ ද 2014 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළ මෙම අරමුදලේ ගෙවිය යුතුව තිබූ මුළු ලැබීම් එකතුව රු.9,197,542 ක් වී තිබුණි. | දිගින් දිගටම පැවත එන ශේෂය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව. | මුදල් ලැබී ඇතත් පොලිස් නිලධාරීන් නාම ලේඛන එවීමට ප්‍රමාද වීම නිසා මුදල් ගෙවීම කල නොහැකිවී ඇති බව. | 2017 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ පහක කාල සීමාව තුළ එකතුව රු.4,471,500 ක මුදලක් ත්‍යාග මුදල් ලෙස ගෙවා තිබුණු අතර, එදින වන විට රු.4,726,042 ක ත්‍යාග මුදලක් ගෙවීම් සඳහා ඉතිරිවී තිබුණි. |

09. විගණන අස්ථිත්‍යයේ නම - **හින්දු සංස්කෘතික අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය නොකළ මතය

2019- තත්ත්වාගණනය නොකළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | --------------------- | -------------------- | ------------------------ | -------------------------- |
| (අ) | රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 1 හි 79 ඡේදය ප්‍රකාරව, වර්ෂය තුළ උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකළද සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල උපලබ්ධි කිරීම පරිභෝජනය හෝ විකිණීම සඳහා තබාගෙන ඇති වත්කම්, ජංගම වත්කම් ලෙස හෙලිදරව් කළ යුතුය. එසේ වුවද, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මුද්‍රණය කර තිබූ පොත්වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ පොත් 4678 ක වටිනාකම වූ රු.3,622,006 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව, ඉතිරි තොග පිළිබඳ හෙළිදරව් කළ යුතු බව. | ලබන වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලබන බව | 2021 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට එකග වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදය පරිදි මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද අරමුදල සම්බන්ධයෙන් එසේ සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව. | අනාගතයේදි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව | 2022 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු සකසා ඇත. |

10. විගණන අස්ථිත්‍යයේ නම - **පොලිස් ත්‍යාග අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අධිකරණ 42 කින් විගණනයට ලබා දී තිබූ ආදායම් තහවුරු කිරීමේ වට්නාකම් සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන 03 හි දැක්වෙන වර්ෂය අවසානයේ ලැබිය යුතු උසාවි දඩ මුදල් ආදායම සැසඳීමේදී අධිකරණ 41 ක එකතුව රු. 72,933,099 ක් වැඩියෙන්ද අධිකරණ 01 ක රු. 5,760,955 ක් අඩුවෙන්ද වශයෙන් නොසැසඳුණි. | නොසැසඳීම් පරීක්ෂා කර හේතු හඳුනාගත යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. මගහැරීමට ගත් ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොමැති බව. | අධිකරණ විසින් ඍජුව ලබාදෙන තොරතුරු හා මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන ලැබිය යුතු උසාවි දඩ මුදල් ශේෂ අතර නොසැසඳීම් අඛණ්ඩව වාර්තා වේ. |
| (ආ) | 2001 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ පොලිස් නිලධාරීන්ගේ විශිෂ්ට ක්‍රියා සම්බන්ධව සියයට 50 ක් ගෙවා නිම කරන ලද විශේෂ ත්‍යාග ලිපිගොනු 400 කට අදාලව ඉතිරි ත්‍යාග මුදල් ගෙවීමට එක් එක් සිද්ධියට අදාල අධිකරණ කටයුතු අවසන් විය යුතුව තිබූ | අධිකරණ කටයුතු අවසන්ව ඇති ගෙවිය යුතු විශේෂ ත්‍යාග ගොණු සම්බන්ධයෙන් පසුවිපරමක් සිදුකළ යුතු බව | විගණනයේ දක්වා ඇති පරිදි ගෙවිය යුතු විශේෂ ත්‍යාග පිළිබඳ තොරතුරු නැවත පරීක්ෂා කිරිමට අදාල ක්‍රියා මාර්ග ගන්නා බව | ගෙවිය යුතු විශේෂ ත්‍යාග වලට අදාල අධිකරණ කටයුතු තවදුරටත් පවතීද යන්න තහවුරු කිරීමක් සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර, ගෙවීමට ඇති මුළු විශේෂ ත්‍යාග වටිනාකම රු.91,011,211 ක් විය. මෙම ගෙවිය යුතු විශේෂ ත්‍යාග පිළිබඳ තොරතුරු අදාල අංශ වෙත යොමුකර 2020 වර්ෂයේදී අධිකරණ කටයුතු අවසන් වී ඇත්ද යන්න පිළිබඳ තහවුරු කිරීමක් ලබාගෙන අදාල ගෙවීම් කිරිමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළිවෙලින් රු. මිලියන 433, 386, 326, 469, 820, 1015 1,275 ක් හා 1198 බැගින් එකතුව රු.මිලියන 5,922 ක් ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් ලෙස උපයාගෙන තිබුණද මෙම ආදායම් අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | ආයෝජන ආදායම අරමුදලේ අරමුණු ඉටුකිරීම සඳහා උපයෝජනය විය යුතු බව | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව. | වර්තමානයේ රු. බිලියනය ඉක්මවූ පොලී ආදායමක් වාර්ෂිකව ලබන අතර මෙම ආදායමින් කොටසක් හෝ නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට හෝ සුභ සාධනයට වැය නොවී සියයට 100 ක්ම අඛණ්ඩව ප්‍රති ආයෝජනය කිරීම සිදු වේ. |

11. විගණන අස්ථිත්‍යයේ නම - **දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - අහිතකර මතය

2019 - අහිතකර මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදලට භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති මුදල් තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට නිවාස අරමුදලේ සමුච්චිත ශේෂය රු. 37,851,984ක් විය. එහෙත් 2008 නොවැම්බර් මස සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම මෙම නිවාස අරමුදලින් නිළධාරීන් සඳහා කිසිදු ණය මුදලක් ලබා දී නොතිබූ බැවින් මෙම ණය අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | විධිමත් අධ්‍යයනයක් සිදුකර නිවාස අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව. | දැනට ලබා දී ඇති ණය මුදල් සම්පූර්ණයෙන් අයවෙන තුරු නැවත ණය ලබාදීම සිදුකර නොමැත. | 2021 දෙසැ. 31 දින වන විටත් අයකර ගත යුතු ණය ශේෂයක් පවතින බව හා අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැති වීම. |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 (4) වගන්තිය ප්‍රකාරව, අරමුදල පරිපාලනය සඳහා වූ කාර්ය පරිපාටිය යාවත්කාලීන කර නොතිබුණි. | පනතේ විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පනත ප්‍රකාරව මේ වන විටත් කටයුතු කර නොමැත. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානයන් ප්‍රකාරව කාර්ය පරිපාටින් මේ වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. |

12. විගණන අස්ථිත්‍යයේ නම - **ජාතික ආරක්ෂක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය නොකල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය අනුව තම රාජකාරී ඉටුකරන අතර තුර තුවාල ලැබූ හෝ මියගිය සන්නද්ධ හමුදාවල සමාජිකයන්ට හා පවුල් වලට ප්‍රතිලාභ ගෙවීමට අතිරේකව පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට අදාල කාර්යය භාරය සඳහා 2020 වර්ෂය තුලදීද වැඩසටහන් සැලසුම්කර නොතිබුණි. | 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | මේ පිළිබඳව පාලක මණ්ඩලය සතු කාර්යභාරය පිළිබඳ ඉදිරි පාලක මණ්ඩල රැස්වීමේදී අවධානය යොමු කිරීමට කටයුතු කරන බව. | පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පාලක මණ්ඩල පත්‍රිකාවක් සකස් කොට ඇත |
| (ආ) | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය අනුව පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ 2018 හා 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතුකර නොතිබුණි. | 1985 අංක 09 දරන ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | 2018 හා 2019 වර්ෂයේ විගණන වාර්තා ආරක්ෂක අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2018 හා 2019 වර්ෂවල විගණකාධිපති සම්පිණ්ඩන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට භාෂා පරිවර්තන කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | “විරුසිසු ශිෂ්‍යත්ව ප්‍රදීප” වැඩසටහන යටතේ මියගිය හා ආබාධිත ත්‍රිවිධ හමුදා හා පොලිසියේ රණවිරුවන්ගේ 2019 පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් 150 ක් සඳහා රු. 25,000 බැගින් ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම 2020 වර්ෂයේ දෙවන කාර්තුව තුල අවසන් කිරීමට සැලසුම්කර ඇතත් 2020 වර්ෂය අවසන් වන විටත් ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොතිබුණි. 2019 පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල 2019 සැප්තැම්බර් මස නිකුත් කර තිබුණු අතර ප්‍රතිඵල නිකුත් වීමෙන් වර්ෂ 1 මාස 3 කට අධික කාලයක් ගතවී ඇතත් ශිෂ්‍යත්ව ප්‍රදානයේ ප්‍රතිලාභ කාලීනව උපයෝජනය කිරීමේ අවස්ථාව අහිමිවී තිබුණි. | අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතු බව. | රටෙහි පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතු කොට ගෙන 2020 වර්ෂය තුළ ප්‍රතිලාභ ලබාදීම සිදු නොවුණි. ශිෂ්‍යාධාර ලබාදිම නුදුරේදීම, ඉතා කඩිනමින් සිදු කිරීමට පියවර ගනු ලබන බව. | 2019 වර්ෂයේදී 5 වසර ශිෂ්‍යත්වය සමත් වී තෝරාගත් දූ දරුවන් 136 දෙනෙකු සඳහා මේ වන විට DFCC බැංකුවේ ළමා ඉතුරුම් පොත් විවෘත කර ඇති අතර එම ගිණුම් පොත් බෙදාහැරීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන චක්‍රලේඛය අනුව අරමුදලට අදාල තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා එම ඉලක්ක මැනීමේ දර්ශක හඳුනාගෙන නොතිබුණි. | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව | අරමුදලේ අරමුණු හා සමපාත වන තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීමට ඉදිරියේදි අපේක්ෂා කරන බව | මේ වනවිටත් තිරසාර සංවර්ධනය යටතේ දිළිඳුකම තුරන්කිරීමේ අරමුණ කෙරෙහි වඩාත් සුදුසු වන ආකාරයට “මෙත් සෙවණ” අර්ධ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් රණවිරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ඇත. |

13. විගණන අස්ථිත්‍යයේ නම - **අපි වෙනුවෙන් අපි අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය නොකල මතය

2019 - තත්වාගණනය නොකල මතය

2020 - තත්වාගණනය නොකල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති ගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන් ගෙන් 2020 දෙසැම්බර් 31 දින අවසානයට අයවිය යුතු හිඟ වාරික මුදල රු. 29,070,660 ක් වූ අතර එයින් වසරකට වැඩි කාලයක් හිග හිට පැවති ණය වාරික ප්‍රමාණය රු. 17,326,401 ක් විය. මෙම හිඟ වාරික අයකර ගැනිම හා ඒ පිළිබඳ පසුවිපරම් ක්‍රියාමාර්ගය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | ගිවිසුම ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව | ඉදිරියේදී එම හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු සිදු කරන බව | රණජය පුර ඉපලෝගම නිවාස ලබා ගත් අයවළුන්ගේ වසරකට වැඩි කාලයක් හිඟ ණය වාරික අයකර ගැනීම සඳහා අදාළ අයවළුන් දැනුවත් කරන ලෙස ත්‍රිවිධ හමුදාව වෙත ලිපි මගින් දැනුම් දී ඇති අතර, දිගින් දිගටම හිඟ පවතින නිවාස නැවත පවරා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත ප්‍රකාරව අරමුදල විසින් තිරසර සංවර්ධන අරමුණු තීරණය කර තිබුණු නමුත් එම අරමුණු කරා ලගාවීමට අවශ්‍ය ඉලක්ක තීරණය කිරීම හා එම ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීමේ දර්ශක පිළියෙල කර නොතිබුණි. | 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව කටයුතු කළ යුතු බව. | ව්‍යාපෘතියේ ඉදිරි සැලසුම් තිරසර සංවර්ධන පනතට අනුගත වන පරිදි සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | අරමුණු තීරණය කිරීම හෝ දර්ශක පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව අරමුදල ආරම්භයේ සිට 2019 වර්ෂය දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ 11(6) වගන්තිය අනුව කටයුතු කළ යුතු බව | ඉදිරි කාල සීමාව තුල සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත බව. | සභාගත කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතන වලින් ණය ලබා ගැනීම, එම ණය ගෙවීම සඳහා ආධාර ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම, හමුදා සාමාජිකයකු මිය යෑමේදී හෝ සටනේදී හෝ අන්‍යාකාරයක ස්ථිරව ආබාධිතයකු වීමේදී හෝ තුවාල සිදුවීමේදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම යන අරමුණු ඉටුවී නොතිබුණි. | පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව අරමුදල පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ ඉටුකිරීම සඳහා කටයුතු කළ යුතු බව | ඉල්ලුම් කරුවන් 25,000 කට අධික සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත. එතෙක් ක්‍රියාත්මක කරමින් සිටි නිවාස ව්‍යාපෘතීන්ද සමග මතුවන මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් සිදුකළ නොහැකිවී ඇති බව. | දැනට අරමුදලේ මූල්‍ය තත්වය පහත වැටී ඇති අතර, ඉරියේදි අරමුදලේ මූල්‍ය තත්වය වර්ධනය වීමෙන් පසු ණය ගෙවීම, ආධාර ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම සම්බන්ධ කටයුතු කිරීමට නියමිතව ඇත. |

14. විගණන අස්ථිත්‍යයේ නම - **ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 48 වැනි ඡේදයට පටහැනිව, 2020 දෙසැම්බර් 31 දින රු.6,956,286 ක බැදුම්කර සහ ඇපකර වලින් ලැබිය යුතු ආදායමේ බැර ශේෂයන් එම ගිණුමේ හර ශේෂයන්ට එරෙහිව අවස්ථා 51 දී හිලව් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම වත්කම් සහ ජංගම වගකීම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රමිතියේ විධිවිධාන වලට අනුකූලව ඒවා ගිණුම්ගත කිරීමට ක්‍රියා කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණු බව. | හඳුනාගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.7,088,288 ක් වූ කාර්යාල උපකරණ සහ වෙනත්, පරිගණක, උපාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ සහ ගෘහභාණ්ඩ, උපකරණ සහ සවිකිරීම් වැනි සම්පූර්ණ ක්ෂය වූ වත්කම් දේපල, පිරියත සහ උපකරණ - ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 07 හි 65 ඡේදයේ සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමට සහ ප්‍රමිතියේ විධිවිධානවලට අනුකූලව ඒවා ගිණුම්ගත කිරීමට ක්‍රියා කළ යුතු බව. | 2022 වර්ෂය තුළ ඒවා නැවත අගය කිරීමට ක්‍රියා කරන බව. | නැවත ඇගයීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වල වෙනස්වීම් සහ දෝෂ - ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 03 හි ඇස්තමේන්තු දෝෂය නිවැරදි කිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ධාරණ අගය පෙන්වීමේ විධිවිධාන අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව අරමුදල විසින් අඛණ්ඩව භාවිතා කරනු ලැබේ. | | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සකස් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ඉවත දැමිය හැකි සහ විනාශ කළ අයිතමයක් ලෙස රු.448,842 ක මුදලක් පෙන්වා ඇත. කෙසේ වෙතත්, මෙම ගනුදෙනුවේ නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා හෝ සත්‍යාපනය කිරීම සඳහා මෙම අයිතමය සම්බන්ධයෙන් ගිණුම් පොත්වලට කරන ලද ආධාරක ලේඛන සහ ගිණුම් සටහන් පිළිබඳ විස්තර විගණනය සඳහා සපයා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු අතර, විගණනය සඳහා උපකාරක ලියවිලි සියල්ල සැපයිය යුතු බව. | එය මුදල් ප්‍රවාහය සකස් කරන අවස්ථාවේදී සිදුවූ මානව දෝෂයකි. එබැවින්, උපකාරක ලියකියවිලි නොමැති අතර අපි එය ඊළඟ මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කරන බව. | එය 2021 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට නියමිතය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන පහක (05) රු.7,790,561ක හඳුනා නොගත් බැර | බැංකු ප්‍රකාශනවල හඳුනා නොගත් බැර ශේෂයන් හඳුනාගෙන ඒ අනුව ගිණුම් පොත්වල නිසි ගැලපීම් කිරීමට | කොන්ත්‍රාත්කරුවන් කිසිදු ආධාරක ලියකියවිලි සහ අරමුදලට කිසිදු දැනුම්දීමකින් තොරව | හඳුනාගැනීමේ කටයුතු දැනටමත් සිදුවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ශේෂයක් පෙන්වා ඇත. එයින් 2021 සැප්තැම්බර් 30 දින දක්වා හඳුනාගෙන තිබුණේ රු.354,100 ක් පමණක් වන අතර ඉතිරි ශේෂය වන රු.7,436,461 ක් 2018 සිට 2020 දක්වා කාලයට අයත් වන අතර එය 2021 සැප්තැම්බර් 30 දින දක්වාවත් හඳුනාගෙන ගිණුම් පොත්වලින් ඉවත් කර නොතිබුණි. එබැවින්, 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති රු.133,736,801 ක බැංකු ශේෂවල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී විශ්වාසය තැබිය නොහැක. | ක්‍රියා කළ යුතු බව | සෘජුවම අරමුදලේ ගිණුම් වෙත ගෙවීමේ ප්‍රතිඵලයක් ලෙස හඳුනා නොගත් බැර යටතේ විශාල මුදලක් ඇති බවට අරමුදල එකඟ වේ. මෙම තත්ත්වය 2020 මාර්තු මස මුල සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ සෘජු සම්බන්ධතා නොමැති වීම සහ නිසි සන්නිවේදනයකින් තොරව පීඩාවට පත් වූ කාල පරිච්ඡේදයක් විය. නමුත් ඉදිරි කාලය තුළ අප සැසඳීම් කිරීමට වග බලාගන්නා බව. | |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.50,182,648 ක් වූ බැඳුම්කර සහ ඇපකරවලින් ලැබිය යුතු ආදායමෙන් රු.4,460,022 ක් සහ රු.833,520 ක් පිළිවෙලින් වසර 01 කට වැඩි කාලයක් සහ වසර 02 කට වැඩි කාලයක් ආපසු අයකර නොගෙන ගිණුම්වල පැවතුණි. | ප්‍රමාදයකින් තොරව බැඳුම්කර හා ඇපකර වලින් ලැබිය යුතු ආදායමේ ඉතිරි ශේෂය අයකර ගැනීමට ක්‍රියා කළ යුතු බව. | රු.833,520 න් සියයට 58 ට වඩා වැඩි ප්‍රමාණයක් එකතු කර ඇති අතර අනෙක් මුදල් ශේෂය හඳුනා නොගත් බැර ශේෂ විය හැකිය. රු.4,460,022 න් සියයට 54කට වඩා සැලකිය යුතු මුදලක් අයකර ගනිමින් පවතින අතර අනිකුත් ශේෂය හඳුනා නොගත් බැර ශේෂ තුළ ඇතුළත් වන බව. | රු.4,460,022 ක් හැකි ඉක්මනින් අයකර ගැනීමට හා නිෂ්කාශනය කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ බිල්පත් වට්ටම් ශේෂය රු.10,296,098 කි. ඉන් රු.9,631,752ක් හෙවත් සියයට 93ක් මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම වසරකට වැඩි කාලයක් කොන්ත්‍රාත්කරුවෙකුගෙන් අයකර නොගෙන තිබුණි. තවද, මෙම කොන්ත්‍රාත්කරුට සහ වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන අරමුදලට සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, අදාළ බලධාරීන්ට දැනුම් දී මෙම කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කිරීමේ පියවර අරමුදල විසින් සිදු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් හිඟ මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව | ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම සහ 2022 වර්ෂයේදී පියවීමට අපේක්ෂා කිරීම හේතුවෙන් ශේෂය අයකර ගැනීමට නොහැකිව පවතී. ව්‍යාපෘති අවසන් නොමැති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි බව. | 2022 වර්ෂය තුළ විසඳනු ඇත. |

15. විගණන අස්ථිත්‍යයේ නම - **ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - සත්‍ය හා සාධාරණ මතය

2019 - සත්‍ය හා සාධාරණ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුත්තේ සත්‍ය මුදල් ගලායාම් සහ සත්‍ය මුදල් ගලා ඒම් පදනම් කරගෙන වුවත්, අරමුදල ඊට පටහැනිව 2019 හා 2020 වර්ෂවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල අයිතම්වල වටිනාකම් අතර වෙනස්කම් පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබුණි. තවද ප්‍රමිතයේ අංක 54 හා 55 ඡේද ප්‍රකාරව අඩමාණ ණය වෙන්කිරීම් වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ජනනය නොවන ක්‍රියාකාරකමක් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතු බව | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඡේද අංක 08 සහ 56 අනුව භාණ්ඩාගාර බිල්පත් හා ප්‍රති විකුණුම් බිල්පත් ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව | ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්‍රියා කළ යුතු බව | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 ක කාලයක් තුලදී කල් පිරීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් 18 ක එකතු වටිනාකම වූ රු.66,797,498 ක් හා භාණ්ඩාගාර ප්‍රති විකුණුම් (Repo) 02 ක එකතු වටිනාකම වූ රු.6,013,502 ක් මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් යටතේ දක්වා නොතිබුණි. | | | |
| (ඇ) 1996 ඔක්තෝම්බර් 24 දින අංක 946/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1994 අංක 01 දරන චිත්‍රපට සංස්ථා නියෝග | | | |
| (i) 2 (4) (I) (ඉ) වගන්තිය ප්‍රකාරව චිත්‍රපටවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා, චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතු බව | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරන බව. | උපකරණ සැපයීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2 (4) (I) (ඊ) වගන්තිය ප්‍රකාරව චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් පැවැත්වීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතු බව. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිත බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) 2 (4) (I) (උ) වගන්තිය ප්‍රකාරව උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මගින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතු බව | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිත බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iv) 2 (4) (I) (ඌ) වගන්තිය ප්‍රකාරව වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක එම කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතු බව | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිත බව | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (v) | 6 (ඇ) වගන්තිය ප්‍රකාරව ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාර පාලක මණ්ඩලය විසින් නිශ්චය කර අයකර ගත යුතු වුවත්, 2020 වර්ෂය දක්වා සිනමාශාලා හිමියන් වෙත ප්‍රදානය කර තිබූ එකතුව රු 73,548,176.ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ නියෝග අනුව කටයුතු කළ යුතු බව. | මෙම නියෝග 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීමට අපේක්ෂිත බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව 2020 වර්ෂයේ අරමුදලේ වත්කම් සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | වාර්ෂිකව සංස්ථාවේ වත්කම් සමීක්ෂණය කිරීමේදී එම මණ්ඩලය මඟින් අරමුදලේ වත්කම්ද සමීක්ෂණය කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ඇතුළත් කල මුදල් රෙගුලාසි 872(2) (ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 08 ක් ප්‍රමාදව 2021 නොවැම්බර් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණු බව. | ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 1999 ජුනි 17 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය ප්‍රකාරව ආයෝජන මණ්ඩල රෙගුලාසි යටතේ ඉදිකරන ලද සිනමා සංකීර්ණවල ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් ආනයනික චිත්‍රපටයක ප්‍රවේශ පත්‍රයකින් රු.2.25 හෝ මුළු ප්‍රවේශපත් ආදායමින් සියයට 2.25ක් හෝ යන දෙකින් වැඩි මුදල,අරමුදලට ලැබිය යුතු වුවත් 2001 වර්ෂයේදී ඉදිකරන ලද මරදාන සිනේ සිටි (Cine City) සිනමා සංකීර්ණයෙන් එලෙස අයවිය යුතු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | මේ ප්ළිබදව ආයෝජන මණ්ඩලයේ (BOI) ගිවිසුම් හා බෙදාහැරීම් සම්බන්ධයෙන් නීතිපති උපදෙස් පාලක මණ්ඩලයට යොමු කර එහි තීරණ මත කටයුතු කරන බව. | මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (උ) | චිත්‍රපට නිෂ්පාදන සහ සිනමාශාලා සඳහා ලබාදී ඇති ණය මුදල් තුළ, වසර 05 සිට වසර 26 දක්වා කාලයක සිට පැවත එන අයකරගත නොහැකි යැයි අරමුදල විසින් ඇස්තමේන්තුගත ණය එකතු වටිනාකම රු.66,958,372 ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම ලබාදී ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 91 ක් විය. ණය ලබාදීමේදී හා අයකර ගැනීමේදී විධිමත්ව හා කාලීනව කටයුතු නොකිරීම නිසා ඉහත ණය ශේෂයන් අයකර ගැනීමට නොහැකිව අඛණ්ඩව හිඟ ණය ශේෂයක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි. | මෙම ණය මුදල් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර අයකර ගැනීමට ක්‍රියා කළ යුතු බව. | ණය කමිටුවක් මඟින් අරමුදලෙන් ලබාදුන් ණය සම්බන්ධයෙන්ද පරීක්ෂා කරන බැවින් කමිටු නිර්දේශ මත කටයුතු කරනු ලබන බව. | මෙම ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2001 හා 2002 වර්ෂවලදී පිල්ම් ලංකා නැමති සමාගමට මරදාන සිනේසිටි සිනමා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලට ගැනීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 8.5 ක ණය මුදල, ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් රු.890,655ක් අයකරගත යුතුව පැවතුණි. මෙම ණය මුදල සඳහා 2006 වර්ෂය දක්වා ලැබිය යුතු පොළී වටිනාකම රු.4,064,958 ක් ලෙස ගණනය කර තිබූ අතර, ඉන් පසු වර්ෂ සඳහා ලැබිය යුතු ණය පොළී ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිනෙසිටි සිනමා සංකීර්ණය ඉදිකිරීමට අදාළ ණය ගිවිසුම ප්‍රකාරව 2019 වර්ෂය දක්වා පොලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | සිනේසිටි සිනමා සංකීර්ණය කඩින් කඩ ණය මුදල් ගෙවීම සිදුකරන බැවින් 2019 දක්වා පොලී අයකර ගැනීම පිළිබඳව ණය කමිටුවට යොමුකර එහි නිර්දේශ මත ඉදිරි කටයුතු කරන බව. | මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

16. විගණන අස්ථිත්‍යයේ නම - **සමාගම් අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 -තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2007 වර්ෂයේදී ඊ සර්විසස් ලංකා සමාගම පිහිටුවීමට අදාළව සියයට 35 ක රජයේ දායකත්වය වෙනුවෙන් එම සමාගමේ සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් මිලදී ගැනීම වෙනුවෙන් වෙළඳ, අලෙවි සංවර්ධන සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශ ලේකම්ගේ ගිණුමට මාරුකළ රු.90,275,000 ක මුදලක්, ආයෝජන යටතේ දක්වා තිබුණි. එසේ වුවද ආයෝජිත දිනයේ සිට 2020 වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබූ අතර, එම සමාගම 2016 දෙසැම්බර් 31 දිනට සමාගම් පනතේ 131(1) වගන්තිය පරිදි ඉදිරිපත් කරනු ලැබූ 15 වන ආකෘතිය අනුව අමාත්‍යාංශ ලේකම් නමින් කොටස් හිමිකමක් පෙන්වා නොතිබුණි. | 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ 15 වන ආකෘතියේ කොටස් හිමිකම නොපෙන්වීමට හේතු පරීක්ෂා කළ යුතු බව. | 2013.01.13 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් මෙම සමාගම තවදුරටත් පවත්වාගෙන යාම ලාභදායී නොවන හෙයින් සී/ස ඊ සර්විසස් ලංකා සමාගම ඇවර කිරීමට නිරීක්ෂණ ලබා දී ඇති බව. | මෙම කොටස් ආයෝජනය කිරීම පිළිබඳ විර්ශනයක් සිදු කරන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| (ආ) | සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීම සඳහා 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත රු. 88,812,228 ක ඇස්තමේන්තුවකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත | අදාළ මුදල අයකරගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු බව. | කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර තිබෙන වියදම් කපා හැරීමට මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ බව. | ගෙවා ඇති මුදල අයකරගැනීමට හෝ කපාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදලින් පළමු සහ දෙවන සියයට 10 ක කොටස් වශයෙන් රු.13,268,450 ක් අවස්ථා දෙකකදී ගෙවා තිබුණද එම කාර්යය නියමිත කාලය තුළ අවසන් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. එම ව්‍යාපෘතියෙන් දී තිබූ ලේඛණ (Deliverables) වර්තමානයේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතියට යෙදවුමක් ලෙස භාවිත වී නොතිබූ අතර එම මුදල අයකරගැනීම සම්බන්ධයෙන්ද විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේ වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට , මෙම වියදම කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | | | | |
| (ඇ) | සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීම සඳහා 2017 වර්ෂයේදී වූ ගිවිසුම පරිදි *e-Roc* පද්ධති මෘදුකාංගය සැලසුම් කරන ලද ආකාරයටම සිදුවන බව තහවුරු කර ගැනීම සඳහා පද්ධති විගණනයක් (*System Audit)* සිදු කිරීම හා සෑම *Iteration* එකකින් පසුව එය එළිදැක්වීමට පෙර ප්‍රතිගාමී පරීක්ෂාවක් (*Regression Test)* සිදු කළ යුතු බව, උපදේශන සේවාව ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (*ICTA* ) විසින් උපදෙස් ලබාදී තිබුණද ඒ අනුව ක්‍රියා නොකළ බව අවධාරණය කළේය. තවද පද්ධතියේ දත්ත වල ආරක්ෂාව සහ ණය කාඩ්පත් මගින් ගෙවීම් | ගිවිසුම තුළ පෙන්වා දෙනු ලැබූ සහ එකඟ වූ කොන්ත්‍රාත්කරු ගේ කාර්ය මණ්ඩලය, සෑම සංවර්ධන අදියරකදීම සිටින බවට තහවුරු කර ගත යුතු බව. | CERT ආයතනය වෙත යවා පද්ධති විගණනයක් (SYSTEM AUDIT) සිදු කර ඇති බව. | පද්ධති විගණන වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට යෝජිතයි. | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේදී ඇතිවන අනාරක්ෂිත බව පිළිබඳවද උපදේශන සමාගම විසින් කරුණු අනාවරණය කරන ලදී. | | | |
| (ඇ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 131(1) හා (2) වගන්ති ප්‍රකාරව ලියාපදිංචි සමාගම් සිය වාර්ෂික වාර්තා ගොනුකළ යුතුය. නමුත් කාර්යසාධන වාර්තාවට අනුව 2020 වර්ෂයේ වාර්ෂික වාර්තා ගොනු කළ යුතු සමාගම් සංඛ්‍යාව 111,377 ක් වූ අතර , ඉන් සමාගම් 17,173 ක් පමණක් එම වාර්තා ගොනු කර තිබුණි. ඒ අනුව සමාගම් 94,204 ක් හෙවත් සියයට 85 ක් වාර්ෂික වාර්තා ගොනු කිරීම පැහැර හැර තිබුණි. | වාර්ෂික වාර්තා ගොනු නොකරන සමාගම් සංඛ්‍යාව වර්ධනය වීම වලක්වා ගැනීමට කටයුතු කල යුතු බව. | පද්ධතිය තුළින්ම සිහි කැඳවීම් තුනක් යැවීම හා ඉකුත් වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා ගොනු කිරීමේදී ඒ ඒ වර්ෂවලට අදාළ ගාස්තු අයකිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බව. | වාර්ෂික වාර්තා ගොනු කිරීමේ වර්ධනයක් ඇත. |
| (ඉ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 170 වගන්තිය ප්‍රකාරව පෞද්ගලික සමාගමක් නොවන සෑම සමාගමක්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කල යුතුය. ඒ අනුව 2020 වර්ෂයට අදාළව එලෙස කටයුතු කළයුතු සමාගම් සංඛ්‍යාව 7,175 ක් විය.එයින් සමාගම් 1,001 ක් පමණක් පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කර තිබුණද සමාගම් 6,174 ක් හෙවත් සියයට 86 ක් එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ නියමයන්ට අනුව ක්‍රියා කිරීමට සමාගම් දැනුවත් කර මූල්‍ය වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. | මූල්‍ය වාර්තා නියමිත දිනට ගොනු කරන ලෙස දන්වා පද්ධතිය තුළින් සිහි කැඳවීම් 3ක් යැවීමට කටයුතු කර ඇති බව. | මූල්‍ය වාර්තා ගොනු කිරීමේ වර්ධනයක් ඇත. |

17. විගණන අස්ථිත්‍යයේ නම - **බුද්ධිමය දේපළ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තත්වාගණනය කළ මතය
2019 - තත්වාගණනය කළ මතය
2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකෙරමින් පැවතියදී ඒ ආශ්‍රිත ඉඩම් සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීම නිසා ඒ සඳහා වැය වූ රු.22,298,751 ක මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීම සඳහා 2015 මාර්තු 13 දිනැති අංක අමප/15/0272/625/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා 2015 අප්‍රේල් 23 දින අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද 2018 වර්ෂය අවසාන වන විටත් එකී මුදල අයකරගත නොහැකි වී තිබුණි. | වියදම් ප්‍රතිපූර්ණය කිරීම හෝ නීති උපදෙස් මත ක්‍රියාකල යුතු බව. | 2018 වර්ෂයේ දී ජනාධිපති ලේකම් විසින් කළ දැනුම් දීමක් මත මෙම ඉදිකිරීම් අතරමඟ නවතා දමා ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය සතු අඩක් නිම කළ ගොඩනැගිල්ලක් පිහිටි ඉඩමක් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ඉටු කරමින් පවතින බව. | බුද්ධිමය දේපළ අලවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට වැය වූ රු.මි. 22.29 ක මුදල අයකරගෙන නොතිබුණි. |
| (ආ) | කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් පද්ධතිය වෙත ප්‍රවේශවීම සම්බන්ධයෙන් ව්‍යාපෘති | සැලසුම්ගත ඉලක්කයන් ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හේග් ගිවිසුම මගින් ප්‍රතිලාභ ලැබීමට නියමිත කණ්ඩායම්, නීති විශාරදයින් ආදී කණ්ඩායම් වෙතින් අධ්‍යයන වාර්තාවක් | හේග් පද්ධතිය වෙත ප්‍රවේශවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තාව සැකසීමට සැලසුම්කර තිබුණද, මූලික අධ්‍යයන කටයුතු පමණක් සිදු කර තිබුණි. | | ලබා ගැනීමට සැලසුම් කර ඇති බව. | |
| (ඇ) | 2020 වර්ෂයේ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම් අවස්ථා 5932 කින් අවස්ථා 760 ක්ම 2010 වර්ෂයට පෙර ලද ඉල්ලුම්පත් වූ අතර එම ප්‍රමාදය වෙළඳ ලකුණු ලියාපදිංචි ක්‍රියාවලියේ ස්වභාවය සහ සංකීර්ණත්වය මත සිදුවන්නක් බවට අධ්‍යක්ෂ ජනරාල් විසින් අදහස් දක්වා තිබුණි. එසේ වුවත් බුද්ධිමය දේපළ පනතේ 118(1) හා (2) වගන්ති අනුව වෙළඳ ලකුණක වලංගු කාලය ලියාපදිංචි කළ දින සිට වසර 10 කට සීමාවන බැවින් හා ලියාපදිංචිය ඉල්ලුම්කළ දින සිට වලංගුවන පරිදි නිකුත් කිරීම හේතුවෙන් එම වෙළඳ ලකුණු ලියාපදිංචිය සිදුවන අවස්ථාව වන විටත් අවලංගු වී තිබුණි. | බුද්ධිමය දේපළ පනතේ 118(1) හා (2) වගන්ති අනුව වෙළඳ ලකුණක වලංගු කාලය ලියාපදිංචි කළ දින සිට වසර 10 කට සීමාවන බැවින් හා ලියාපදිංචිය ඉල්ලුම්කළ දින සිට වලංගුවන පරිදි නිකුත් කිරීම හේතුවෙන් සිදුවන ප්‍රමාද වළක්වාගැනීමට කටයුතු කළ යුතු වීම. | ආයතනයේ පාලනයෙන් බැහැර හේතූන් මත ඉකුත් වසරවලට අදාළ ප්‍රමාද වූ ලියාපදිංචි කිරීම් කඩිනමින් අවසන් කිරීමට වැඩපිළිවෙළක් වෙළඳ ලකුණු අංශය මගින් ආරම්භ කර ඇති බව. | ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි කිරීම් වැඩිවී ඇත. |
| (ඇ) | වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා 2020 වර්ෂය තුළ ලද ඉල්ලුම්පත් 9,593 කින් 6,294 ක වැඩ ආරම්භකර තිබුණද, වර්ෂය තුළ දී වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ මට්ටම දක්වා ක්‍රියාත්මකවී නොතිබුණි. | වර්ෂය තුළ ලද ඉල්ලුම්පත්, ලැබූ වර්ෂය තුළ දීම ලියාපදිංචි කිරීමේ මට්ටම දක්වා ක්‍රියාත්මක කළ යුතු බව. | ලිපි ගොනු ඩිජිටල්කරණය ,අක්‍රිය ගොනු භෞතිකව ඉවත් කිරීම , අතපසුවීමට ලක් වී පවතින කාර්යයන් යාවත්කාලීන කිරීම සඳහා වෙන වෙනම | හඳුනාගත් ව්‍යාපෘති තුන, 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති තුනක් හඳුනා ගෙන ඇති බව. | |
| (ඉ) | පේටන්ට් බලපත්‍රය සඳහා ඉල්ලුම්කළ වසරේදීම එම බලපත්‍රය නිකුත් කිරීමට සැලසුම් කළ යුතු වුවද, 2020 වර්ෂය තුළදී නිකුත් කළ බලපත්‍ර 273 කින් බලපත්‍ර 258 ක්ම 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් වූ බැවින් විශාල ප්‍රමාදයකින් පසුව බලපත්‍ර නිකුත් කර තිබුණි. | පේටන්ට් බලපත්‍රය සඳහා කළ යුතු බව. | සහතික නිකුත් කිරීමේ කණ්ඩායම් පත් කිරීම හා සහතික නිකුත් කිරීමේ සති පැවැත්වීම තුළින් ප්‍රමාදය වළක්වාගැනීමට උත්සාහ කරන බව. | ඉකුත් වර්ෂයට සාපේක්ෂව මේවන විට සහතික පත් වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇත. |

18. විගණන අස්ථිත්‍යයේ නම - **ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | --------------------- | -------------------- | ---------------------- | ------------------------ |
| (අ) | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් හා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා නංවාලීම වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය කර ගන්නා ආකාරය පිළිබඳ වැඩසටහන් පිළියෙළ කර නොතිබුණි.2020 ජනවාරි 01 දිනට පොදු අරමුදලේ බැර ශේෂය රු.411,069,837ක්වූ අතර වර්ෂය තුළදී රු.144,191,754 ක් අරමුදලට බැරවී තිබුණි. එබැවින් උපයෝජනය කළ හැකිව තිබුණු අරමුදල් රු.555,261,591 ක් වුවද, ඉන් රු.49,280,114 ක් පමණක් 2020 වර්ෂය තුළදී උපයෝජනයකර තිබුණි. ඒ අනුව අරමුදල සතු පොදු අරමුදල් උපයෝජනය සියයට 9ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි. | අරමුදලේ අපේක්ෂිත අරමුණු ඉටුකරගත හැකිවන පරිදි සැලසුම් හා වැඩ සටහන් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු බව | ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ලැබෙන මුදල්, ඒවා ලැබුණු වර්ෂයේදීම උපයෝජනය නොකරන බව හා ජාතික අයවැයෙන් ප්‍රතිපාදන සපයනු නොලබන හදිසි අවශ්‍යතාවයන් සඳහා අරමුදලෙන් ප්‍රතිපාදන සපයනු ලබන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකරදී නොතිබුණු, මධ්‍යම රජයේ සහ පළාත් හා දිස්ත්‍රික් රෝහල්වල වෛද්‍ය උපකරණ අවශ්‍යතාවය 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 9,845 ක් හා රු.මිලියන 2,131 ක් විය. මීට අමතරව මහ රෝහල් හා මූලික රෝහල් 11 ක් සඳහා අත්‍යවශ්‍ය උපකරණ 130 ක අවශ්‍යතාවයද, වැඩ හා කාර්යයන් 13 ක අවශ්‍යතාවයක්ද පැවතුණි. නමුත් එම අඩුපාඩු පිළිබඳ සොයා බලා ප්‍රමුඛතාවය පදනම් කරගෙන ඉන් කිසියම් හෝ ප්‍රමාණයක් පොදු අරමුදලින් ඉටු කර දීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබුණි. | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතා වෙනුවෙන් අරමුදල සතු පොදු අරමුදල් යොදවා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාවට නැංවිය යුතු බව | මෙහි සඳහන් බොහෝ වෛද්‍ය උපකරණ භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් සපුරා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1996 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී අරමුදල වෙත නිශ්චිත කාර්යයන් 11 ක් සඳහා ලැබී තිබුණු රු.මිලියන 8.09 ක පරිත්‍යාග වර්ෂ 3 ක සිට වර්ෂ 17 ක කාල පරාසයක් තුළ එම අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | අරමුදල වෙත පරිත්‍යාග ලෙස ලැබී ඇති අරමුදල් අරමුණු ගත කාර්යයන් ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කළ යුතු බව | මෙම පරිත්‍යාග උපයෝජනය කර අරමුණුගත කාර්යයන් ඉටුකර ගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |
| (ඈ) | රජයේ රෝහල් සඳහා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට හා රෝහල් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ අරමුණින්, සෞඛ්‍ය සංවර්ධන | සෞඛ්‍ය සංවර්ධන ලොතරැයි ක්‍රමය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා එම අරමුදල් | ඉදිරි වර්ෂවලදී මේ සම්බන්ධව කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලොතරැයි ක්‍රමය 1998 සැප්තැම්බර් මාසයේදී හඳුන්වාදී තිබුණු අතර සෑම දිනුම් අදින වාරයකටම ප්‍රථමයෙන් එම වාරයේ අරමුදලින් කෙරෙන කාර්යය හඳුනාගෙන ප්‍රකාශයට පත් කර එකී කාර්යය ඉටු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි. 2014 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණු රු.399,767,068 ක ලොතරැයි ආදායමෙන් රෝහල් සඳහා උපකරණ මිලදී ගැනීමට සහ රෝහල් අළුත්වැඩියා කටයුතු ආදී අරමුණුගත කාර්යයන් සඳහා පිළිවෙලින් රු.20,578,392 ක් හා රු.86,344,001 ක් පමණක් වැය කර තිබුණු අතර එය සමස්ත ලොතරැයි ආදායමෙන් සියයට 21 ක් පමණක් විය. | උපයෝජනය කළ යුතු බව | | |
| (ඉ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද අංක 33 දරන කළමනාකරණ සේවා | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බවත්, ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බවත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඒ | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථා පනවන තෙක් බැංකුවේ කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලැබී ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කර නොතිබුණි. බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බැවින් කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතු කළ නොහැකිව තිබුණි. | අනුව කටයුතු කළ යුතු බව | | |
| (ඊ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැකි අවශ්‍යතාවයන් සපුරා නොතිබියදී, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය උපයෝගී කරගනිමින් ව්‍යාපෘති දීමනා හා ගෞරව දීමනා වශයෙන් නිලධාරීන් 29 දෙනෙකු වෙත රු.3,355,168 ක් 2018 වර්ෂය තුළදී ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන දීමනා ගෙවීමෙන් වැළකිය යුතුය. ගෙවා තිබුණු දීමනා සඳහා ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමට හෝ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතු බව | ව්‍යාපෘති දීමනා 2021 ජනවාරි සිටත් ගෞරව දීමනා 2021 අගෝස්තු සිටත් ගෙවීම් අත්හිටුවා ඇති බව | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම දීමනා ගෙවීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගෙන හෝ ගෙවූ දීමනා ආපසු අයකිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (උ) | ජාතික අක්ෂි බැංකුව සංවර්ධනය කිරීම හා පුහුණුවලත් අක්ෂි කාර්ය මණ්ඩලයක් ඇති කිරීම අරමුණු කරගෙන, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඇමරිකා එක්සත් ජනපදයේ Sight Life (SL), Seattle WA ආයතනය සමඟ වර්ෂ 5ක් සඳහා වූ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2016 වර්ෂය පාදක කරගෙන දිවයිනේ ප්‍රධාන රෝහල්වල අක්ෂි බැංකු ශාඛා පිහිටුවීම හා අක්ෂි පටල අවශ්‍යතා සැපයීම ඉලක්ක කරගනිමින් සැලසුම් පිළියෙලකර | ජාතික අක්ෂි බැංකුවේ සංවර්ධනය වෙනුවෙන් ලැබෙන විදේශ ආධාර සම්බන්ධයෙන් එළඹි ගිවිසුම් අනුව කටයුතු කළ යුතු බව | අදහස් ඉදිරිපත්කර නොතිබුණු බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 14,000ක් අහිමිවීම සම්බන්ධයෙන් 2022 ජනවාරි 31 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබීමත්, මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යසාධනයක් නොපෙන්වීමත් හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 14,000ක් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | | | |
| (ඖ) | අරමුදලේ අරමුණු හා කාර්යයන්ට ගැලපෙන පරිදි බාහිර පාර්ශවයන්ට මූල්‍යාධාර ලබාදීමේ පදනමක් හා නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. අරමුදල් පනතේ 7 වගන්තියෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා 2018 වර්ෂය තුළදී පමණක් විවිධ සංගම් හා ආයතන 14 ක් වෙත ලබා දී තිබුණු මූල්‍යාධාර රු.21,044,400 ක්විය. | අරමුදල් පනතෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබා නොදිය යුතු බව | අදහස් ඉදිරිපත් කර නොතිබුණු බව. | 2020 වර්ෂයේදීද විවිධ සංගම් වෙත මූල්‍යාධාර ලබාදී තිබුණි. |
| (එ) | පුද්ගලික පදනමින් රෝගීන් වෙත ආධාර ලබාදීමට අරමුදල් පනතේ ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත්, 2018 වර්ෂය තුළදී රෝගීන් 12 දෙනෙකු වෙත රු.11,029,810 ක මූල්‍යාධාර ලබාදී තිබුණි. | අරමුදල් පනතෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබා නොදිය යුතු බව | අදහස් ඉදිරිපත්කර නොතිබුණු බව. | 2020 වර්ෂයේදීද පුද්ගලික පදනමින් රෝගීන් වෙත මූල්‍යාධාර ලබාදීම සිදුකර තිබුණි. |
| (ඒ) | මහරගම අපේක්ෂා රෝහලට Tomotherapy linear Accelerator යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අරමුදල යටතේ අපේක්ෂා රෝහල නමින් | එකඟතාවයන් සහ ගිවිසුම්වලට එළඹීමට පෙර අදාළ බාහිර ආයතනවල නෛතික තත්ත්වය පිළිබඳ අවධානය | වැඩ බලන සෞඛ්‍ය ලේකම්වරයා විසින් 2019 අප්‍රේල් 01 දින අභිප්‍රාය ලිපියට (Letter of Intent) අත්සන් කර ඇති බව, | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

ඇති බැංකු ගිණුමට මහජන ආධාර රැස් කිරීමේ අරමුණ ඇතිව සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ද, අරමුදල වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල් හා Fight Cancer Guarantee Trust සංවිධානය හා එක්ව දින රහිත අභිප්‍රාය ලිපියකට (Letter of Intent) අත්සන් තබා තිබුණි. කෙසේ වෙතත් Fight Cancer Guarantee Trust ආයතනය සමාජ සේවා හා පොදු පහසුකම් සැපයීම සඳහා වූ පුණ්‍ය කටයුතුවලට සම්බන්ධ ආයතනයක් ලෙස සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් පරිදි බලය ලබා ගත් ආයතනයක් නොවීය. අභිප්‍රාය ලිපිය අත්සන් කළ දිනය හා එහි බලාත්මක දිනය නිශ්චය කර නොතිබුණු අතර අභිප්‍රාය ලිපියේ පළමුවන කරුණ ප්‍රකාරව අදාළ පාර්ශවයන් තුන විසින් 2020 අගෝස්තු 31 දින වන විටත් අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි. එම ලිපියේ තුන්වන කරුණ ප්‍රකාරව, බැංකු ගිණුමට පරිත්‍යාගකරුවන් විසින් සෘජුවම මුදල් තැන්පත් කිරීමට යොමු කළ යුතු වුවද ඉන් බැහැරව Fight Cancer Guarantee Trust යොමු කළ යුතුය. එකඟ වූ කරුණුවලට අනුකූලව අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. බැංකු ගිණුමට සෘජුවම මුදල් තැන්පත් කිරීමට පරිත්‍යාගකරුවන්ව යොමු කළ යුතුය. ඉන් බැහැරව සිදුවන කටයුතු සම්බන්ධයෙන් වගකීමට බැඳීමක් ඇති නොවන ආකාරයෙන් රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුතු බව අරමුදල වෙනුවෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අත්සන් කර ඇති බව, ප්‍රදේශයේ සියළුම ජනතාවට බැංකුවට සෘජුවම මුදල් තැන්පත් කළ නොහැකි හෙයින් ගිංතොට සංවර්ධන පදනම විසින් මුදල් එකතුකර සෘජුවම අමාත්‍යවරයාට භාරදී ඇති බව සහ එම මුදල සෘජුවම බැංකුවට තැන්පත් කර ඇති බව.

| | | | | |
|---|---|---|---|---|
| | කණ්ඩායමේ මෙහෙයවීමෙන් ගෙන් ගෙට ගොස් මහජන ආධාර රැස්කර තිබුණු අතර එපරිදි රැස් කලේයැයි සඳහන් රු.255,500 ක් බැංකු ගිණුමට බැර කර තිබුණි. | | | |
| (ඔ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය කර ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සපුරාගත යුතු වුවද ඊට පටහැනිව කටයුතු කරමින් කිසිදු ප්‍රසම්පාදන ක්‍රමවේදයකට අනුගත නොවී, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 9.20 ක් වැය කර ජාතික අක්ෂි බැංකුව සඳහා Cornea Storage Media Sterile (Vial) ඒකක 480 ක් මිලදී ගැනීමටද, 2019 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළදී පෞද්ගලික රසායනාගාරයක් වෙත රු.මිලියන 2.18 ක් ගෙවා අක්ෂි පරිත්‍යාගකරුවන්ගේ රුධිර සාම්පල් පරීක්ෂා කර ගැනීමටද කටයුතු කර තිබුණි. 2019 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා එම රසායනාගාරපරීක්ෂණ වෙනුවෙන් රසායනාගාරයක් තෝරා ගැනීම සඳහා විවෘත ලංසු කැඳවා තිබුණු නමුත්රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 (ආ), 5.3.1, 5.3.11, 5.3.13, 5.3.19, 6.3.3, | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතුකළ යුතු බව | අක්ෂි බැංකුව සඳහා Cornea Storage Media Sterile (Vial)මිලදී ගැනීමට සහ රුධිර සාම්පල් පරීක්ෂාව සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමට ජාතික අක්ෂි රෝහලේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2020 වසරේ සිට කටයුතු කරන බව. | 2022 ජනවාරි 31 දින වන විටත් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 6.3.6, 7.9.11 හා 7.11.1 යන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණු අතර එපරිදි තෝරාගත් රසායනාගාරය වෙත එම මාස දෙක තුළදී රසායනාගාර පරීක්ෂණ සඳහා රු.862,750 ක් ගෙවා තිබුණි. | | | |
| (ඕ) | 2020 වර්ෂය වන විට වර්ෂ 4 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් තුළ ලැබිය යුතුව තිබුණු එකතුව රු.1,382,346ක ණයගැති ශේෂ මෙම වාර්තාවේ දිනය වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | දීර්ඝ කාලයක සිට අයකර ගත නොහැකිවී තිබුණු මෙම මුදල අයකර ගැනීමට හෝ අයකර නොගැනීමට වගකිව යුතු පාර්ශවයන් වෙතොත් ඔවුන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත් පරිදි පොත්වලින් කපාහැරීමට කටයුතු කළ යුතු බව. | සෙලින්කො රක්ෂණ සමාගම විසින් නිකුත්කර තිබුණු කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම රු.1,372,346ක් අය කර ගැනීම සඳහා අදාළ පාර්ශවයන් වෙත ලිපි යවා ඇති බව. | කාර්යසාධන සුරක්ෂණය අයකර ගැනීමට හෝ එය අයකර ගැනීමට නොහැකිවීමේ වගකීම දරන නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (ක) | 2020 වර්ෂයේ විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කාර්යයන් අවසන්ව තිබුණු ව්‍යාපෘති 13 කට අදාළව රු.මිලියන 2.3 ක් පරිත්‍යාග කළ ආයතන වෙත ආපසු යැවීමට හෝ පොදු අරමුදල වෙත පවරාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිවලට අදාළ අවබෝධතා ගිවිසුම් හෝ එකඟතා ප්‍රකාරව කටයුතු කළ යුතුය. එසේ නැතහොත් ඉතිරි මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පොදු අරමුදල වෙත පවරා ගත යුතු බව | ව්‍යාපෘති කාර්යයන් අවසන්වී ඇති ව්‍යාපෘතීන්ට අදාළව පවතින පරිත්‍යාග මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන පොදු අරමුදලට බැර කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2022 ජනවාරි 31 දින වන විටත් නිවැරදි කර නොතිබුණි. |
| (ග) | නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපොළට හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 15ක | ආයුර්වේද ඖෂධ සංස්ථාව සමඟ ඇති එකඟතාව පරිදි අරමුදලට ලැබිය යුතු මුදල් | 2020 වර්ෂයට අදාළව මුදල් ගෙවන ලෙස සිහි කැඳවීම් යවා ඇති බව. | 2022 ජනවාරි 31 දින වන විටත් ඉතිරි මුදල් අයකර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| ප්‍රදානයක් 2015 මැයි 26 දින ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත ලබාදී තිබුණු අතර,ඒ වෙනුවෙන් නව නිෂ්පාදන එක් ඒකකයක ලාභයෙන් සියයට 10 බැගින් මාසිකව අරමුදලට බැර කිරීමට සංස්ථාව ප්‍රතිපත්තිමය වශයෙන්එකඟවී තිබුණි. 2015 ජුනි මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී සංස්ථාව විසින් අරමුදල වෙත රු.1,260,427ක් පමණක් එවා තිබුණු අතර 2020 වර්ෂයට අදාළව සංස්ථාව වෙතින් කිසිදු මුදලක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | අයකරගැනීමට කටයුතු කළ යුතු බව |

19. විගණන අස්ථිත්‍යයේ නම - **රේගු අතිකාල,නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | -------------------- | ---------------- | ---------------- | ------------------------ |
| (අ) | 1967 – 2007 කාලපරිච්ඡේදය තුල ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314 ක මුදල, බාහිර ආයෝජනවල යෙදවීම තුලින් උපයා තිබූ පොලී ආදායම සමඟ සමස්ථ ආයෝජනය වූ රු.13,872,683 මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්ථමානයේදී සේවා සැපයීම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය වගකීම් සහ ආයෝජන යටතේ ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | වර්තමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනයකර නිසි ගිණුම් තැබීමක් සිදුකිරීම හෝ අවශ්‍ය වෙනත් ක්‍රියාමාර්ගයන් ගතයුතු බව. | තැන්පත් ශේෂ රජයේ ආදායමට බැරකිරීම සඳහා ඇති හැකියාව පිළිබඳව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙතින් විමසා ඉදිරි පියවර ගැනීමට කටයුතු කරගෙන යන බව . | ශේෂයන්හී පැවැත්ම පිළිබඳ පරීක්ෂාකර අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන නොමැත. |
| (ආ) | 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී, 2020 වර්ෂය සඳහා රු.850,149,598 ක මුදලක් | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරින්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළයුතු බව. | පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව මගින් සිදු කරන ලද විමසීම් වලට අනුව අවශ්‍ය යෝජනා හා ක්‍රියාපටිපාටි සකස් කිරීම සඳහා අනුකමිටුවක් පත්කර වාර්තාවක් ලබාගෙන ඇති බව. | ගිණුම්කාරක සභාවේ නියමයන් අනුව කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අතිකාල ලෙස ගෙවා තිබුණි. | | | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ඇතුළත්කළ මුදල් රෙගුලාසි 876(2) (ඇ) ඡේදය ප්‍රකාරව අතිකාල අරමුදල තුල භාණ්ඩාගාර අරමුදල ලෙස රු.2,133,975,331 ක මුදලක් දීර්ඝ කාලයක සිට සමුච්චිත වෙමින් පැවතියද, විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡාකර එම අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව සමුච්චිත වෙමින් පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර ඒකාබද්ධ අරමුදලට බැරකල යුතු බව. | පවත්නා ක්‍රමවේදයට අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු ගිණුම වෙත අදාල මුදල් ප්‍රේශණය කර තිබුණද ඒකාබද්ධ අරමුදලට බැර කර නොමැති බව. | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ පොදු තැන්පත් ගිණුම ඒකාබද්ධ අරමුදල නොවන බැවින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඈ) | නෞකා නියෝජිත ආයතනවලින් ලබාගන්නා රු.100,000 ක් වූ තැන්පතු සුදුසු ආයෝජන මාර්ගයක ආයෝජනය කර පොලී ආදායමින් රජයට අයවිය යුතු කොටස හඳුනාගෙන ඉතිරිය තැන්පත්කරුට ගෙවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. | රැස් කර ගන්නා ඇප තැන්පතු සියල්ල ආයෝජන මාර්ගයක යෙදවීම ප්‍රායෝගික නොවන බව. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| (ඉ) | 2020 වර්ෂය තුළ අතිකාල අරමුදලේ ඌණතාවය රු.141,774,896 ක් ව තිබුණු අතර එම ඌණතාවය පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුල අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. මෙම ඌනතාවය ඇතිවීම කෙරෙහි 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම සියයට 50 කින් වැඩිකර තිබීම හේතු වී තිබුණු අතර මෙම අතිකාල ගෙවීම සඳහා පමණක් අභ්‍යන්තර කමිටුවකින් තීරණයක් ලබා | ගෙවීම් සිදුකිරිම නිසි අධීක්ෂණයක් යටතේ කළයුතු බව | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණු බව. | අතිකාල අරමුදලින් කරනු ලබන ගෙවීම්වලට අදාල අතිකාල රේටයන් සංශෝධනය සඳහා අනුමැතිය ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද මේ සඳහා නිශ්චිත අනුමැතියක් ලැබී නොතිබුණි. | | | |
| (ඊ) | නිලධාරීන් දිනපතා අඛණ්ඩව පැය 24 ක් පුරා සේවයේ යෙදවීම ඉතාම අසාමාන්‍ය තත්ත්වයක් වුවද, රේගු දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් වර්ෂයක් පුරා අඛණ්ඩව දිනකට පැය 24 බැගින් සේවයේ යෙදවූ බවට වාර්තා කර අතිකාල ගෙවා තිබුණි. | අතිකාල ගෙවීමේදී අධීක්ෂණ නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණයක් සිදු විය යුතු බව. | අතිකාල ගෙවීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම පිළිබඳව අධ්‍යයනය කරමින් පවතින අතර, පැමිණීම හා පිටවීම ලකුණු කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීමට කටයුතු කරමින් පවතින බව. | ඇඟිලි සළකුණු යන්ත්‍ර සවිකිරීමට කටයුතුකර නොමැත. |

20. විගණන අස්ථිතායේ නම - **සුරාබදු තැගි අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 47,134,000 ක් ලෙස දක්වා තිබුණද, එය ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් විය. එසේ වුවද ගොඩනැගිල්ල පිහිටි ඉඩම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර ඉඩමේ අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි. | ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත් පරිදි අයිතිය තහවුරු කර ගනිමින් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව . | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉඩම පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | මේ දක්වාත් පවරා ගැනිම සිදු වී නොමැත. |
| (ආ) | 2020 වර්ෂයේ අවසානය දක්වාම රු.47,134,000 ක් වු ගොඩනැගිලි වෙනුවෙන් ක්‍ෂය ගැලපීම් සිදුකර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 පරිදි කටයුතු කළ යුතු බව. | ගොඩනැගිලි සඳහා ක්ෂය ගැලපීම් සිදුකර නොමැති බව. | ක්ෂය ගැලපීම් මෙතෙක් සිදු කර නොමැත. |
| (ඇ) | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද<br>ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් අරමුදලේ ආරම්භක දින සිට 2020 වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවිය යුතු බව. | සංශෝධනය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා සිදු කර ඇති බව වාර්තා කර ඇති බව. | සංශෝධනය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යැවූ බවට ලිඛිත සාක්ෂි ආයතනය සතුව නොමැත. |
| (ඈ) | සුරාබදු තැගි අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ අරමුදලේ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද 2020 වර්ෂය සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව | 2021 වර්ෂයේ සිට සුරාබදු තැගි අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ | 2021 වර්ෂයේ මේ දක්වා කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කර ඉදිරිපත් කර |

<table>
<tr><td></td><td></td><td></td><td>කාර්යසාධන වාර්තාවන් ලබාදීම සඳහා කටයුතු කරන බව</td><td>නොමැත.</td></tr>
<tr><td>(ඉ)</td><td>2020 වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 කට අදාලව කාර්මික අපරාධ ග්‍රහණ සම්බන්ධව සුරාබදු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ග්‍රහණ කිරීම් තොරතුරු අනුව 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැටලීම් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වීමක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.
<table>
<tr><th>වර්ෂය</th><th>වැටලීම් සංඛ්‍යාව</th><th>ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වීම</th><th>අඩු වීමේ ප්‍රතිශතය</th></tr>
<tr><td>2016</td><td>4593</td><td>339</td><td>-</td></tr>
<tr><td>2017</td><td>4315</td><td>278</td><td>6</td></tr>
<tr><td>2018</td><td>3684</td><td>631</td><td>14</td></tr>
<tr><td>2019</td><td>3623</td><td>61</td><td>1.6</td></tr>
<tr><td>2020</td><td>2747</td><td>876</td><td>24</td></tr>
</table></td><td>බලපත්‍රලත් ස්ථාන පිළිබඳ අඛණ්ඩව විධිමත් පරීක්ෂාවක් සිදු කළ යුතු බව</td><td>ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් වෙත චක්‍රලේඛන නිකුත් කර ඇත, මාසිකව ප්‍රගති වාර්තා කැඳවීම් කර ඇති බව.</td><td>තවදුරටත් නිසි ප්‍රගතියක් අත්පත් කර නොගත් සුරාබදු මධ්‍යස්ථාන ඇති අතර ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු සිදු වී නොමැත.</td></tr>
<tr><td>(ඊ)</td><td>1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය ක්‍රියාත්මක වී 2020 වර්ෂය වන විට වසර 26 ක් ඉක්මවා තිබුණද දෙපාර්තමේන්තුව විසින් තෑගි මුදල් ගෙවීමේදී විවිධ අක්‍රමිකතාවයන් සිදු වී තිබීම, සහ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයේ පුළුල් වීම, යනාදී කරුණු සැලකිල්ලට ගෙන අංක 818 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කිරීම සඳහා මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.</td><td>විධිමත් පරිදි සුරාබදු නිවේදනය සංශෝධන කළ යුතු බව</td><td>සුරාබදු නිවේදනය සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව.</td><td>මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැත.</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| (උ) | සුරාබදු ත්‍යාග මුදල් ගෙවීම්<br><br>අංක 818 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව තෑගි මුදල් ගෙවීම සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන සලසා තිබියදීත් එයට පටහැනිව 2020 මාර්තු 16 දින සිට රට තුල උද්ගත වූ කෝවිඩ් 19 වෛරස් ව්‍යාප්තියත් සමඟ කාර්යාලීය කටයුතු අක්‍රීය තත්ත්වයක තිබීම, මැයි සහ ජුනි මාසවල රාජකාරි සඳහා වාර්තා කිරීම තුනෙන් එකකට සීමා වී තිබීම මත සේවයට වාර්තා කිරීම සීමා වී තිබීම, අරමුදල් සඳහා සමථ ගාස්තු ලැබීම අවම මට්ටමක පැවතිම යනාදි කරුණු හේතුවෙන් සුරාබදු ත්‍යාග අරමුදල ගැටලු සහගත තත්ත්වයක් පවතිද්දි කාර්යසාධන ඇගැයීම් ක්‍රමවේදයකින් බැහැරව පැමිණීම සහ කාර්යසාධනය සියයට 100 ක් ලෙස දක්වමින් 2020 වර්ෂයේ මුල් අර්ධය සඳහා පරිපාලනය පිළිබඳ කාරක සභාව විසින් ත්‍යාග මුදල් ගෙවීමට අනුමත කර තිබුණි. | වර්තමානයේ පවත්නා විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු බව | -එම- | මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැත. ඒ අනුව 818 දරන සුරාබදු නිවේදනය මේ දක්වාත් සංශෝධනය වී නොමැත. එම අදාළ සුරාබදු නිවේදනය සංශෝධනයට යටත්ව අරමුදලේ පාලක මණ්ඩල කමිටු රැස්වීම් තීරණ මත පෙර පරිදි ත්‍යාග මුදල් ගෙවීම් සිදුකරමින් පවතී. |
| (ඌ) | ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ඇති ක්ෂය සංචිත අරමුදලට බැර කරනු ලබන අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ රු. 56,284,583 ක මුදලක් පැවතුනද එම අරමුදල් ඵලදායී කාර්යන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂය සංචිත අරමුදලේ ඵලදායි කාර්යයක් සඳහා යොදවා ගැනීමට කටයුතු කල යුතු බව | 2021 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමෙන් රුපියල් මිලියන 50 ක් අමාත්‍යාංශ අනුමැතිය මත වෙන්කර ඇති අතර පරිගණක උපාංග මිලට ගැනීමට සැලසුම් කර ඇණවුම් කර ඇති බව. | පරිගණක උපාංග ඇණවුම් කර ඇතත් මේ දක්වාත් ලැබී නොමැත. |
| (එ) | සුරාබදු තෑගි අරමුදලේ පරමාර්ථ ඉටුකිරීමට අදාලව නිලධාරීන්ගේ පුහුණු හා අධ්‍යයන කටයුතු, ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා, විශේෂ රාජකාරී හා විශේෂ වැටලීම් සහ ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යන කාර්යයන් සඳහා 2020 වර්ෂයේ අයවැය | අරමුදලේ පරමාර්ථ ඉටුකිරීමට අයවැය මගින් වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝජනය කල යුතු බව | 2019 වර්ෂයේ සැප්තැම්බර් මස සිදු කළ ග්‍රහණ සඳහා විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාශ නිලධාරීන් සඳහා | 2021 හා 2022 වර්ෂවල කාර්තුමය ප්‍රගති වාර්තා මේ දක්වාත් විගණනය ඉදිරිපත් කර |

| | | | |
|---|---|---|---|
| මගින් රු. මිලියන 39.7 ක් වෙන්කර තිබුණද එම කාර්යයන් සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | | රු. 400,000.00 ක තෑගි මුදල් 2021 වර්ෂයේදී ගෙවා ඇත. තවද 2021 වර්ෂයේ අයවැයෙන් මිලියන 15.25 ක් පුහුණු හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට වෙන්කර ක්‍රියාකාරී සැලස්මටද ඇතුලත් කර ඇති බව. | නොමැති අතර අරමුදලේ කටයුතු පිළිබඳ සමාලෝචනයට පාලක සභා රැස්වීම් පවත්වා නොමැත. |

21. විගණන අස්ථිතායේ නම - **සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - මතය වියාචනය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දිවයිනේ එක් ශාසනාරක්ෂක මණ්ඩලයකින් එක් ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක බැගින් තෝරාගෙන මාසයකට රු.500 බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.12,000 ක් ප්‍රදානය කිරීමේ අරමුණින් දහම් සිසු සවිය ශිෂ්‍යත්ව වැඩ සටහන 2018 වර්ෂයේදි ආරම්භ කර තිබුණි. 2019 වර්ෂයේදි ශාසනාරක්ෂක මණ්ඩල 288 කින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 262 ක් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් සපුරා තිබියදි ශිෂ්‍යත්ව ලබා දීම සඳහා සිසුන් 139 ක් පමණක් තෝරාගෙන ඉන් සිසුන් 20 කට මාස 10 ක ශිෂ්‍යත්ව ආධාර ලෙස රු.100,000 ක් පමණක් ගෙවා තිබුණි. තවද, බදුල්ල, පුත්තලම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්කවලට අයත් ශාසනාරක්ෂක මණ්ඩල 35 කින් මෙම ශිෂ්‍යත්ව සඳහා සිසුන් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තෝරා ගැනීම් සම්බන්ධයෙන් වන ගැටළු නිරාකරණය කරගනිමින් සුදුසුකම් ලත් සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කටයුතු විධිමත්ව කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | වර්තමානයේදි සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 79 පරිදි වර්ෂය තුල උපලබ්ධි වෙතැයි අපේක්ෂා නොකලත් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල උපලබ්ධි කිරීම පරිභෝජනය හෝ විකිණීම සඳහා තබාගෙන ඇති වත්කම් ජංගම වත්කම් ලෙස හෙළිදරව් කල යුතුයි. එසේ වුවද තොග පොත්වල සටහන් කර තිබූ, පිළිවෙලින් රු 179,500 ක හා රු 34,750 ක කොඩි හා ස්ටිකර් වටිනාකමද, තොග පොත්වල ඇතුළත් කර නොමැති රු.741,300 ක රෙදි කොඩි වටිනාකමද ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අදාල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු බව. | රු.179,500 ක්, රු.34,750 ක් සහ රු.741,300 ක් වූ පිළිවෙලින් ඉතිරි කොඩි ,ස්ටිකර් සහ මුද්‍රිත රෙදි කොඩි වටිනාකම පොත්වලට ගැනීමට සටහන් කර ගන්නා ලද බව. | වර්තමානයේදී වරද නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අංක බෞ/කො/වා/04/01/2019 හා 2019 අප්‍රේල් 03 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කොඩි අලෙවි කිරීමට අදාළ මුදල් රැස් කිරීම හා බැංකු ගත කිරීම පිළිබඳ සාරාංශ වාර්තා සකස් කළ යුතු වුවත් එලෙස වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ සාරාංශ වාර්තා සකස් කිරීම සිදුකළ යුතු බව. | ඉතිරි කොඩි අලෙවි කිරීමේදී පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කිරීමට සටහන් කරගන්නා ලද බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැත. |
| (ඈ) | 2017 වර්ෂය වන විට බුදුපුත් මා පිය සුරක්ෂා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු අයදුම්පත් 748 ක් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ සහිතව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත යොමුකර | බුදුපුත් සුරක්ෂා ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධයෙන් පසුවිපරම් කළ යුතු බව. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමට නොහැකි වීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණු බව. | 2021 වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ ස්වාමීන් වහන්සේලා 18 දෙනෙකුගේ දෙමාපියන් වෙත නිවාස සෑදීමට පළමු අදියර වශයෙන් රු.100,000 මුදල් ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණද, ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය සම්බන්ධව පසුවිපරම් කටයුතු කර නොතිබුණි. තවද 2018 වර්ෂය ආරම්භයේ සිට 2020 වර්ෂය අවසාන වන තෙක් අයදුම්පත් 50ක් ලැබී තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | |
| (ඉ) | 2012 වර්ෂයේදී රු.5,000,000 ක මූලික ප්‍රාග්ධනයක් සහිතව ආරම්භ කර තිබූ බුදුපුත් සුරක්ෂා උපහාර භාරය වර්ෂයෙන් වර්ෂය අරමුදලේ ප්‍රමාණය වර්ධනය වෙමින් පැවතියද භාරයේ අරමුණු ඉටුකර ගැනිමට අරමුදල යෙදවීමට ක්‍රියාකර නොතිබුණි. | අරමුදලේ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු බව. | රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් අරමුදලේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වූ අතර ඒ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව. | එම වර්ෂයට අදාල පොලී මුදල, ජංගම ගිණුමට ලබා ගන්නා ලදි. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුව තිබුණද, මේ දක්වා අමාත්‍යාංශය විසින් වත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතු බව. | අදහස් දක්වා නොතිබුණු බව. | විගණනයක් ක්‍රියාත්මක කර නැත. |

22. විගණන අස්තිත්වයේ නම - **හිමිකම් රක්ෂණ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2009 අගෝස්තු 24 දිනැති අංක 1616/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) 11 හා 12 නියෝග ප්‍රකාරව වාර්ෂික පරිපාලන වාර්තාව සමඟ විගණන වාර්තාව ප්‍රකාශයට පත්කළ යුතු නමුත් ආරම්භයේ සිටම පරිපාලන වාර්තාව පිළියෙල කර නොතිබුණි. | හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) 11 හා 12 නියෝග ප්‍රකාරව වාර්ෂික පරිපාලන වාර්තාව සමඟ විගණන වාර්තාව ප්‍රකාශයට පත්කළ යුතු බව. | 2021 වර්ෂයේ සිට හිමිකම් රක්ෂණ අරමුදලේ නියෝග අංක 11 හා 12 ප්‍රකාරව නියමිත පරිදි විගණන වාර්තාව හා පරිපාලන වාර්තාව දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | මේ දක්වා විගණන වාර්තාව හා පරිපාලන වාර්තාව දෙපාර්තමේන්තු කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ප්‍රකාශයට පත් කර නැත. |
| (ආ) | ඉකුත් වර්ෂය හා සැසඳීමේදී බැංකු ප්‍රකාශනවල ඇතුළත් හඳුනා නොගත් ආදායම රු. 3,355,634 ක සිට රු. 22,748,177 ක් දක්වා වැඩි වී තිබූ අතර අතර, ආදායම් වාර්තා ලබා නොගත් හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාල සංඛ්‍යාව 09 ක සිට 19 ක් දක්වා වැඩි වී තිබුණි. එම හේතුවෙන් හිමිකම් ආදායමින් සියයට 40 ක් වශයෙන් හිමිකම් රක්ෂණ අරමුදලට මාරු | ආදායම් වාර්තා ලබාගෙන බැංකුගත කළ ආදායම නිවැරදිව සනාථ කරගත යුතු බව. | 2018,2019,2020 වර්ෂයේහිදී ද මෙම තත්වය ඇත.දැනට පරිගණක පද්ධතියක් හඳුන්වා දෙමින් පවතින බව. | පද්ධතියේ අවසාන අදියර වන වාර්තා ලබා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කළ රු. 19,168,081 ක හිමිකම් ආදායමෙහි නිවැරදිතාවය තහවුරු නොවූණි. | | | |
| (ඇ) | 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරිමේ පනත යටතේ ඉඩම් වල අයිතිය ලියාපදිංචි කිරීමේදී ඒ සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනිම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභය සඳහා රජය විසින් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ආවරණය කිරීමේ අරමුණ ඇතිව මෙම අරමුදල පිහිටුවා තිබුණද , අරමුදලේ 2020 ක්‍රියාකාරී සැලැස්ම තුල එම කාර්යය ඉටු කිරිම පිළිබඳ කිසිඳු ඉලක්කගත කාර්යයක් ඇතුලත් කර නොතිබුණි. එසේම හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා 2020 වර්ෂය අවසානයට වසර 10ක් ඉක්මවුවද මෙම කාලය තුල කිසිඳු හානිපුරණ වන්දියක් ගෙවීම් කර නොතිබුණු අතර 2020 වර්ෂයේ අවසානය දක්වා මෙහෙයුම් වියදම් වලින් පසුව ලැබු මුළු ආදායම ආයෝජනය කිරීම පමණක් සිදු කර තිබුණි. | අරමුදලේ කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කළ යුතු බව. | බිම් සවිය වැඩසටහන යටතේ හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලට අදාලව සිදුකරනු ලබන ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද සහභාගි වන අතර එහි දී හිමිකම් රක්ෂණ අරමුදල පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. අංක 1616/23 හා 2009.08.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 9 වන වගන්තිය අනුව හිමිකම් රක්ෂණ අරමුදලේ මුදල්වලින් හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු බව ප්‍රකාශ කර ඇති බව. | විවිධ මාධ්‍ය ඔස්සේ හිමිකම් රක්ෂණ අරමුදල පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

23. විගණන අස්ථිතායේ නම - **මහනුවර ඇසළ පෙරහැර භාරය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය
2018 - තත්ත්වාගණනය කළ මතය
2019 - තත්ත්වාගණනය කළ මතය
2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ඇසළ පෙරහැර භාරයට අයත් මහා භාරකාර දෙපාර්තමේන්තුව භාරයේ පවතින රු.මිලියන 20 ක ස්ථාවර තැන්පතුව වෙනුවෙන් 2020 වර්ෂයට අදාළ පොලී ආදායම රු.1,704,139 ක් වුවත් රු.1,000,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පොළී ආදායම රු.704,139 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පොලී ප්‍රතිශතය අනුව පොලිය ගණනය කළ යුතු බව. | සම්පූර්ණ පොලී මුදලම ලබාදෙන ලෙස මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කලද පසුගිය වර්ෂ කීපයේදීම ලබා දී තිබුණේ රුපියල් 1,000,000 බැගිනි.මේ සම්බන්ධයෙන් මහාභාරකාර දෙපාර්තමේන්තුව අනුගමනය කරන ක්‍රමවේදය මේ වන විට භාරය දැනුවත් කර ඇති බැවින් 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මේ පිළිබඳ අවධානය යොමු කරන බව. | 2021 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මේ පිළිබඳව අවධානය යොමුකිරීමට භාරය විසින් කටයුතු කරන බව දක්වා ඇත. මේ දක්වා නිවැරදි වී නොමැත. |
| (ආ) | ඇසළ පෙරහැර භාරයේ ආරක්ෂක භාරකරු ලෙස මහා භාරකාර දෙපාර්තමේන්තුව පෙරහැර පැවැත්වීම සඳහා භාරය වෙත වසර ගණනක සිට මුදල් ලබා දී තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙරහැර භාරයෙන් අයවිය යුතු ශේෂයක් | ඇසළ පෙරහැර භාරයේ භාරකරු මහා භාරකාර දෙපාර්තමේන්තුව බැවින් ගෙවිය යුතු මුදලක් පවතින්නේද යන්න තහවුරු කරගත යුතු බව. | විගණනයෙන් පෙන්වා දීමෙන් අනතුරුව මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් මේ පිළිබඳව විමසීමේදී භාරය දැනුවත් කර ඇත.ඒ අනුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | මේවන විට ඒ පිළිබඳව භාරය දැනුවත් කර ඇති අතර 2021 ගිණුම් සකස්කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. නමුත් මේ වන තෙක් නිවැරදි වී නොමැත. |

ලෙස රු.17,287,452 ක් මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ගිණුම් තුළ ඇතුළත් කර තිබුණද ඇසළ පෙරහැර භාරය විසින් එම මුදල ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

24. විගණන අස්ථිත්‍යයේ නම - **රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය

2018 - තත්වාගණනය කළ මතය

2019 - තත්වාගණනය කළ මතය

2020 - තත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 54 ඡේදය ප්‍රකාරව පෙර කාලපරිච්ඡේද වැරදි නිවැරදි කරන්නේ නම් එම වරදෙහි ස්වභාවය ආදී කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා ඇති රු.8,687,637 ක වැරදි නිවැරදි කිරීමේ සටහනට අදාලව ප්‍රමිතිය ප්‍රකාරව හෙළිදරව් කිරීම සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතු බව. | වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරද නිවැරදි කර නොතිබුණි. |
| (ආ) | 2019 වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම ඉක්ම වූ ආදායම රු.105,045,877 ක් ලෙස දක්වා තිබුණද, මෙය වියදම් ඉක්ම වූ ආදායමක් නොවන බවත් තවදුරටත් ත්‍යාග අරමුදලේ උප අරමුදල් සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් ඇති වූ ශේෂයක් බවත් නිරීක්ෂණය වේ. | වර්ෂය තුළදී ලැබෙන සියළුම මුදල් නිසි පරිදි ගිණුම්ගත කිරීම හා ත්‍යාග මුදල් ලැබීමට නියමිත නිලධාරීන්ට හා උප අරමුදල්වලින් දරනු ලබන ගෙවීම් සිදු කර අරමුදලේ ශුද්ධ ශේෂය නිවැරදිව පෙන්විය යුතු බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේදීත් මූල්‍ය ප්‍රකාශන එලෙසම ඉදිරිපත් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය - ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද,1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 22 ක් තුළ ත්‍යාග මුදල් ලෙස නිලධාරීන් සඳහා රු.16,520,215,868 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.1,997,381,541 ක් ද බෙදා හැර තිබුණි. | අරමුදල් බෙදා හැරීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විධිමත් අනුමැතියක් ලබානොගෙන ත්‍යාග මුදල් ගෙවීම තවදුරටත් එලෙසම සිදු කෙරේ. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට අයවීම හිඟව පැවතුණ නමුත් ගිණුම්ගත නොකරන ලද රු. 2,051,340,784 ක දණ්ඩන ආදායම තුළ වසර 1 ත් 5 ත් අතර රු. 561,540,349 ක් සහ වසර 05 වැඩි රු.182,762,354 ක මුදලක් ඇතුළත් විය. | විධිමත් පරිදි හිඟ දණ්ඩන ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. | වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |
| | අංක CINT/HQB018/2013 දරණ රේගු විමර්ශනයට අදාල ගොනුව රු.1,955,942 ක් ගෙවූ පසුව රු.2,212,586 ක මුදලක් ශේෂව තිබියදී අස්ථානගත වී තිබුණි. තවද, අංක ENSP/CASE/2009/09 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අස්ථානගත වීම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට වාර්තා කර නැත. | මේ දක්වා නිවැරදි කිරීමට පියවර ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දරණ රේගු විමර්ශනයට අදාලව හිඟ දණ්ඩන ලෙස 2020 වර්ෂය වන විට රු.350,000 ක ශේෂයක් පැවතියද, මෙම ගොනුවද අස්ථානගත වී තිබුණි. මෙම ගොනු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හා 104(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී සාමාන්‍ය ක්‍රමයට ආනයනයන් මත රජයට ලැබිය යුතු අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර ගැනීම පිළිබඳ නොසලකා එම අහිමි වූ ආදායමද ඇතුළත් වන පරිදි රේගු වැරදි සම්බන්ධයෙන් දඩ පැනවීමත් එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට යෝජනා වීම තුළින් රජයට ලැබිය යුතුව තිබූ ආදායම අඩු වීමත්, නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය වැඩි වීමත් නිරීක්ෂණය විය. | රේගු ආඥා පනත මේ වන විට වසර 151 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන හා අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් එය සංශෝධනය කළ යුතු වීම හා රේගු බදු වංචා සිදුවිය හැකි වැරදි පිළිබඳ අත්දැකීම් පදනම් කරගෙන රේගු ආඥා පනත සංශෝධනය කල යුතු බව. | වැලැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත. | ත්‍යාග බෙදාහැරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම හා රේගු ආඥා පනත සංශෝධනය සඳහා පියවර ගෙන නොතිබුණි. |

25. විගණන අස්ථිතායේ නම - **රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ දී හිඟ දණ්ඩන ආදායමට අදාල ලිපිගොනු 127 ක ප්‍රමාණයෙන් එක් ලිපිගොනුවක් රේගු පරිශ්‍රය තුළ අස්ථානගත වීම. | රේගු පරිශ්‍රය තුළ ලිපිගොනු අස්ථාගත නොවීම සඳහා අවශ්‍ය පාලන ක්‍රමවේදය සකස් කළ යුතු බව. | වැළැක්වීමට නිසි පාලන ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ වන විටද ලිපිගොනුව ඉදිරිපත් කර නැත. |
| (ආ) | 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සමුච්චිත වෙමින් පවතින හිඟ හිටි දණ්ඩන ආදායම රු.1,031,961,201 ක් 2020 දෙසැම්බර් 31 දිනට අය නොවී පැවතුණි. | හිඟ දණ්ඩන ආදායම රැස් කිරීම සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව. | වැළැක්වීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ වන විටත් හිඟ දඩ මුදල් අයකිරීම මන්දගාමීව සිදුවේ. |
| (ඇ) | රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන්, නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් විදේශ පුහුණුවීම් වලට අදාලව 2020 වර්ෂයේදී රු.1,125,496 ක් වැය කර තිබූ අතර එම විදේශීය වැඩමුළු පැවැත්වූ කාලසීමාව තුල එම නිලධාරීන් විසින් අතිකාල මුදල් ලෙස රු.8,333 ක් ලබා ගෙන තිබුණි. | අතිකාල ගෙවීම මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කළ යුතු බව. | පැහැදිලි කිරීම කර ඇත. | අතිකාල ගෙවීම් ක්‍රියාවලියේ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා වූ නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැළසුම් නොකිරීම හේතුවෙන් වාර්ෂිකව එකතු වන මුදල් මගින් අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වේ. ඒ අනුව 2020 වර්ෂයේ ආදායමින් සියයට 90 ක්ම අරමුදල තුල සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය. | රේගු ආඥා පනත මේ වන විට වසර 151 ක් පමණ පැරණි වන අතර එය වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කළ යුතු බව. | වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | පනතේ සංශෝධනයන් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඉ) | රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යෑමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් සිදු වී තිබුණ ද රජයේ බදු ආදායම නියමිත පරිදි අයවීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | මුල් අවස්ථාවේදී රේගු වැරදි අනාවරණය කර නොගැනීම හේතුවෙන් පසු අවස්ථාවකදී නැවත රේගු නිලධාරීන් විමර්ශනයක් සිදු කර ලබා ගන්නා දඩ හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් තුළින් සියයට 70 ක්ම ඒකාබද්ධ අරමුදලට නොඒම සම්බන්ධව සමාලෝචනයක් සිදු කර අවශ්‍ය පියවර ගත යුතු බව. | වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචනයක් සිදු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | අරමුදලේ අතීත ක්‍රියාකාරකම් සමාලෝචනය කර අරමුදල තුළ සමුච්චනය වන ශේෂයන් ඒකාබද්ද අරමුදලට ලබා ගැනීම සඳහා වූ සුදුසු ක්‍රමවේදයක් සැකසීම සඳහා | අතිරික්ත මුදල් පිළිබඳව භාණ්ඩාගාරයෙන් විමසා සුදුසු ක්‍රමවේදයක් සැකසිය යුතු බව. | වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | වගකිව යුතු පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය කරනු ලැබේ. | | | |
| (උ) | අරමුදලේ මූලික අරමුණු අතර එක් අරමුණක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරත වීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණද, ඉකුත් වර්ෂ 07 ක කාලපරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබීමෙන් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස් කිරීමක් සිදු වන බව නිරීක්ෂණය විය. | පනත සංශෝධනය කළ යුතුවීම හා රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම හා සේවක සුභසාධනය වර්ධනය කර ගැනීම සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බව. | වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | සේවක සුභ සාධනය සඳහා වර්තමාන තත්ත්වයට ගැලපෙන ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගෙන නොමැත. |

26. විගණන අස්ථිත්‍යයේ නම - **ගොවිජන සංවර්ධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 -අහිතකර මතය

2019 -අහිතකර මතය

2020 -තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | --------------------- | ----------------- | ----------------- | -------------------------------- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 259,321,334 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 259,973,482 ක් විය. ඒ අනුව රු. 652,148 ක වෙනස හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතු බව. | මීට අදාළ ලිපිලේඛන ඉතා පැරණි වීමත්, එම ලිපිලේඛන සොයා ගැනීමට පවතින දැඩි දුෂ්කරතාවය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන මගින් ගැලපීම් සිදු කිරීමට නොහැකි වී ඇති බව. | වෙනස හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 56(1) උප වගන්තිය ප්‍රකාරව යම් වර්ෂයක අක්කර බදු අය කිරීමේ කටයුතු එම වර්ෂයේම මාර්තු 31 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවත් එම කාර්යය ඉකුත් වර්ෂවලදී හා 2020 වර්ෂයේදී එසේ සිදු කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන අයකර ගත යුතු රු. 20,990,383 ක | පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර බදු අය කළ යුතු බව. | අක්කර බදු අය කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කළ නමුත් රට තුළ පැවති කොවිඩ් -19 තත්වය හමුවේ අක්කර බදු එකතු කිරීමේ කටයුතු වලට බාධා සිදු වී ඇත. අක්කර බදු අය කිරීම ක්‍රමවත් කිරීම සඳහා මාර්ගෝපදේශයක් 2023 වර්ෂය සඳහා හඳුන්වා දීමට කටයුතු කරමින් පවතින බව. | 2021 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු අක්කර බදු මුදල රු. 10,071,460 ක් විය. |

| | | | | |
|---|---|---|---|---|
| | අක්කර බදු මුදලක් තිබුණි. | | | |
| (ඇ) | 2020 වර්ෂය තුළ හා පසුගිය වර්ෂවලදී අරමුදලේ කර්තව්‍ය හා කාර්යයක් වූ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | පනතේ කර්තව්‍ය හා කාර්යයන් ඉටු කර ගැනීමට ක්‍රියා කළ යුතු බව. | 2022 වර්ෂයේ සිට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව. | 2022 වර්ෂයේ අයවැය ලේඛනයෙන් පර්යේෂණ කටයුතු සඳහා මුදල් වෙන්කර ඇත. |

27. විගණන අස්ථිත්‍යයේ නම - **මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11(1)(ආ) වගන්තිය ප්‍රකාරව මහපොළ භාර අරමුදල සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේදී සිදුකර තිබූ ආයෝජන ප්‍රතිශතයට අනුපාතික අතිරික්තය ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද 2018 වර්ෂයේ අතිරික්තයෙන් භාර අරමුදලට හිමි කොටස රු.1,093,798,978 ක් වුවද එය රු.189,198,591 ක් අඩුවෙන් රු. 904,600,387 ක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල ද දක්වා තිබුණි. | නිශ්චිත එකඟතාවයකට එළඹිය යුතු බව. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආදායමින් සියයට 50 ක් මහපොළ භාර අරමුදලට මාරු කිරීම සම්බන්ධයෙන් සංවර්ධන ලොතරැයි පනතේ විශේෂයෙන් සඳහන්කොට නොමැත. ශිෂ්‍යත්ව වටිනාකම අඩුකොට සියයට 50 ක් මහපොළ භාර අරමුදලට මාරු කිරීම සිදුකොට ඇත. මෙම තත්ත්වය පිළිබඳ ජනාධිපති අරමුදල සමඟ සාකච්ඡාකොට සම්පූර්ණ ලාභයෙන් සියයට 50 ක් ලබා ගැනීමට කටයුතු කොට ඇති අතර දැනට එම සියයට 50 මුදල මහපොළ භාර අරමුදලට මාරු කරනු ලබන අතර ලබා නොගත් ත්‍යාග මුදල්වල කොටස මහපොළ අරමුදලට මාරු කිරීම සිදු නොකරන බව. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබූ රු.904,600,387 න් රු.100,700,127 ක් පමණක් 2019 වර්ෂයේදී මුදලින් ලැබී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2012 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අතිරික්තයෙන් භාර අරමුදලට ලැබිය යුතුව තිබූ නමුත්, ජනාධිපති අරමුදල විසින් එවා නොතිබූ රු.835,766,892 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිශ්චිත එකඟතාවයකට පැමිණ මූලා‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් කළ යුතු බව. | 2012-2018 වර්ෂය දක්වා ජනාධිපති අරමුදල විසින් ද මෙම ලාභ කොටස මඟින් වෛද්‍යාධාර සඳහා මුදල් වැය කිරීම මත මෙලෙස දැක්වෙන ලද රු.මි.835.7 ක් නැවත මහපොළ භාර අරමුදලට බැර කිරීමට අපහසු බව. | ජනාධිපති අරමුදල විසින් වෛද්‍යාධාර සඳහා වැය කරන ලද රු. රු.මි.835.7 ක මුදල මහපොළ භාර අරමුදල වෙත මේ දක්වා ලැබී නොතිබුණි. |
| (ඇ) භාර අරමුදල් පනතේ 6.2(අ) (ඇ) (ඈ) වගන්ති අනුව මුදල් සපයා ගැනීම සඳහා දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන ,තෑගී හෝ පරිත්‍යාග භාර ගැනීමට හා ආණ්ඩුවේ අනුමැතිය ඇතිව ලොතරැයි පැවැත්වීමට බලය භාර අරමුදලට ලැබී තිබූ නමුත් එවැනි මූලාශ්‍ර මඟින් අරමුදල් සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් සම්පාදනය කර ගැනීමට කටයුතු කල යුතු බව. | මහපොළ භාර අරමුදලෙහි 6.2(අ),(ඇ),(ඈ) වගන්තිවලට අනුව මුදල් සපයා ගැනීම සඳහා නිරතුරුවම තෑගි සහ පරිත්‍යාග ලබා ගැනීමට කටයුතු කර ඇති බව හා ඒ වෙනුවෙන් 2021 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව. | |
| | | (i) මහපොළ අරමුදල සඳහා ප්‍රධාන කාර්යාලය පිහිටුවීමට ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් දානපතියෙකුගේ පරිත්‍යාගයක් වශයෙන් ලබා ගැනීමට පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණි. | පරිත්‍යාග කිරීමට කිසිදු දානපතියෙක් ඉදිරිපත් වී නොතිබුණු අතර ඒ අනුව ඉදිරියේදී පිහිටුවීමට යෝජිත විදේශ භාෂා විශ්ව විද්‍යාල විද්‍යායතනය කොළඹ පිහිටුවීමටත්, එමඟින් මහපොළ භාර අරමුදලට ඉඩ පහසුකම් ලබා ගැනීමටත් යෝජනා කොට ඇත. |

| | |
|---|---|
| (ii) 1982 සිට මේ දක්වා ශිෂ්‍යත්වලාභීන් තුන් ලක්ෂයක් (300,000) පමණ සිටින අතර ඔවුන්ගෙන් පරිත්‍යාග ලබා ගැනීමට සියළුම තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් සකස් කිරීමට මහජන බැංකුව සමඟ සාකච්ඡා කොට අවශ්‍ය කටයුතු සිදුකොට ඇත. | දත්ත පද්ධතියක් සකස්කිරීමට සුදුසු නිළධාරියෙක් පත් කිරීමට 2021 දෙසැම්බර් මස භාරකාර රැස්වීමේදී කටයුතු කළ අතර එම බඳවාගැනීමට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතී. |
| (iii) මහපොළ භාරකාර අරමුදල අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ලොතරැයි පැවැත්වීමට හැකියාව ඇති අතර 2013 වර්ෂයේදී ආරම්භ කරනු ලැබුවත් නීතිමය ක්‍රියාමාර්ග අවසන් වන තෙක් අත්හිටුවා ඇත. කෙසේ වෙතත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය යටතේ මහපොළ නමින් ඉලෙක්ට්‍රොනික ලොතරැයියක් ආරම්භ කිරීමටත් එහි ආදායම සෘජුවම මහපොළ අරමුදලට ලබා | මහපොළ භාර අරමුදල යටතේ නව මංගත ලොතරැයියක් ආරම්භ කිරීම සඳහා අමාත්‍යය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2021 දෙසැම්බර් වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී. | |
| (ඇ) | 2005 නොවැම්බර් 14 දින ඇතිකර ගත් ගිවිසුම අනුව 2015 මැයි 12 වන විට හිඟ හිටි බදු කුළිය රු.98,642,356 ක් ව තිබියදී 2015 මැයි 12 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සමඟ නව කල්බදු ගිවිසුමකට එළඹ තිබූ අතර , මුල් ගිවිසුමට අනුව 2015 වර්ෂයේ දී භාර අරමුදලට ලබාගත හැකිව තිබූ රු. 45,358,379ක බදු කුලිය රු. 20,000,000 දක්වා අඩු වී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයකින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් භාර අරමුදලට අවාසි සහගත වූ මෙවැනි ගිවිසුම්වලට එළඹීම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් සිදු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බව. | මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග වලට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට ඇති බව. | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ හිමිකාරීත්වය සහ කළමනාකරණ ව්‍යුහය 2015 මැයි 12 දිනට පෙර පැවති තත්වයේම පවත්වාගෙන යා යුතු බවට 2022 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණි. ඒ අනුව කටයුතු කිරීමේදී 2015 දී එළඹි ගිවිසුම අවලංගු වී 2005 ගිවිසුම බලාත්මක විය යුතුය. |
| (ඉ) | 2005 වර්ෂයේදී රු.12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම 2020 වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි. තවද භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු.1,064,520,695 ක් ලෙස | ඉඩම තක්සේරු කර පොත්වලට ගත යුතු බව. | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි පවතින පරිපාලන හා ගිවිසුම්වල අඩුපාඩු හා වත්කම් අවභාවිතය පිළිබඳව සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව 2021 ජනවාරි 08 දින පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව වෙත ඉදිරිපත් කොට එම කෝප් කමිටු වාර්තාව 2021 අප්‍රේල් | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ හිමිකාරීත්වය සහ කළමනාකරණ ව්‍යුහය 2015 මැයි 12 දිනට පෙර පැවති තත්වයේම පවත්වාගෙන යා යුතු බවට 2022 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මූලාශ්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | 06 දින පාර්ලිමේන්තුවේ සභාගත කොට ඇත. ඊට අමතරව රාජ්‍ය ආයතනවල දූෂණ හා වංචා සොයා බලා පරීක්ෂා කිරීම සඳහා 2018 දී පත්කල ජනාධිපති කොමිෂන් වාර්තාව ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇත. එය පාර්ලිමේන්තුවේ විවාද කිරීමට නියමිතය. ගරු විෂය භාර අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි ඉදිරි කටයුතු පිළිබඳ නිරීක්ෂණ 2021 අගෝස්තු 17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇති බව. | |
| (ඊ) | පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු.3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූලාශ්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2020 වර්ෂය වන විටත් ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සිදුවී ඇති බැවින් හා ණය හිමියන්ගේ බිල්පත් ඉදිරිපත් කොට නැති බැවින් ගෙවීම් කිරීමට නොහැකිවී ඇති බව. | 2021 දෙසැම්බර් වන විට විටත් ණය හිමියන් තහවුරු කර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

28. විගණන අස්තිත්‍යයේ නම - **චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාභාරය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි ඡේද අංක 08 හා 56 අනුව භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ගිණුම්ගත කිරීමේදී 2020 දෙසැම්බර් 31 දිනට කල් පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා සමාන ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 ක කාලයක් තුළදී කල් පිරීමට නියමිත එකතු වටිනාකම රු.5,860,049 ක් වූ භාණ්ඩාගාර බිල්පත්‍ර 03 ක් සහ ත්‍රෛයි මාසික ස්ථාවර තැන්පතුවක වටිනාකම වූ රු.1,000,000 ක් මුදල් හා මුදල් සමාන ද්‍රවශීල වත්කම් ලෙස සටහන් කර නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව ක්‍රියා කළ යුතු බව. | 2021 වසරේ ගිණුම් ප්‍රකාශන මේ අනුව සකස් කරන බව. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අරමුදල් ගිණුම් 02 ක එකතුව රු.1,462,778 ක වටිනාකම භාවිතා කර ඉටුකළ යුතු අරමුණු හා කාර්යයන් සම්බන්ධ ලිඛිත තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | අරමුදල් පිහිටුවීමට අදාළ අරමුණු පිළිබඳව සොයා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු බව. | ඉදිරියේදී භාරකාර මණ්ඩලය වෙත භාරකාර මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට කටයුතු කරන බව. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරය පනත | | | |
| (i) 5 (1) වගන්තිය ප්‍රකාරව චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයන්ට ආධාර වන පරිදි සැලසුම් කරන ලද සුභසාධන අරමුදල්, ඉතිරිකිරීමේ අරමුදල්, ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවා නොතිබුණි. | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතු බව. | ඉදිරියේදී භාරකාර මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අනුව කටයුතු කරන බව. | පනතේ සඳහන් වගන්තිය ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි. |
| (ii) 5 (2) (අ) වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට ණය, දීමනා, නිවාස පහසුකම් හෝ වෙනත් සමාන | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතු බව. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභ ලබාදීමට අවධානය යොමු කර නොතිබුණි. | | | |
| (iii) | 5 (2) (ආ) වගන්තිය ප්‍රකාරව යම් කායික හෝ මානසික දුබලතාවයකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටින සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට යම් මුදල් ආධාරයක් පිරිනැමීමට ක්‍රියා කර නොතිබුණි. | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතු බව. | -එම- | -එම- |
| (iv) | 6 (2) (අ) වගන්තිය ප්‍රකාරව අරමුදල් උපයා ගැනීමට සුදුසු වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතු බව. | ඉදිරියේදී භාරකාර මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අනුව කටයුතු කරන බව. | පනතේ සඳහන් වගන්තිය ප්‍රකාරව ක්‍රියා කර නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1ඡේදය මඟින් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව සංස්ථාභාරයේ 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | 2022 වර්ෂය සිට සකස් කරන බව. | 2022 දී නිවැරදි කරන බව දන්වා තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාභාරයේ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 ජනවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරියේ දි ඒ අනුව කටයුතු කරනු ලබන බව. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 245 සහ 257 ප්‍රකාරව 2020 වර්ෂය තුළදී ගෙවීම් වවුචර් පත්‍ර 10 ක් භාවිතා කර එකතුව රු.1,644,200 ක් වියදම් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | සෘජුවම අය කරගනු ලැබූ බැංකු ගාස්තු සම්බන්ධයෙන් වූ වවුචර් පත් 8ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. ඉතිරි වවුචර් 2 සහතික කර තිබූ අතර කොවිඩ් වසංගතය හේතුවෙන් සංස්ථාව වසා තිබූ සමයේ මිනිට් සටහන අනුමත කර | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව දන්වා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වවුචරයේ අත්සන යෙදීමට අමතකව ඇත. ඉදිරියේදී නිවැරදිව සටහන් කරනු ලබන බව. | |
| (ඊ) | චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, ඉතිරි කිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් පිරිනැමීම වැනි සංස්ථා භාරයේ ප්‍රධාන අරමුණු සඳහා මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | භාරයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය සම්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. | මූල්‍ය සම්පාදනය කර ගත යුතු අතර, ඒ කෙරෙහි භාරකාර මණ්ඩලයෙහි අවධානය යොමු කරවනු ලබන බව. | ඉදිරියේදී භාරකාර මණ්ඩලයේ අවධානය යොමු කරවනු ලබන බව. |
| (උ) | චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා විශ්‍රාම වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 5,643,000 ක් ප්‍රදානය කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වනවිටත් භාරයේ කටයුතු සඳහා භාරකාර මණ්ඩලයක් පත් නොකිරීම නිසා ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම, සකසුරුවම් සමිති ඇතිකිරීම, ණය ලබාදීම, නිවාස පහසුකම් ලබාදීමට අවධානය යොමු වී නොතිබුණි. | ප්‍රතිලාභීන් වෙනුවෙන් ඉතිරිකිරීමේ අරමුදල් පිහිටුවීම සැකසුරුවම් සමිති ඇති කිරීම, ණය ලබාදීම, හා නිවාස පහසුකම් ලබාදීම කෙරෙහි අවධානය යොමු විය යුතු බව. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | භාරයේ රීතී මාලා අංක 3.3.5 අනුව වෙනත් ආකාරයකින් විශ්‍රාම ප්‍රතිලාභයක්, අර්ථ සාධක මුදලක් හෝ සහනාධාරයක් ලබයි නම් විශ්‍රාම ප්‍රතිලාභ ලැබීමට නුසුදුසු වුවත් භාරය විසින් විශ්‍රාම ප්‍රතිලාභ ගෙවනු ලබන කලාකරුවන් සම්බන්ධයෙන් මෙතෙක් එම රීතිය ප්‍රකාරව පරීක්ෂාවකට ලක්කර හෝ තොරතුරු රැස්කිරීමක් කර නොතිබුණි. | ප්‍රතිලාභ ලැබීමට සුදුසු ප්‍රතිලාභීන් හඳුනාගත යුතු බව. | නව විශ්‍රාම වැටුප් ලාභීන් තෝරා ගැනීමේදී ඒ අනුව කටයුතු කරනු ලබන බව. | ඉදිරියේදී භාරයේ රීති මාලාව අනුව කටයුතු කරන බව. |

29. විගණන අස්ථිත්‍යයේ නම - **ත්‍යාග හා දිරිදීමනා අරමුදල (මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව)**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය කළ මතය

2019- තත්ත්වාගණනය කළ මතය

2020- මතය ව්‍යාවනය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින එකතුව රු.38,335,003ක මුදලක් භාණ්ඩාගාරවල ආයෝජනය කර තිබුණි. තවද ඉතුරුම් තැන්පතු ගිණුමේ මාසිකව රු.මිලියන 22ක සිට රු.මිලියන 58 දක්වා පරාසයක අතිරික්ත ශේෂයක් ද පැවතුණු අතර එම ශේෂය සුදුසු පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | අංක PF/423 හා 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි අතිරික්ත මුදලක් වේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැරකිරීමට ඇති හැකියාව පිළිබඳ සොයාබලා කටයුතු කළ යුතු බව. | 203 වැනි අධිකාරිය වූ මෝටර් වාහන පනතේ 2011 අංක 04 දරන මෝටර් රථ ප්‍රවාහන නියෝග මාලාවේ 03 (2) නියෝගය පරිදි අරමුදලේ වාර්ෂික ආදායමෙන් සියයට 05ක සමාන අතිරික්ත මුදලක් අරමුදලේ රඳවා තබනු ලැබූ බව වාර්තා කිරීම හැර වෙනත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. | ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරිදීමනා අරමුදල) නියෝග මාලාවේ 03 (1) නියෝගය පරිදි ත්‍යාග හා දිරිදීමනා සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් 04ක් දක්වා තිබුණි. එහෙත්, අරමුදල ආරම්භයේ සිටම ත්‍යාග සඳහා පැවති ක්‍රියාකාරකම් 03 වෙනුවෙන් ගෙවීම් සිදුකර නොතිබුණු අතර, අරමුදලට ලද ආදායම දිරිදීමනා ලෙස කාර්ය | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ උපදෙස් පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරුන් සහකාර කොමසාරිස් (කාර්මික) හා නීති නිලධාරින්ගෙන් සැදුම්ලත් විශේෂ ඇගයීම් කමිටුවක් | කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය අතර බෙදාහැර තිබුණි. එම ක්‍රියාකාරකම් සඳහා ත්‍යාග ගෙවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම්, සාවද්‍ය ලෙස සිදු කරන වාහන සකස් කිරීම්, වාහනවලට සිදුකරන වෙනස්කම් ආදී දෑ අවම කර ගැනීමේ හැකියාවක් පැවතුණි. | | 2021.10.26 දින පත් කළ බව. | |
| (ඇ) | ත්‍යාග හා විශේෂ ඇගයීම් වෙනුවෙන් මෝටර් රථ (අධිහාර) රෙගුලාසි කෙටුම්පත් කර 2017 මැයි 02 දින නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් එවා තිබුණි. එහෙත්, මෝටර් වාහන පනත ප්‍රකාරව එලෙස නියෝග සකස්කර අධිහාර පැනවීම එම පනතේම තවත් වගන්ති කිහිපයක ප්‍රතිපාදනවලට පරස්පර වීම නිසා අදාළ නියෝග සකස්කර අධිහාර පැනවීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳ වැඩි අවධානයක් යොමු කර කටයුතු කළ යුතු බව | -එම- | නියෝග සකස් කර අධිහාර පැනවීමට ක්‍රියාකර නොතිබුණි. |

30. විගණන අස්ථිතායේ නම - **ගොවීන්ගේ භාරකාර අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අරමුදල විසින් පත්කරන ලද සමීක්ෂණ මණ්ඩලය මගින් 2018 වර්ෂයේ ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තාව අනුව රු.7,241,656 ක් වූ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය අයවිය යුතු ණය ශේෂයක් ලෙස වෙනස්විය යුතු බව පෙන්වා තිබුණි. | ශේෂය සනාථ කර ගෙන ගිණුම් තැබීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | නිවැරදි කිරීම් සිදුකර නොමැත. | ඉතිරි කිරීමේ ගිණුම් ශේෂයක් ලෙස තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. |
| (ආ) | ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේ භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු ඉටු කිරීම සඳහා මෙන්ම සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය සඳහා අරමුදල ආරම්භ වුවද එම අරමුණු සඳහා අරමුදල් ප්‍රමාණවත් ලෙස නොයොදා 2019 වර්ෂයේදී රු.755,001,919 ක් ස්ථාවර තැම්පතුවලද රු.93,513,941 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර පොලී ආදායම ලෙස රු.131,781,727 ක් උපයා තිබුණි. | භාරකාර ඔප්පුවේ සඳහන් අරමුණු සහ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් මුදල් යෙදවීම සිදුකළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත | 2020 වර්ෂයේ දී ද සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට ඇති මුදල් ස්ථාවර තැන්පතුවල යොදවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කාබනික රෙඩ්ලේඩි පැපොල් වගාව සඳහා මොරගොල්ලාගම ගොවි මහතෙකු වෙත හා රු. 1,000,000 ක මුදලක් ඇප සුරකුම් ලබා ගැනීමකින් තොරව හා ක්ෂේත්‍ර චාරිකා වාර්තාවල ප්‍රගතියක් නොමැති බව වාර්තා කර තිබියදීත් 2015 හා 2016 වර්ෂයන් වලදි නිදහස් කර තිබුණි. 2019 දෙසැම්බර් මස වන විටත් ණය වාරික අය කර ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණු අතර ගොවි බැංකුව විසින් රඳවා ගෙන තිබුණු රු.150,000 ක තැම්පතුව පමණක් අරමුදල වෙත ගෙන්වා ගෙන තිබුණි. | ණය වාරික අය කර ගැනීමට පියවරගත යුතු බව. | ණය අයකර ගැනීම සඳහා ගොවි බැංකුව වෙත දැනුවත් කිරීම් කර ඇත. | ගොවි බැංකුව විසින් රඳවාගෙන තිබූ රු.150 000 ක මුදල පමණක් 2020 වර්ෂයේදී ආපසු එවා තිබුණි. |
| (ඈ) | අර්තාපල් බෝග වගාව සඳහා නුවර එළිය දිස්ත්‍රික්කයේ පිහිටි වලපන ග්‍රාමයේ ව්‍යාපෘතියක් වෙනුවෙන් මාස 24 ක් ඇතුළත පියවීමේ පොරොන්දුව මත 2017 වර්ෂයේදී රු.1,000,000 ක මුදලක් අනුමත කර ඉන් රු.500,000 ක මුදලක් අදාළ ව්‍යාපෘති හිමියා වෙත නිදහස් කර තිබුණි. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ කාර්යසාධන වාර්තාව මගින් මෙම ව්‍යාපෘති කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කර නොමැති බව දක්වා තිබීම හේතුවෙන් ඉතිරි මුදල නිදහස් කර නොතිබුණි. එසේ වුවද ලබාදුන් | ණය වාරික අය කර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2020 වර්ෂය දක්වාම ණය මුදල හා පොලිය අයකර ගැනීමට අරමුදල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.500,000 ක ණය මුදල හා පොලිය අයකර ගැනීමට අරමුදල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 150 ඡේදය ප්‍රකාරව ආස්ථිත්වයේ නෛතික ස්වාභාවය, මෙහෙයුම්වල ස්වභාවය සහ එහි ප්‍රධාන කටයුතුවල විස්තරයක්, අස්ථිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාළ වන භාරකාර ඔප්පුව පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. |
| (ඊ) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, ස්ථාවර තැන්පතු තුනකට අදාළ 2019 වර්ෂයේ ආයෝජන පොලී ආදායම රු 7,794,456 ක් 2020 වර්ෂයේ ආදායම ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වර්ෂයට අදාළ ගනුදෙනු හඳුනාගෙන නිවැරදිව ගිණුම් ගත කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2019 වර්ෂයේ සිටම ආයෝජන පොලී ආදායම නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. |
| (උ) | අරමුදලින්, ගොවි බැංකු ආරම්භ කිරීම සඳහා ලබාදී ඇති ණය මුදලේ ආරම්භක ශේෂය රු. 190,313,579 ක් විය. එසේ වුවද 2020 වර්ෂයේ පොලී ගණනය කිරීමේදී එය රු.181,200,000 ක් ලෙස සලකා ගණනය කිරීම හේතුවෙන් ණය පොලිය රු. 91,125 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය වර්ෂයට අදාළ ගනුදෙනු නිවැරදිව හඳුනාගත යුතු බව. | ඉදිරියේදී නිවැරදි කිරීමට කළමනාකරණය එකගවී ඇත. | නිවැරදි කිරීම් කර නොතිබුණි. |
| (ඌ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2018 වර්ෂයේ සිට භාණ්ඩාගාර පොත් හා |

| | | | | |
|---|---|---|---|---|
| | සටහන් අනුව ගොවිසෙත ලොතරැයි ආදායම රු.4,710,479,333 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එය රු.4,688,745,587 ක් වූයෙන් රු.21,733,746 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය. | කළ යුතු බව. | | අරමුදලෙහි පොත්පත් වල ශේෂය ගැලපීම් කර නොතිබුණි. |
| (එ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.7,923,175 ක් වූ ණයගැති පාලන ගිණුම් ශේෂය සම්බන්ධයෙන්, ශේෂය සනාථ කිරීමේ ලිපි හා ණයගැති කාල විශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. | විගණන සාක්ෂි ඉදිරිපත් කර නොමැත. | 2018 වර්ෂයේ සිට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නැත. |
| (ඒ) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 1,467,176 ක් වූ නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් (ඌව) වෙතින් ලැබිය යුතු ලෙස පවතින ණයගැති ශේෂය සම්බන්ධයෙන් ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | විගණන සාක්ෂි ඉදිරිපත් කර නොමැත. | -එම- |
| (ක) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 697,644 ක් වූ ගොවීන්ගේ තැන්පතු සඳහා විස්තරාත්මක තැන්පතු ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | ක්‍රියාමාර්ග ගෙන නැත. | -එම- |
| (ග) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන | -එම- | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 591,965 ක් වූ කොටස් ගිණුමෙහි කොටස්කරුවන්ගේ නාම ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ච) | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.159,399,408 ක් වූ ගොවිසෙත අරමුදල් ශේෂය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය සනාථ කර ගත යුතු බව. | -එම- | -එම- |
| (ජ) | දිස්ත්‍රික් කාර්යාල සහ ගොවි සමාගම් වෙත ලබාදී ඇති කෙටිකාලීන ණය ශේෂ අතර 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 ක සිට වර්ෂ 20 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබූ රු.27,502,498 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට ඵලදායි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කිරීම් කර නොතිබුණි. |
| (ට) | පොළොන්නරුව දිස්ත්‍රික්කය පුරා විහිදී ඇති කුඹුරු අක්කර 3000ක් Global Gap සහතිකකරණ ක්‍රමවේදයට අනුව 2018/2019 වගා කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතකරණය ක්‍රමවේද පිළිබඳ ගොවි ජනතාව දැනුවත් කිරීමේ හා පරිසර හිතකාමී තිරසර කෘෂිකාර්මික ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ආර්ථික වාසි අත්පත් කර ගැනීම අරමුණු කර ගෙන පිහිට වූ රන් ගෙවිලිය සමාජ | ගෙවිලියන් වෙත GAP සහතික ලබා දිය යුතු අතර ණය මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | GAP සහතිකය ලබා දීම හෝ ණයමුදල ආපසු අය කර ගැනීම සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රුපියල් මිලියන 5.9 ක පොලී රහිත ණයක් ලබා දී තිබුණි. ව්‍යාපෘති කාල රාමුව අනුව 2019 මාර්තු මස වන විට ගෙවිලියන් ගේ වී නිෂ්පාදනය වෙනුවෙන් GAP (Good Agriculture Practice) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කළද 2020 ජූනි වන විටත් එකදු ගෙවිලියක් හෝ අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණු අතර අරමුදල ලබා දුන් ණය මුදලද මෙතෙක් අය වී නොතිබුණි. | | | |
| (ඩ) | “ප්‍රයිම් හර්බ් ලංකා” නැමැති පුද්ගලික සමාගම වෙත 2003 වසරේදී ලබාදී ඇති රු. 3,500,000 ක ණය මුදලින් රු.860,000 ක් තව දුරටත් අයවීමට පැවතුණි. මෙම සමාගම ව්‍යාපාරික කටයුතු නවතා ඇති බව හා ණය මුදල ලබා ගත් පුද්ගලයා මිය ගොස් ඇති බව අරමුදල වෙත දැනුම් දී ඇත. එබැවින් තව දුරටත් ණය ගෙවිමේ හැකියාව පිළිබඳව සාධාරණ පරික්ෂාවක් සිදු කර අයකර ගැනීම හෝ ඉදිරි නීතිමය පියවර ගැනිම සම්බන්ධයෙන් කිසිදු පියවරක් 2020 දෙසැම්බර් 31 දින තෙක් අරමුදල විසින් ගෙන නොතිබුණි. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | මෙම සමාගම ව්‍යාපාරික කටයුතු නවතා ඇති බව හා ණය මුදල ලබා ගත් පුද්ගලයා මිය ගොස් ඇති බව අරමුදල වෙත දැනුම් දී ඇති බව. | අයකර ගැනීම හෝ ඉදිරි නීතිමය පියවර ගැනිම සම්බන්ධයෙන් කිසිදු පියවරක් මේ වන තෙක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ණ) | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී එම අරමුදල් දෙකෙහි පැවති හර හා බැර ණය ශේෂයන් ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරා දෙන ලදී. එහිදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.1.490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු පත් කර තිබූ නමුත්, 2020 වර්ෂය අවසාන වන විටත් අයකර නොගත් කෙටි කාලින ණය මුදල රු.39,967,891 ක් විය. | ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | 2014 වර්ෂයේදී දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින්ගෙන් යුතු කමිටුවක් පත් කර ඇති බව. | නිවැරදි කිරීම් කර නොතිබුණි. |
| (ත) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ආ) ඡේදය ප්‍රකාරව 2020 වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | නිවැරදි කිරීම් කර නොතිබුණි. |
| (ද) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මු.රෙ. 877(2)(අ) ඡේදය ප්‍රකාරව පනතක් නොමැති ව්‍යවස්ථාපිත හා භාර අරමුදල් සඳහා චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. එසේ වුවද සකස් කර | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කෙටුම්පතට මුදල් අමාත්‍යවරයාගේ අදහස් දැක්වීම් සමග නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බව. | කරුණු සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කර තිබුණු නමුත් අමාත්‍ය මණ්ඩලයෙහි සාකච්ඡාවට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පතට මුදල් අමාත්‍යවරයාගේ අදහස් දැක්වීම් සමග නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස 2016 ඔක්තොම්බර් 19 දිනැති අංක අමප/16/1866/728/041 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තීරණය කර තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 දින දක්වාම කරුණු සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කිරීමක් කර නොතිබුණි. | | | |
| (න) | 2020 වර්ෂය සඳහා ප්‍රදර්ශන, බීජ නිෂ්පාදන හා මී මැසි පෙට්ටි නිෂ්පාදනය වැනි ප්‍රාග්ධන ව්‍යාපෘති 44 ක් වෙනුවෙන් රු.916,322,319 ක් වෙන්කර තිබූ නමුත් ඒවායින් ව්‍යාපෘති 14 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සැලසුම් ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වී ඇත. |
| (ප) | 2008 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අරමුදල වෙත ගොවිසෙත ලොතරැයියේ ආදායම ලැබී නොතිබුණු බැවින් අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ක්‍රියාත්මක කිරීමේ අභිලාෂය ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ගොවිසෙත ලොතරැයි ආදායම අරමුදලේ අරමුණ උදෙසා උපයෝජනය කළ යුතු බව. | 2020 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලොතරැයි ආදායම ඉල්ලීම් කර ඇති බව. | 2021 වර්ෂයේදී ලොතරැයි ආදායමෙන් රු 10,000,000 ක් ලබාගෙන තිබුණි. |
| (බ) | ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවන ලද 1994 මාර්තු 09 දිනැති භාරකාර ඔප්පුවේ 14 වන වගන්තිය ප්‍රකාරව භාරකාර අරමුදල | මූල්‍ය හා පරිපාලන කටයුතු මනාව කළමනාකරණය කළ යුතු බව. | ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම හේතුවෙන් ණය සහ විවිධ ව්‍යාපෘතීන් කළමනාකරණය දුර්වල මට්ටමක ඇත. |

සඳහා කාර්ය මණ්ඩලයක් බඳවා ගත හැකිව තිබූ නමුත් එසේ සිදු නොකිරීම හේතුවෙන් ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම, නොපියවූ අත්තිකාරම් පැවතීම, අය නොවන ණය කපා හැරීමට ලක් කිරීම, අරමුදලෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතින් අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු නොකිරීම යනාදී දුර්වලතා හේතුවෙන් 2020 වර්ෂයේ දී අරමුදලේ මූල්‍ය හා පරිපාලන කළමනාකරණය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

31. විගණන අස්ථිත්‍යයේ නම - **සමූපකාර අතිරික්ත අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - වියාචනය කළ මතය

2019 - වියාචනය කළ මතය

2020 - වියාචනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු.143,919,037 ක් ණය මුදල් වශයෙන් ලබා දී ඇති අතර 2019 දෙසැම්බර් 31 දින වන විට රු.24,891,113 ක් පමණක් අය වී තිබුණි. රු.119,027,924 ක් තවදුරටත් අයවීමට පවතින අතර මෙම ශේෂය වර්ෂ 05ක සිට වර්ෂ 27ක් දක්වා පැරණි ඒවා විය. | ණය මුදල අයකර ගැනීමට පියවර ගත යුතු බව. | පැහැදිලිකිරීම් ඉදිරිපත් කර තිබුණි. | මේ වන තෙක් ණය මුදල අය වී නොතිබුණි. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 21 ක සිට පැවත එන රු.9,475,735 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතු බව. | පැහැදිලිකිරීම් ඉදිරිපත් කර තිබුණි. | මේ දක්වාත් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සමූපකාර ණය රු.583,184,797 , සමූපකාර අරමුලින් ලැබිය යුතු මුදල රු.5,029,486, ලැබිය යුතු භාණ්ඩාගාර නියෝජ්‍ය ණය රු.81,871,370 , ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල රු.150,000 හා ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | ශේෂ සනාථන, විස්තරාත්මක උපලේඛන, ණය ලිපිගොනු හා ඇවර ගිණුමේ පිටපතක් ලබා ගැනීමට කටයුතු කල යුතු බව. | පැහැදිලිකිරීම් ඉදිරිපත් කර තිබුණි. | මේ දක්වාත් තත්ත්වය විසදී නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | රු.3,871,256 ක් සඳහා ශේෂ සනාථන ද පොදු තැන්පත් ගිණුම රු.10,779,292 ක් සඳහා විස්තරාත්මක උපලේඛන ද ස්ථාවර තැන්පත් ඇපණය හිමියන් රු.58,918,112 ක් සඳහා ණය ලිපිගොනු සහ ශේෂ සනාථන ද ඇවර ගිණුම් (හර ශේෂය) රු.2,620,473 ක් සඳහා පිළියෙල කරන ලද ඇවර ගිණුමේ පිටපතක් ද ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | | | |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.543,726,149 ක් වූ සක්‍රීය සමූපකාර සමිති ණය ශේෂයෙන් 2020 වර්ෂයේදී අය වී තිබුණේ රු.22,611,959 ක් පමණි. ලැබිය යුතු රු.164,595,101 ක ණය පොලියෙන් 2020 වර්ෂය තුල ලැබී තිබුණේ රු.2,089,268 ක් පමණි. | මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු බව. | ණය අයකිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා ණය මුදල් ප්‍රතිලේඛන ගත කිරීමට කටයුතු කර ඇති බව. | 2021 වර්ෂයේ එම ණය මුදලින් රු.9,120,436 ක් හා ණය පොළියෙන් රු.5,854,846 ක් ලැබී තිබුණි. |
| (ඉ) | ලැබිය යුතු ණය ශේෂ තුල ඇතුලත් සීමා සහිත කුරුණෑගල සමූපකාර ආරෝග්‍යශාලා සමිතිය වෙත නව ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.මිලියන 100 ක ණය මුදලක් අරමුදලින් ලබා දී තිබුණ ද, 2020 වර්ෂය අවසානයේදී | ණය මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු බව. | පැහැදිලිකිරීම් ඉදිරිපත් කර ඇති බව. | මේ දක්වාත් තත්ත්වය විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එම ණය මුදලින් අය වී තිබුණේ රු.1,898,184 ක් පමණි. | | | |
| (ඊ) | 2011 සිට 2014 වර්ෂය දක්වා විවිධ සමූපකාර සමිති සහ සංගම් වලට ලබා දී තිබුණු රු.210,802,293 ක් වූ ණය මුදල හා ඒ සඳහා වූ රු.87,119,041 ක් වූ පොලියෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට 2020 වර්ෂය අවසන් වන විටද කටයුතු කර නොතිබුණි. | ණය මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු බව. | පැහැදිලිකිරීම් ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂය තුල ලැබිය යුතු ණය වාරික වලින් රු.1,233,237ක් ද ලැබිය යුතු ණය පොළියෙන් රු.5,000,000ක්ද ලැබී තිබුණි. |

32. විගණන අස්ථිතායේ නම - **සමූපකාර සංවර්ධන අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------ | ----------------- | ---------------------- | -------------------- |
| (අ) | 1999 හා 2000 වර්ෂවල උතුරු නැගෙනහිර පළාතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිළිවෙලින් රු.15,000,000 ක් හා රු.4,500,000 ක ණය මුදල් ලබාදී තිබුණි. ණය මුදල් ලබාදී වසර 20 ක් ගත වී ඇතත් 2018 දෙසැම්බර් 31 දිනට ඉන් රු.14,575,000 ක හා රු.4,475,000 ක ශේෂයක් අයවීමට පැවති අතර, අයවිය යුතු ණය පොලිය රු.3,810,000 ක් විය. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. | වසර 20 කට පමණ පෙර ණය ශේෂ බැවින් සොයාගැනීමේ අපහසුතාවය නිසා පළාත් සමූපකාර සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මේ දක්වාත් තත්ත්වය විසදී නොතිබුණි. |
| (ආ) | ණය ශේෂයන් 02 ක එකතුව රු.52,604,789 ක් , නොපියවූ අත්තිකාරම් රු.45,525 ක් හා වෙනත් ජංගම වත්කම් රු. 20,000 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථන ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර නොතිබුණි. | මේ දක්වාත් තත්ත්වය විසදී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 ජනවාරි 01 දිනට අක්‍රීය සමිති 54 කින් රු.31,287,451 ක් හා සක්‍රීය සමිති දෙකකින් රු.3,016,480 ක්ද වශයෙන් එකතුව රු.34,303,931 ක හිඟ ණය ශේෂයක් හා පොලිය රු.7,704,272ක් අයවීමට පැවතියද 2020 වර්ෂයේදී කිසිදු මුදලක් අය වී නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට එම ණය හා පොළිය වර්ෂ 08 ක සිට වර්ෂ 56 ක් දක්වා කාල පරාසයක සිට අයනොවී පවතින ශේෂයන් වූ අතර ඉන් සමිති 20 කට ලබාදුන් රු.8,450,900 ක් වූ ණය මුදලින් කිසිදු ණය වාරිකයක් අය වී නොතිබුණි. තවද 2012 වර්ෂයේ දී සීමාසහිත කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට ලබා දී තිබූ රු.3,000,000 ක් වූ ණය මුදල වාරික 54 කින් ගෙවා නිම කල යුතුව තිබුණද එම ණය මුදලින් 2013 වර්ෂයේදී එක් වාරිකයක් පමණක් ගෙවා තිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. | කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිති නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇති අතර අනෙකුත් සමිති වල තත්ත්වය සම්බන්ධයෙන් පළාත් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ ලබා ගෙන ඇති බව. | මේ දක්වාත් තත්ත්වය විසදී නොතිබුණි. |
| (ඈ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,999,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,184,000 ක් වූ ලැබිය යුතු උසාවි වන්දි මුදල් | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. | වර්තමානය වන විට කාර්යසාධන අත්තිකාරම් පමණක් මාසිකව අයවෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.219,649,334 ක ශේෂයක් පැවති අතර ඉන් රු.161,338,906 ක් එනම් සියයට 73 ක ඉහළ ප්‍රතිශතයක් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් අයවිය යුතුව පැවතුණි. ණය ශේෂයන් තුල වර්ෂ 05 කට වඩා පැරණි ශේෂ එකතු වටිනාකම රු.28,794,753 ක් හා වර්ෂ 01 සිට 05 දක්වා කාලය තුල ලැබිය යුතු ශේෂය රු.190,854,581 ක් විය. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. | පිළිතුර ලබා දී නොතිබුණි. | 2021 වර්ෂයේ රු.121,353,638 ක මුදලක් දායක මුදල් වශයෙන් අය වී තිබුණි. |
| (ඊ) | සමූපකාර තොග වෙළඳ සංස්ථාවට හා සී/ස ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමයට අරමුදලින් 2011 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 152.5 ක් හා රු.මිලියන 25 ක් ලබා දී තිබුණි. සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙන් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් විය. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. | වර්තමානය වන විට සී/ස ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමයෙන් අයවීමට ඇති ශේෂය රු.200,000 කි. |

33. විගණන අස්ථිත්‍යයේ නම - ශ්‍රම වාසනා අරමුදල

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය කල මතය

2019 - තත්වාගණනය කල මතය

2020 - තත්වාගණනය කල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම රු. 58,900,000 ක් වූ අතර, එම වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 30 ක් ලබාගෙන තිබුණි. නමුත් එලෙස ලබාගත් මුදල් සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අයවැය ගත වැඩසටහන්වලට භාවිතා නොකර රු මිලියන 20 ක් මහජන බැංකුවේ සියයට 11ක් සහ සියයට 10.5ක් බැගින් වූ පොලී අනුපාත යටතේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්වලට අරමුදලේ මුදල් කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව භාවිතා කළ යුතු බව. | ශ්‍රම වාසනා අරමුදල් පනතේ 07 (02) (ඌ) වගන්තියට අනුව අරමුදලට අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීමට හැකියාව ඇති බවට පැහැදිළි කිරීම් ඉදිරිපත් කර ඇත. | ලොතරැයි ආදායම සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතින මෙම කාලයේදී ස්ථාවර තැන්පතු භාවිත කර ආයතනයේ අරමුණුවලට හා පරිපාලන වියදම් දැරීම සිදු කරනු ලබයි. |
| (ආ) | 2019 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදල විසින් ඉටු කල යුතුව තිබූ කාර්යභාරයන් අතරින් රු.මිලියන 2.41 ක් වෙන් කල කාර්යභාරයන් 7 ක් ඉටුකර නොතිබුණි. ඉකුත් වර්ෂයේදී හා 2019 වර්ෂයේදී ඉහත වැඩසටහන්වල ස්වරූපය | සැලසුම්කරණ ලද වැඩසටහන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අරමුදල හැකි සෑම උත්සාහයක්ම ගතයුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් | ක්‍රියාකාරී සැලැස්මට අනුව අඩු කාර්යසාධනයක් පෙන්නුම් කර ඇති වැඩසටහන් නැවත සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කමිටු වාර්තාව යොමු | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පරිදි පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සකසා ඇති නමුත් Covid – 19 තත්ත්වය නිසා වැඩසටහන් කිහිපයක් සෞඛ්‍ය හේතු මත ප්‍රායෝගිකව සිදුකිරීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | (Nature) සහ විෂය පථයේ පැවති දුර්වලතා හේතුවෙන් ක්‍රියාත්මක කල නොහැකිව තිබුණද කළමනාකරණය විසින් ඒ පිළිබඳ සැලකිල්ලට නොගෙන දිගින් දිගටම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් කර තිබුණි. | ළඟාකර ගැනීමටද කටයුතු කල යුතු බව. | කර ඇති බව. | |
| (ඇ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2019 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වෛද්‍ය සහනාධාර සැපයීම, කෘතිම අත්පා බෙදාදීම් හා ලොතරැයි විකුණුම් වැඩිකිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 85 ක් වූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3.3 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂ අවසානයට එම වැඩසටහන් 15 ක් පමණක් පවත්වා තිබූ අතර රු.මිලියන 1.3 ක් වැයකර තිබුණි. ඒ අනුව භෞතික කාර්යසාධනය සියයට 17 ක් වුවද මූල්‍ය කාර්යසාධනය සියයට 39 ක් බව නිරීක්ෂණය විය. | සැලසුම්කරන ලද වැඩසටහන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අරමුදල හැකි සෑම උත්සාහයක්ම ගතයුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමටද කටයුතු කල යුතු බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අඩු කාර්යසාධනයක් පෙන්නුම් කර ඇති වැඩසටහන් නැවත සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත්කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කමිටු වාර්තාව යොමු කර ඇති බව. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පරිදි පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සකසා ඇති නමුත් Covid – 19 තත්ත්වය නිසා වැඩසටහන් කිහිපයක් සෞඛ්‍ය හේතු මත ප්‍රායෝගිකව සිදු කිරීමට අපහසු වී ඇත. |
| (ඈ) | 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතේ මුල් පනතේ 13 (1) වගන්තිය සහ සංශෝධිත පනත 5 (1) හා (2) උප වගන්ති අරමුදල හා ලොතරැයි | පනතේ විධිවිධාන අනුව ලොතරැයි මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවී ලොතරැයි පවත්වාගෙන යාමට කටයුතු කල යුතු බව. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඇති බව. | එකඟත්වයකට පැමිණ නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලය එකඟවනු ලැබිය හැකි යම් ලොතරැයි සංඛ්‍යාවක්, ලොතරැයි වර්ග හා එසේ පවත්වන ලොතරැයිවලදී ප්‍රදානය කරන තෑගි පිළිබඳව, ඒ ලොතරැයිවලදී හිමිකම් කියා නොසිටින තෑගි සම්බන්ධව කටයුතු කරන ආකාරය පිළිබඳව, සහ ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් අරමුදල සඳහා වෙන්කල යුතු මුදල් ප්‍රමාණය පිළිබඳව එකඟතාවයක් පැවතිය යුතු නමුත්, අරමුදල හා ජාතික ලොතරැයි මණ්ඩලය අතර එවැනි එකඟතාවයක් ඇතිකර ගෙන නොතිබුණි. | | | |
| (ඉ) | 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත සහ 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතේ මුල් පනතේ 14 වන වගන්තිය සහ සංශෝධිත පනත 6 (2) උප වගන්තිය ප්‍රකාරව අරමුදලේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් රීති සෑදීමේ බලය දී ඇති හෝ අවශ්‍ය යැයි සලකන රීති පිළියෙල කර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද එම රීති 2021 | පනතේ විධිවිධාන අනුව කටයුතු කර අදාල රීති සාදා බලගැන්වීමට කළමණාකරනය විසින් කටයුතු කලයුතු බව. | වගන්ති ප්‍රකාරව රීති සෑදීම සඳහා අදාල කටයුතු මුදල් අමාත්‍යාංශය මගින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | රීති සෑදීමේ කටයුතු අවසන් වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අප්‍රේල් 08 දින දක්වාම ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | | | |
| (ඊ) | COVID - 19 හේතුවෙන් රැකියා අහිමි වූ සේවා නියුක්තිකයන්ගේ දූදරුවන් 2,500 ක් සඳහා පාසල් බෑග් සහ උපකරණ කට්ටල ලබාදීමට රු. 6,250,000 ක ඇස්තමේන්තුවක් සකස් කර කම්කරු බල ප්‍රදේශ 11 ක් ආවරණය වන පරිදි කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අවශ්‍ය තොරතුරු හා අයදුම්පත් කැඳවා තිබුණු අතර ඒ අනුව 2020 දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 330 කට අධික ප්‍රමාණයක් ලැබී තිබුණි. එම සමාජීය වගකීම් ඉටුකිරීම කාලීන අවශ්‍යතාවයක් මෙන්ම පනතේ 6 (ඉ) උප වගන්තියේ අරමුණුවලට වඩාත් යෝග්‍ය වූ වැඩසටහනක් වුවද 2021 මාර්තු 15 දිනටත් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන කාලීන අවශ්‍යතා පරිදි, විධිමත්ව වැඩසටහන් පැවැත්වීමට කටයුතු කල යුතු බව. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය ඉවත් වී යථාතත්ත්වයට පත්වීමත් සමඟ අරමුදල විසින් සිදුකරන සියලු වැඩසටහන් විධිමත් සැලැස්මක් අනුව සිදු කිරීමට කටයුතු යොදා ඇති බව. | 2022 පෙබරවාරි දක්වාම මෙම වැඩසටහන ක්‍රියාත්මක වී නොමැත. |

34. විගණන අස්ථිතායේ නම - **ජාතික ක්‍රීඩා අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය නොකළ මතය

2019- තත්ත්වාගණනය කළ මතය

2020- තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | -------------------- | -------------------- | --------------------- |
| (අ) | 2018 වර්ෂය තුළදී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන මාණ්ඩලික නිලධාරීන් 4 දෙනෙකුට අරමුදල මගින් ක්‍රීඩා පුහුණුකරු දීමනා වශයෙන් රු.1,185,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, එම නිලධාරීන් 4 දෙනා වෙත ක්‍රීඩා පුහුණුකරු දීමනා ගෙවීමේදී ඔවුන්ගේ කාර්යසාධනය සම්බන්ධ ඇගයීමක් සිදු කර නොතිබුණි. තවද ඉහත නිලධාරින් 4 දෙනාගෙන් දෙදෙනෙකු සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ තරඟාවලියේ ක්‍රීඩා පුහුණුකරුවන් වශයෙන් තරඟ ජයග්‍රහනය වෙනුවෙන් රු.1,600,000 ක මුදලක් අරමුදලෙන් ගෙවා තිබුණි. | රාජ්‍ය නිලධාරීන්ට මේ ආකාරයේ ගෙවීම් කිරිමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. | එම නිලධාරීන්ට ලේකම්තුමාගේ අනුමැතිය මත ගෙවීම් සිදුකර ඇති අතර ඉදිරියේදී ආයතන සංග්‍රහයේ 1.4.1 කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලබන බව. | ඉදිරියේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරනු ලබන බව. |
| (ආ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව අරමුදල අමාත්‍යාංශ ලේකම් විසින් පරිපාලනය කළ යුතු වුවත්, ඒ සඳහා 2018 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අරමුදලේ පරිපාලන කටයුතු විධිමත්ව කරගෙන යාම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බව. | ඉදිරියේදි ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | ජාතික ක්‍රීඩා අරමුදල වෙනුවෙන් 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ඌව ක්‍රීඩා සමාජ ගොඩනැගිල්ල හා ක්‍රීඩාපිටිය අළුත්වැඩියාව හා වැඩිදියුණු කිරීම් සඳහා අරමුදලින් 2019 වර්ෂයේදී රු.2,500,000 ක් ගෙවා තිබුණු ද, එම ක්‍රීඩා සමාජය තෝරා ගැනිම හා ක්‍රීඩා සමාජයේ අවශ්‍යතාවයන් හඳුනාගත් ආකාරය පිළිබඳ පැහැදිලි නොකෙරුණි. ඊට අමතරව එමගින් ක්‍රීඩා ක්ෂේත්‍රයට වූ දායකත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය හා පසුවිපරම් කිරීම සිදුකර නොතිබුණු අතර, අරමුදල විසින් මෙවැනි ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්‍රීඩා අරමුදල මගින් ක්‍රීඩාපිටි සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබාදිමේදී ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කටයුතු සිදුකළ යුතු බව. | මේ සඳහා වැයවෙන මුළු පිරිවැයෙන් රු.මිලියන 2.5 ක් වැයකර ඇති අතර සම්පූර්ණ මුදල ලබාදී නොමැති බැවින් ප්‍රායෝගිකව පසුවිපරම් කිරීමට සාර්ථක ක්‍රමවේදයක් නොමැත. ඉදිරියේදී විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් ක්‍රියාවේ යෙදවීමට සටහන් කර ගත් බව. | මෙම ස්වරූපයේ ගෙවීම් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් වර්තමානයේ ක්‍රියාත්මක නොවේ. |
| (ඇ) | 2021 වර්ෂයේ කොරියාවේ පැවැත්වෙන ලෝක ශූරතා මේස පන්දු තරඟාවලියට සහභාගි වීම සඳහා ශ්‍රී ලංකා මේස පන්දු සංගමය වෙත ලබාදීමට නියමිතව තිබූ රු.2,000,000 ක් කොරෝනා වසංගත තත්ත්වය මත එම තරඟාවලිය දින නියමයක් නොමැතිව කල්ගත වීම හේතුවෙන් එම මුදල ක්‍රීඩා අරමුදලට ආපසු බැර කිරීමට කටයුතු කිරීමේදි, මෙම වියදම මූල්‍ය ප්‍රකාශනවල ජාත්‍යන්තර තරඟාවලි වියදම් වලින් ඉවත් නොකර චෙක්පත අවලංගු කිරීම අනුග්‍රාහක ආදායම් ලෙස වෙනත් ආදායම් වලට ඇතුලත් කර තිබුණි. මෙම ගනුදෙනුව නිවැරදිව ගිණුම්ගත නොකිරීම | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු බව. | එම රු.මිලියන 2 වියදම සඳහා චෙක්පත අවලංගු කර අදාල වියදම් විෂයට බැර කිරීම සිදු කල යුතු වුවත් එය අතපසු වීමකින් අනුග්‍රාහක ලැබීමක් ලෙස සටහන් කර ඇති බව පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | 2021 වර්ෂ අවසාන ගිණුම් වලින් ගැලපීම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් ජාත්‍යන්තර තරඟාවලි වියදම රු.2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර වෙනත් ආදායම්ද රු.2,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | | |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 අනුව තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් තුල හිමිකම් ඉල්ලුම් නොකළ රු.10,000 ක් බැගින් වූ රු.120,000 ක් අගය වූ කල් ඉකුත් වූ තැම්පතු 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 570 අනුව කටයුතු කළයුතු බව. | 2019.11.19 දිනට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වූ තැන්පතු පිළිබඳව මු.රෙ. 571 විධිවිධාන අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | මු.රෙ. 571 විධිවිධාන අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. |
| (ඊ) | ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම ,ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා බිම් මට්ටමෙන් ක්‍රීඩාව සංවර්ධනය කිරීම ආරම්භ කල යුතු බැවින් ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව නඟා සිටුවීම අත්‍යාවශ්‍ය වන අතර ඒ අනුව ,ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා දායකත්වය සපයනු ලබන සංවිධාන, පාර්ශය සහ පුද්ගලයන් වෙතද අනුග්‍රහය ලබාදීම සංගමයේ අරමුණ වුවද, ඒ සඳහා මෙතෙක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම සහ ඒ අනුව ලබා දුන් අරමුදල් ක්‍රීඩාවේ දියුණුව සඳහා ප්‍රමාණවත් පරිදි දායකත්වයක් සිදුවන්නේද යන්න නිශ්චිතව පරීක්ෂා කර බැලීමක් සිදු නොවන බව | ක්‍රීඩා අරමුදලේ අපේක්ෂිත කාර්යසාධනය ලඟා කරගැනීම පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස්කළ යුතු බව. | ඉදිරියේදී ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | මෙතෙක් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |

නිරීක්ෂණය විය.

| | | | | |
|---|---|---|---|---|
| (උ) | මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ කඹුරුපිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනයට අදාළ මුළු ඉදිකිරීම් කටයුතු සඳහා රු.9,157,993 ක්වූ ඇස්තමේන්තුගත මුළු මුදල මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. මුදල් ලබාදීමට ප්‍රථම ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තා, ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා, ක්‍රීඩා සමාජයේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබාගෙන නොතිබුණු අතර, වැඩ අවසන් වීමෙන් පසු ඉතිරි වූ රු.2,538,933 ක් ක්‍රීඩා අරමුදල වෙත ආපසු ලබාගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විට කටයුතු කර නොතිබුණි | ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා අරමුදල් යෙදවීමේදී නියමිත ශක්‍යතා වාර්තා, ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ආදී තොරතුරු ලබා ගෙන ආයෝජනයේ ඵලදායකත්වය පිළිබඳ සෑහීමකට පත්විය යුතු වන අතර, සංවර්ධන කාර්යයන් සඳහා වැයවන නිවැරදි අරමුදල් ප්‍රමාණය තීරණය කිරීමෙන් පසු ගෙවීම් කටයුතු සිදු කිරීම හා ඉතිරි මුදල් අරමුදල වෙත අප්‍රමාදව ලබාගැනීමට කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඇති අතර වාර්තාව ලැබී නොමැති බව. | ඉතිරි මුදල් දිස්ත්‍රික් ලේකම් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර ඇති අතර ඉටුකල යුතු අත්‍යවශ්‍ය වැඩ කොටස් කිහිපයක් සඳහා එය යොදා ගැනීමට කටයුතු කරන බව දිස්ත්‍රික ලේකම් දැනුම් දී ඇත. ඉදිකිරීම් කටයුතුවල පවතින යම් අඩුපාඩු හා කළ යුතු ඉතිරි වැඩ හඳුනා ගැනීමක් සිදුකර ඇත. ඒ අනුව එම කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටතේ සිදු කිරීමට නියමිතව ඇත. |

35. විගණන අස්ථිත්‍යයේ නම - **ධීවර ත්‍යාග අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - මතය වියාචනය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | -------------------- | -------------------- | -------------------- | -------------------- |
| (අ) | නීත්‍යානුකූලව නඩු කටයුතු අවසන් කර තිබූ නඩුවලට අදාලව දිස්ත්‍රික් ධීවර කාර්යාල අධිකරණ හා නාවික හමුදාව භාරයේ ඇති යන්ත්‍ර හා උපකරණ අගය කර ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුනාගෙන නොතිබුණි. | ධීවර ත්‍යාග අරමුදල සතු සියලු වත්කම් හඳුනාගැනීම සඳහා අවශ්‍ය ගිණුම් ප්‍රතිපත්ති සකස් කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි වී නොමැත. |
| (ආ) | 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(4) උපවගන්තිය අනුව කලින් කලට සුදුසු යැයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන යම් මුදල් ප්‍රවාහයක් ත්‍යාග මුදල් ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. | ප්‍රමාණවත් ත්‍යාග මුදල් ලබාදීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම කළ යුතු බව. | ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කරගත් බව | ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඇ) | (i)වැටලීම්වලට සහභාගී වන නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කටයුතු කළයුතු වුවත් 2014,2015,2016,2017,2018 වර්ෂවල පිළිවෙලින් නඩු පැවරීම 271,348,488,427 හා 327 ලෙස සිදුකර තිබුණ ද 2014,2017,2018 වර්ෂ සඳහා කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා නිශ්චිත | වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළ යුතු බව. | නඩු කටයුතු අවසන් වීමට වසර ගණනාවක් ගතවීම නිසා එම වර්ෂයේ පවරන ලද නඩු සඳහා එම වර්ෂයේ ම ගෙවීම් කිරීමේ හැකියාවක් නැති බව වාර්තා කර ඇත. | ත්‍යාග මුදල් ලබාදීම සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීම සිදුනොවන බව නිරීක්ෂණය විය. | | | |
| | (ii) නාවික හමුදාව විසින් තහනම් දැල් ආම්පන්න භාවිතා කරමින් නීති විරෝධි ධීවර කටයුතුවල නියැලෙන ධීවරයින් හා යාත්‍රා අත්අඩංගුවට ගෙන දිස්ත්‍රික් ධීවර කාර්යාල වෙත දැනුම් දුන්නන් බොහෝ විට ඔවුන් නොපැමිණීම හෝ ප්‍රමාද වී පැමිණීම ධීවර යාත්‍රා නිදහස් කිරීම සිදුවන බව වාර්තාකර තිබුණි. මෙයින් නීති විරෝධි ක්‍රියාවන් සඳහා අනුබලදීමක් මෙන්ම රජයේ ආදායම් අහිමි කිරීමක් ද වන බව විගණනයේ අදහසයි. | අත්අඩංගුවට ගැනීම හා තොරතුරු සපයන්නන් දිරිමත් වන ආකාරයට විනිවිධභාවයකින් යුතුව ක්‍රියා කළ යුතු බව. | දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය අලුතින් පිහිටුවා ඇති බැවින් හැකි සෑම විටම මෙවැනි චෝදනා සම්බන්ධයෙන් එම අංශය මඟින් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන බව. | එවැනි පරීක්ෂණ පැවැත්වීමක් වාර්තා වී නොමැත. |
| (ඈ) | 1996 ධීවර හා ජලජ සම්පත් පනතේ 59(3) වගන්තිය අනුව 51(4) උපවගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2017 හා 2018 වර්ෂ සඳහා පිළියෙලකර තිබුණු ක්‍රියාකාරී සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා සැලසුම් පිළියෙල කර නොතිබුණි. | ධීවර හා ජලජ සම්පත් පනතේ 59(3) වගන්තිය අනුව 51(4) උපවගන්තිය ප්‍රකාර ත්‍යාග අරමුදලේ කාර්යයභාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කර ක්‍රියාත්මක කළ යුතු බව. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම අරමුදලේ කාර්යයන් ද ඇතුළත් කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | 2020,2021 වර්ෂ සඳහා ක්‍රියාකාරි සැලැස්ම සැකසීමේ දී එම කාර්යයන් හඳුනාගෙන ඇතුළත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | i. රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමෙන් 2019 වර්ෂය තුළ ලැබූ මුදල රු.9,607,333 ක් වුවද කාර්යසාධන වාර්තාව අනුව 2019 වර්ෂය තුළ ලැබූ මුදල රු.6,148,395 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් රු.3,458,938 ක වෙනස පිළිබඳව හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,973,908 ශේෂය පිළිබඳව අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ බැවින් එම ශේෂයන්වල නිවැරදිතාවය තහවුරු වී නොතිබුණි. | නිම වූ නඩුවලට අදාලව අධිකරණවලින් ලැබිය යුතු මුදල් පිළිබඳව තහවුරු කිරීම් ලබාගැනීමෙන් ආදායම නිවැරදිව හඳුනාගැනීමට ක්‍රියාකළ යුතු බව. | අධිකරණවලින් එම මුදල ආපසු ගෙවීමට විශාල කාලයක් ගැනීම මෙයට හේතු වී ඇති බව. | ලිඛිත සාක්ෂි ලැබී නොමැත. |
| | ii 2019 වර්ෂයේ දී රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ත්‍යාගලාභීන්ට හා ඒකාබද්ධ අරමුදලට රු.5,870,700 ක් ගෙවා තිබුණි. වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන් සම්බන්ධයෙන් නියමිත පරිදි තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් හිමිකම් නොමැති අයට ගෙවීමක් සිදුවී ඇත් ද ලැබිය යුතු රාජ්‍ය ආදායම අහිමිවීමක් සිදුවී ඇද්ද යන්න තහවුරු කරගත නොහැකි විය. | වැටලීම් හා නඩුවලට සම්බන්ධ වූවන්ගේ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වාගෙන යුතු බව. | වසරක් තුළ නඩු 10 ක් පමණ සුළු වවුචර් ප්‍රමාණයක් ඉදිරිපත් වන බැවින් වෙනම ලේඛනයක් පවත්වාගෙන නොයන බව. | වැටලීම්වලට සහභාගි වන්නන්ගේ ලේඛනයක් පවත්වාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | iii තොරතුරු සපයන්නන් සඳහා ගෙවීමට රු.425,683 ක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවා තිබුණ ද අදාල පාර්ශවයන් වෙත එම ගෙවීම් කරනු ලැබුවේ ද යන්න විගණනයේ දී තහවුරු නොවීය. | විනිවිධභාවයකින් තොරතුරු පවත්වාගත යුතු බව. | තොරතුරු සපයන්නෙකුට එම මුදල ලබාදීමට අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදුන් බව. | තහවුරුවක් ඉදිරිපත් නොවුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(2) වගන්තිය ප්‍රකාර ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ දෙපාර්තමේන්තුව 2017,2018,2019 වර්ෂවල පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සැලසුම් පිළියෙල කර නොතිබුණි. | ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව. | වර්තමාන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ගැනීමට සටහන් කරගෙන ඇති බව. | 2020 ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර නැත. |
| (උ) | මුලතිව් දිස්ත්‍රික් ධීවර කාර්යාලය විසින් 2018 වර්ෂයේ පවරා තිබූ නඩු ප්‍රමාණය 70 ක් වූ අතර 2018 වර්ෂය අවසන් වන විට නොවිසඳී තිබූ නඩු ප්‍රමාණය 8 ක් විය. තහනම් දැල් හා ඩයිනමයිට් භාවිතය මෙම නඩු පැවරීම සඳහා හේතු වී තිබුණු අතර ධීවරයින් නිසා මෙම මත්ස්‍ය සම්පත විනාශවීමේ තර්ජනයකට මුහුණ පා තිබීම සම්බන්ධයෙන් කළමනාකරණය ධීවරයින් දැනුවත් කර තිබුණ ද නීති විරෝධී කාර්යයන් අඩු වී නොතිබුණි. | මත්ස්‍ය සම්පත රැක ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රමවේද සකස් කිරීම කළ යුතු බව. | වර්ෂය තුළ නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධයෙන් සෑම දිස්ත්‍රික්කයකට ධීවරයින් දැනුවත් කිරීම් වැඩමුළු පවත්වා ඇති බව. | දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වා තිබුණ ද 2021 වර්ෂයේ දී ද තහනම් ක්‍රම භාවිතයෙන් මසුන් ඇල්ලීම සිදුවේ. |
| (ඌ) | අපේක්ෂිත වැටලීම් ඉලක්කය 655 ක් වුවත් වැටලීම් 200 ක් පමණක් එනම් සියයට 31 ක ප්‍රමාණයක් පමණක් සිදුකර | ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියාකළ යුතු බව. | මෙම ඉලක්කය තීරණය කිරීමේ දී අධිගණනය කිරීමත් සිදු වී ඇති බැවින් | 2021 වර්ෂයේ දී ඉලක්ක ළඟා කරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. මේ නිසා යාපනය, පුත්තලම දිස්ත්‍රික් ධීවර කාර්යාල හැරුණුවිට අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය අදාල ඉලක්ක කරා ළඟා වී නොතිබුණි. | | නිවැරදිව ගණනය කරන බව. | |
| (එ) | 2020 ජනවාරි 01 දිනට පැවති රු.1,973,908 ක ලැබිය යුතු හිඟ ආදායමෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ දී අයකර නොතිබුණු බැවින් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු බව. | 2013-2020 දක්වා ලැබිය යුතු ආදායම පිළිබඳ කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල මට්ටමක පවතී. |
| (ඒ) | i. 2020 වර්ෂය අවසානයේ පැවති රු.8,612,255 ක මුදල් ශේෂයෙන් ත්‍යාග ලාභීන්ට ගෙවිය යුතු මුදල් හා රජයේ දායකත්වය නිරූපනය කරනු ලැබුව ද ගෙවිය යුතු දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.1,244,460 ක් පමණක් පෙන්වා තිබුණි. ඒ අනුව ඉතිරි රු.7,367,795 ක මුදලට හිමිකම් කියනු ලබන ත්‍යාග ලභීන් හා ඊට අදාල රාජ්‍ය ආදායම හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | හිමිකම් කියනු ලබන ත්‍යාගලාභීන් හා ඊට අදාල රාජ්‍ය ආදායම හඳුනාගැනීමට කටයුතු කළ යුතු බව. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් ත්‍යාග ලැයිස්තුව සකස් කිරීමට ප්‍රමාද වීමෙන් මේ තත්ත්වය උද්ගත වී ඇති බවත් 2021 දී නඩු කටයුතු අවසන් වූ විට වැටලීම්වලට අදාල දීමනා ගෙවා ඉතිරිය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | ත්‍යාගලාභීන් ඉදිරිපත් වීම සිදු වී නැත. |
| | ii. 2020 වර්ෂය තුළ දී විමර්ශන අංශය හා දිස්ත්‍රික් ධීවර කාර්යාල 15 හරහා නඩු 536 ක් පවරා තිබුණ ද දිස්ත්‍රික් ධීවර කාර්යාල 3 කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් මුදල් ත්‍යාග අරමුදලට බැර වී තිබුණි. විමර්ශන අංශය හා අනෙකුත් දිස්ත්‍රික් ධීවර | නඩු පිළිබඳ වාර්තා විධිමත්ව පවත්වාගෙන යාමටත් මුදල් ගෙන්වා ගැනීමටත් කටයුතු කළ යුතු බව. | නඩු කටයුතු අවසන් නොවීම හේතු වී තිබුණු බවත් අධිකරණ කටයුතු දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර හෙයින් ප්‍රමාදයන්ට දෙපාර්තමේන්තුව වගකිව නොහැකි බව | නොවෙනස්ව පවතී. |

කාර්යාල කිසිවකින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි.

ප්‍රකාශ කර තිබුණි.

36. විගණන අස්ථිත්‍යයේ නම - **පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය කළමනාකරණ භාරය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - මතය වියාචනය

2019 - මතය වියාචනය

2020 - මතය වියාචනය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 2.4.1, 2.11.1, 3.4, 6.3.3,7.7 හා 8.9.1 මාර්ගෝපදේශයන් අනුගමනය නොකර 2018 වර්ෂයේදී මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ අංක 01 ගොඩනැගිල්ලේ සිවිලිම අලුත්වැඩියා කිරීමේ රු.2,450,000 ක කොන්ත්‍රාත්තුව ද තොග අංශයේ පොළව අලුත්වැඩියා කිරීමේ රු.2,366,000 ක කොන්ත්‍රාත්තුව ද මසුන් කැපීමේ ලෑලි 44 ක් රු.1,320,000 කට මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ද පෞද්ගලික අංශයට පිරිනමා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.4.1, 2.11.1, 3.4, 6.3.3,7.7 හා 8.9.1 හි සඳහන් ක්‍රියාපරිපාටි අනුගමනය කළ යුතු බව. | ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ලිපි මඟින් දැන්වීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් ලංසු ප්‍රදානය සුදුසු බව තීරණය කිරීම හා ලංසු ලේඛනවල තාක්ෂණික දෝෂ ගණනාවක් පැවතීමත් නිසා පසුව වැඩිමිලක් ඉදිරිපත් කර තිබූ බව. | නිවැරදි වී නැත |
| (ආ) | 2010 මැයි 26 දින ස්ථාපිත භාරයේ රථවාහන අංගනයේ පරිපාලනය සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් පෞද්ගලික සමාගමක් සමඟ වර්ෂ 10 ක් | භාරය සතු වත්කම්වලින් භාරයට ආදායම් ලබාගැනීමට හැකිවන පරිදි ගිවිසුම සංශෝධනය කළ යුතු බව. | පවතින බදු ගිවිසුමෙහි කාලය අවසන් ඇති බැවින් නව බදු ගිවිසුම කළමනාකරණ | 2011 වර්ෂයේ සිට වසර 10 ක කාලයක් සඳහා බදු දී තිබූ රථගාල තුලින් ලබාගත් සාමාන්‍ය මාසික ආදායම රු.325,000 ක් වූ අතර 2021 වර්ෂයේ ලංසු කැඳවා නව |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා 2011 වර්ෂයේ දී එළඹි ගිවිසුම අනුව මාසික ශුද්ධ ලාභයෙන් සියයට 40 ක් ලංකා ධීවර සංස්ථාවට ද ඉතිරි සියයට 60 සමාගම සඳහා ලබාගැනීම භාර මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමක් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමක් කර නොතිබුණු අතර, 2019 දෙසැම්බර් 31 දින වන විටත් වර්තමානයට ගැලපෙන පරිදි ගිවිසුම සංශෝධනය කර නොතිබුණි. | | භාරයේ උපදෙස් මත සකස් කරනු ලබන බව. | ටෙන්ඩරය මඟින් මාසිකව රු.1,625,000 ක කුලී ආදායමක් ලබා ගැනීම නිසා මසකට සාමාන්‍යයෙන් රු.1,300,000 ක මුදලක් අහිමි වී තිබුණි. |
| **(ඇ)** | ශීතාගාර 3 ක් හා පතුරු අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම හා නව කැට අයිස් යන්ත්‍රාගාරයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3, 2.4, 2.5, 2.6, 4.2.1(අ), 4.2.2(අ), 4.3 හා 5.4.8 (අ) යන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. | භාරය වෙත ආර්ථික වාසි ලබාගැනීම සඳහා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු බව. | ශීතාගාර හා පතුරු අයිස් යන්ත්‍රාගාරය අලුත්වැඩියා කර පවත්වාගෙන යාම මුල් කරගෙන ලංසු කැඳවීම සිදුකර ඇති අතර නව කැට අයිස් යන්ත්‍රාගාරය ඉදිකිරීම සඳහා ලබාදීමට එකඟ වූ ඉඩම නිරවුල් නොවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යාමට අපොහොසත් වී තිබෙන බව. | නිවැරදි වී නොමැත. |
| **(ඈ)** | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව 2019 ජනවාරි 31 දින ගිවිසුමකට එළඹිය යුතු වුවද, 2019 නොවැම්බර් 19 | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ | විවිධ හේතුන් මත තමන් විසින් එකඟ වූ කොන්ත්‍රාත් මුදල භාරය වෙත ගෙවීමට අපහසු බව ලංසුකරු | අයකරගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දින ගිවිසුමකට එළඹී තිබුණු අතර, ලංසු ලියවිලිවලට අනුව ගිවිසුමට එළඹීමෙන් පසු සතියක් තුල මාස 3 ක බදු මුදල වූ රු. 900,000 ක මූලික තැන්පතුවක් එකවර මුදලින් ලබාගෙන නොතිබුණි. තවද 2019 පෙබරවාරි සිට 2020 දෙසැම්බර් දක්වා මාස 11 ක කාලය තුල ලැබිය යුතු රු.5,980,000 ක් වූ මුදලින් 2019 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති මුදල රු.5,430,000 ක් හා ලංසු ලියවිල්ලේ කොන්දේසි ප්‍රකාරව කුලී ගෙවීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබූ අතර, බදු ගිවිසුම අවලංගු කිරීම සම්බන්ධයෙන් ද සලකා බලා නොතිබුණි. | යුතු අතර හිඟ කුලී සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමට හෝ බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කළ යුතු බව. | දන්වා ඇති බවත් ලංසුකරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී ඇති බවත්. | |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133(i)(අ) ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට 2020 වර්ෂය අවසන් වන විට ද අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කළමනාකරණ භාරයේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා පද්ධති හා පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | අභ්‍යන්තර විගණන ඒකකයක් මේ දක්වා පිහිටුවා නැත. |
| (ඊ) | 2020 වර්ෂයේ දී අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් වැය කර තිබූ රු.105,450,026 ක්වූ වටිනාකම ඉඩම් සහ සංවර්ධන වටිනාකමට | ප්‍රමිත ප්‍රකාරව එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුතු වත්කම්, පන්තීන් අනුව ගිණුම්ගත කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | එකතුකර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 හි 50 ඡේදයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. | | | |
| (ඨ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 57 ඡේදයට පටහැනිව මුළු පිරිවැය රු.38,598,438 ක් වූ පිරිපහදු යන්ත්‍රාගාරයේ යන්ත්‍ර හා ගොඩනැගිලි, වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමකින් තොරව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි. | ප්‍රමිත ප්‍රකාරව යන්ත්‍ර හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |
| (ඩ) | 2020 වර්ෂයේදී ලෙජර් ගිණුම් 4ක එකතුව රු.95,809,210 ක් වැඩියෙන් ද ලෙජර් ගිණුම් ශේෂ 3ක එකතුව රු.1,210,685,143 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, එකතුව රු.346,406,831 ක් වූ හර ශේෂ 18 ක් හා එකතුව රු.2,289,828,473ක්වූ බැර ශේෂ 24 ක් සඳහා ද ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණද එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. මෙම නොසැසඳීම 2018 හා 2019 වර්ෂවල ද පෙන්වා දී තිබුණි. | නිවැරදි ලෙසට අදාල ලෙජර් ගිණුම්වල සටහන් කර ගිණුම් පවත්වා ගෙන යා යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |
| (ඪ) | 2014 වර්ෂයේ සිට පැවත එන රු.5,550,000 ක තාවකාලික නවතන ලද ආපසු ගෙවන තැන්පත් | ගෙවීම් හා ශේෂයන් තහවුරු කිරීමේ දී අදාල සාක්ෂි සහිතව ඉදිරිපත් කිරීම | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි වී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් ද, 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු.1,688,741,540 ක් වටිනා ගොඩනැගිලි ද සමාලෝචිත වර්ෂයට අදාල රු.22,484,737 ක්වූ ස්ථාවර තැන්පතු සඳහා ද ලැබිය යුතු පොලී ආදායම රු.347,273 ක්වූ සුළු මුදල් ගෙවීම් ආදී ශේෂයන්වල නිරවද්‍යතාව තහවුරු කිරීමට ප්‍රමාණවත් ලියවිලි ඉදිරිපත් කර නොතිබීම. | කළමනාකරණයේ වගකීමකි. එය පැහැර හැරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව බව. | | |
| **(ඒ)** | 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුවේ අංක 6(අ) 1 ඡේදයේ විධිවිධානවලට පටහැනිව භාරයේ අතිරික්ත මුදල් වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකගතාවයක් ලබාගත යුතු වුවද එසේ නොමැතිව 2020 දෙසැම්බර් 31 දින වන විට රු.208,108,367 ක් ස්ථාවර තැන්පතු 4 ක ආයෝජනය කර තිබුණි. | භාරය පිහිටුවීමේ ඇති කරගත් ගිවිසුමේ 6(අ)(1) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | කළමනාකරණ භාරයේ තීරණයන්ට අනුව කටයුතු කර ඇත. | නිවැරදි කර නැත. |
| **(ඔ)** | 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුවේ අංක 8(ඊ) ඡේදයේ විධිවිධානවලට පටහැනිව අමාත්‍යාංශයේ ලේකම් විසින් භාරයේ සභාපති ලෙස මසකට රු.35,000 ක් බැගින් මාස 09 ක් සඳහා රු.315,000 ක් 2020 වර්ෂයේ දී ලබා ගෙන තිබුණි. | නීතියට පටහැනිව ලබාගෙන ඇති මුදල්, මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව අයකිරීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඕ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 261(1) ප්‍රකාර මුදල් පොත හා වවුචර් පිළියෙල කර නොතිබූ අතර 446(2) ප්‍රකාරව මුදල් පොතේ සටහන් හා ශේෂයන්වල නිවැරදිභාවය සනාථ කර නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |
| **(ක)** | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 876(3) ඡේදය ප්‍රකාරව ව්‍යාවස්ථාපිත නොවන කිසියම් අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නිතීගත කිරීමට හැකිවන පරිදි අදාළ හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළයුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනවන විටත් කළමනාකරණ භාරය පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යාවස්ථාපිත ආයතනයක් බවට පත්කරගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යාවස්ථාපිත ආයතනයක් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නැත. | නිවැරදි කර නැත. |
| **(ග)** | වෙළඳ සංකීර්ණය පිහිටුවා ඇති හෙක්ටයාර් 3.1776 ක විශාලත්වයෙන් යුත් ඉඩම භාරය පිහිටුවා ඇති දින සිට 2020 වර්ෂය දක්වා භාරයට | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම භාරයට පවරා ගත යුතු බව. | අදාල පැවරීම් කටයුතු අවසන් වී නැත. | එසේම පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| | පවරාගැනීම සිදුකර නොතිබුණු අතර, එසේ පවරානොගෙන එම භූමියේ සිදුකර තිබුණු ඉදිකිරීම්වල වටිනාකම **රු.1,688,741,540 ක් විය.** | | | |
| **(ච)** | 2020 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ බදු ආදායම් ශේෂය රු. 74,943,439 ක් වූ අතර එම ශේෂය තුල වසර 5 ක කාලයක සිට ධීවර සංස්ථාවෙන් ලැබිය යුතු රු. 17,402,781 ක් ද වසර 3 ක කාලයක සිට ශීතාගාරයකින් ලැබිය යුතු රු.8,075,000 ක් ද හිඟ බදු කුලී අයවීමට තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | මාසික බදු කුලිය ඊළඟ මාසය අවසානයට පෙර ගෙවිය හැකිවන ලෙස සංශෝධනය කර ඇති බවත් කුලී පැහැර හරින අවස්ථාවලදී සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු කර හිඟ මුදල හා දඩ අයකර ගැනීමට කටයුතු කරන බව. | එසේම පවතියි. අය වී නොමැත. |
| **(ඡ)** | කාර්ය මණ්ඩලය අනුමත වී වසර 05 කට ආසන්න වුවත් හාරයේ කළමනාකරු, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පරිපාටි අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | භාරය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය පුරප්පාඩු වූ තනතුරුවලට බඳවා ගැනීම් කළ යුතු බව. | ධීවර අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් බැවින් වඩා මූල්‍යාමය වාසිදායක ලෙස කළමනාකරණ භාරයේ අනුමැතිය මත නිලධාරීන් දෙදෙනා පත්කර ඇති බව. | එසේම පවතියි. නිවැරදි වී නැත. |
| **(ට)** | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයට අදාලව උද්ගතව ඇති පාරිසරික ගැටලු සම්බන්ධව මධ්‍යම පරිසර අධිකාරිය | ලබා දී ඇති උපදෙස් ඉතා ඉක්මණින් සම්පූර්ණ කර පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුය. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීම සඳහා මේ වනවිට කටයුතු සකස් කරමින් පවතින | වර්තමානයේ තත්ත්වය වෙනස් වී නොමැත. වර්ෂයකට අපජල ලීටර් 98,190 ක් ජල මූලාශ්‍රවලට මුදාහරිනු ලබයි. නව අපජල පවිත්‍රාගාරයක් ඉදිකරමින් |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත යොමු කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමේ අයදුම්පත් 2014 මාර්තු 18 දින ඉදිරිපත් කර තිබුණ ද ඒ සඳහා වර්ෂ 6 ක් ඉක්මගොස් ඇතත් එම අධිකාරිය ලබාදී ඇති උපදෙස් ප්‍රකාරව අපිරිසිදු ජලය පිරිසිදු කර(Treatment Plant) මුදාහරින මාර්ග පද්ධතිය හා කාණු පද්ධතිය සඳහා අවශ්‍ය නිවැරදි පියවරයන් නොගැනීම හේතුවෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | | බව. | පවතී. එය ද වසරකින් අවසන් කළ යුතු වුවත් මාස 9 ක ප්‍රගතිය සියයට 20 ක් පමණ වේ. |
| **(ඞ)** | වෙළඳසැල් 154 කින් යුත් තොග වෙළඳ සංකීර්ණයට අමතරව වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයක් ද ඉදිකර තිබුණි. එයින් වෙළඳසැල් 64 ක් රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණ ද 2020 දෙසැම්බර් 31 දින වන විට කිසිදු වෙළඳ සැලක් අලෙවි කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | වෙළඳ සැල් අලෙවි කටයුතු සඳහා යොදාගෙන සිල්ලර මත්ස්‍ය වෙළඳාම වැඩි දියුණු කිරීමට උපක්‍රම යෙදිය යුතු බව. | සිල්ලර අංශයේ තොග හා සිල්ලර වෙළඳ කුටි බහුතරයක් බදු දී ඇති අතර, මාසික බදු මුදල දිගින් දිගට නොගෙවන විට වෙළඳ කුටි තැන්පත් මුදල භාරයට පවරාගෙන වෙනත් පාර්ශවයන්ට නැවත බදු දෙනු ලබන බව. | එසේම පවතියි. නිවැරදි වී නොමැත. |
| **(ඬ)** | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.3 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ද සමඟ | ඉකුත් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන ද නියමිත දිනට ඉදිරිපත් කර නොමැති හෙයින් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන | කොරොනා වසංගතය හේතුවෙන් නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වු බව දන්වා ඇත. | ඉකුත් වර්ෂව සඳහාද මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂයේ ගිණුම් වාර්තාද මේ දක්වා ලැබී නොමැත. |

| | |
|---|---|
| කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ට ද පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 කට පසු 2021 ජූලි 21 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව. |

37. විගණන අස්තිත්‍වයේ නම - **සේවක අර්ථසාධක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | -------------------- | ----------------- | -------------------- |
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත් අරමුදල ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උපලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් වටිනාකම රු.මිලියන 456.31 ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය නිවැරදිව සමාලෝචනය නොකිරීමෙන් සිදුවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු | ප්‍රමිතිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව | ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගනනය කිරීමට කටයුතු කරන බව. | ජංගම නොවන වත්කම් සඳහා ප්‍රත්‍යාගනනයක් සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ආ) | අරමුදල විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 08 කට අදාළව 2020 දෙසැම්බර් 31 දිනට සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශවලට අනුව වසර 01 සිට වසර 19 ක් දක්වා වූ කාල පරාසයක් ඇතුළත අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර/බැර හා හඳුනානොගත් අනෙකුත් ශේෂ ලෙස එකතුව රු.මිලියන 11,241 ක් ද, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් එකතුව රු.මිලියන 456 ක් ද, භාවිතා කරන පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.මිලියන 141 ක් ද ලෙස රු.මිලියන 11,838 ක් වූ නිරවුල් නොකරන ලද ශේෂ පැවති නමුත් මෙම අයිතම හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් වන නිරවුල් නොකරන ලද ශේෂ හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු බව. | මේ සම්බන්ධයෙන් විශේෂ ව්‍යාපෘතියක් 2020 ජනවාරි මාසයේදී ආරම්භ කර ඇති බව. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශේෂ නිරවුල් කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රමාදයක් නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව දේපළ, පිරියත හා උපකරණවල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන 996.2 ක් වුවත් අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලියන 571.28 ක් වශයෙන් රු.මිලියන 424.92 ක වෙනසක් නිරීක්ෂණය විය. | ස්ථාවර වත්කම් වල නිවැරදි වටිනාකම අදාල සියලුම උපලේඛන අනුව ද තහවුරු වන පරිදි නිවැරදි සංඛ්‍යා දත්ත ඇතුළත් කළයුතු බව. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර නොමැත. |
| (ඈ) | එකතු වටිනාකම රු.මිලියන 996.2 ක ස්ථාවර වත්කම් සඳහා මූලික තොරතුරු ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොමැති වීමෙන් ස්ථාවර වත්කම්හි කේත අංකය, මිලදී ගත් දිනය, පිරිවැය, වත්කම් ස්ථාපිත කර ඇති ස්ථානය ආදිය සඳහා ලිඛිත සාක්ෂි නොවීය. | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පැවැත්වීම හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කළ යුතු බව. | ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරියේදී නඩත්තු කරන බව. | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොමැත. |
| (ඉ) | 2011 අප්‍රේල් 29 දිනැති අංක 2011/06 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 වන වගන්තිය ප්‍රකාරව කාර්යාලයට පැමිණිල්ලක් ලැබී දින 14 ක් ඇතුළත එය විභාග කිරීමට පියවර ගතයුතු වුවත්, දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට 2019 හා 2020 වර්ෂවලදී ලද පැමිණිලි වලින් පිළිවෙලින් පැමිණිලි 112 හා 394 ක් 2021 මාර්තු විගණන දින | පැමිණිලි සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ලබා දිය යුතු බව. | පැමිණිලි අධිකව ලැබෙන බල ප්‍රදේශ වලට අයත් පැමිණිලි වෙනත් බල ප්‍රදේශ භාර කම්කරු නිලධාරීන් වෙත යොමුකර පරීක්ෂණ වේගවත් කිරීම හා පුහුණුව සඳහා අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් යොදවා පැමිණිලි සම්බන්ධ කාර්යාල කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරනු | තවදුරටත් ප්‍රමාදයන් නිරීක්ෂණය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වන විටත් විභාග කර අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | | ලබන බව. | |
| (ඊ) | 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව දකුණු කොළඹ හා බටහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල විසින් 2019 හා 2020 වර්ෂවලදී හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා සේවායෝජක ආයතන වෙත අවසන් නිවේදන නිකුත්කළ අවස්ථා පිළිවෙලින් 190 ක් හා 224 කට අදාලව රු.මිලියන 146. 78ක් හා රු.මිලියන 256.12 ක් වූ දායක මුදල් හා අධිභාර 2021 මාර්තු 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණු අතර ප්‍රමාද කාලය මාස 3 ක සිට වර්ෂ 02 ක් අතර කාලපරාසයක විය. | හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමේ කටයුතු කාර්යක්ෂම අයුරින් ඉටුකිරීමට කටයුතු කළ යුතු බව. | විෂය නිලධාරින්ට දෛනිකව අධික වැඩ ප්‍රමාණයක් පැවරී ඇති බැවින් දිනකදී සියළුම බල ප්‍රදේශවල අවශ්‍යතා ඉටු කිරීමට විෂය ලිපිකරුවන් තිදෙනෙකුගෙන් සමන්විත දෛනික චක්‍රිය කණ්ඩායමක් ක්‍රියාත්මක කර ඇති බව. | හිඟ දායක මුදල් හා අධිභාර අයකර ගැනීමේ කටයුතු වල තවදුරටත් ප්‍රමාදයන් නිරීක්ෂණය වේ. |
| (උ) | 2002 මැයි 20 දිනැති අංක 08/2002 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ ලියාපදිංචි අංකය, ආයතනයේ නම, ලිපිනය, ව්‍යාපාරයේ ස්වාභාවය, සේවක සංඛ්‍යාව හා අවසන් වරට පරීක්ෂා කළ දිනය ඇතුලත් ආයතන ලේඛනයක් නඩත්තු කල යුතු වුවත් | චක්‍රලේඛ විධිවිධාන පරිදි ආයතන පරීක්ෂණ ලේඛනයක් පැවැත්වීම මගින් පරීක්ෂණ කාල පරාසයන් නිමානය කිරීම හා නිලධාරී කාර්යක්ෂමතාවයන් මැනීම අවශ්‍ය බව. | ඉදිරියේදී ආයතන ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | ආයතන ලේඛනයක් පවත්වාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මැද කොළඹ, බටහිර කොළඹ හා දකුණු කොළඹ යන දිස්ත්‍රික් කම්කරු කාර්යාල විසින් එබඳු ආයතන ලේඛන පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඌ) | 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව 2019 හා 2020 වර්ෂවලට අදාලව ආයතන පරීක්ෂණ කටයුතු සිදුකර අධිභාර හා දායක මුදල් අයකර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කිරීම සඳහා දින 20 ක සිට දින 455 ක් දක්වා වූ කාලයක් ගතවී තිබූ අවස්ථා 51 ක්ද, අවසන් නිවේදනය නිකුත් කිරීම සඳහා දින 20 ක සිට දින 563 දක්වා කාලයක් ගත වී තිබූ අවස්ථා 79 ක්ද දකුණු කොළඹ හා බටහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, අවස්ථා 39 කට අදාලව අවසන් නිවේදන නිකුත් කර නොතිබුණු අතර අවස්ථා 68 කට අදාලව කිසිදු නිවේදනයක් නිකුත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිවේදන නිකුත් කර දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. | විෂය නිලධාරින්ට දෛනිකව අධික වැඩ ප්‍රමාණයක් පැවරී ඇති බැවින් දිනකදී සියළුම බල ප්‍රදේශවල අවශ්‍යතා ඉටු කිරීමට විෂය ලිපිකරුවන් තිදෙනෙකුගෙන් සමන්විත දෛනික චක්‍රිය කණ්ඩායමක් ක්‍රියාත්මක කර ඇති බව. | තවදුරටත් ප්‍රමාදයක් නිරීක්ෂණය වේ. |
| (එ) | අරමුදලේ සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීමේ සහ ගිණුමේ ශේෂ පරික්ෂා කිරීම සඳහා යන්ත්‍ර සවි | සාමාජික අරමුදල් ආදායම් මඟින් වියදම් දැරීමේදී මනා ලෙස සකසන ලද සැලසුම් | මෙම යන්ත්‍ර නැවත ප්‍රධාන කාර්යාලයට රැස්කර ප්‍රයෝජනයට ගත හැකි කොටස් | අදාල යන්ත්‍ර අපහරණය සඳහා කටයුතු කර නොමැත. සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම |

කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2008 වර්ෂයේදී රු.මිලියන 2.75 ක් වැය කර මිලදී ගත් යන්ත්‍ර 5 ක් මිලදී ගත් දින සිට ඌන උපයෝජිතව පැවති අතර ඉන් යන්ත්‍ර 2 ක් 2020 සැප්තැම්බර් 17 දින අපහරණය කර තිබුණි. ඉතිරි යන්ත්‍ර සම්බන්ධයෙන් විගණන දින වන විටත් තීරණයක් ගෙන නොතිබුණි. සාමාජිකයන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා 2008 වර්ෂයේදී රු.මිලියන 12.61 ක් වැය කර සකස් කරන ලද කාඩ්පත් 15,000 ක් නිෂ්කාර්යව පරිගනක අංශය තුළ පැවතුණි. කාඩ්පත් ගබඩාකර වසර 12 ක් පමණ ගතවී ඇතත් ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර එම වියදම අරමුදලට අලාභයක් වී තිබුණි. තවද, හැඳුනුම්පත වෙනුවට සාමාජිකයාගේ ඇඟිලි සලකුණු භාවිතයෙන් ශේෂය පිරික්සීම සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 14.92 ක් වැය කර යන්ත්‍ර 30 ක් මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රයෙන් ශේෂය පරීක්ෂාකර ගැනීම සඳහා සාමාජිකයාගේ ඇඟිලි සලකුණු නැවත ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ පරිගණක ගත වි තිබිය යුතු වුවත් එසේ ලියාපදිංචි වූ

අනුව කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම් ලෙස කටයුතු කිරීම අරමුදලේ භාරකාරීත්වය දරන කළමනාකරණයේ වගකීම බව.

භාවිතයට ගැනිමට තිරණය කර ඇති බව.

සඳහා මුද්‍රණය කරන ලද කාඩ්පත් ද තවදුරටත් නිෂ්කාර්යව පවතී.

| | | | | |
|---|---|---|---|---|
| | සාමාජිකයන් සංඛ්‍යාව 2020 දෙසැම්බර් 31 දිනට 1,053,342 ක් පමණක් වීමත්, එම ව්‍යාපෘතියද සාර්ථකව ක්‍රියාත්මක නොවීමත්, 2019 මාර්තු 01 දින වන විට යන්ත්‍ර 13 ක් අක්‍රීයව පැවතීමත් යන කරුණු මත යන්ත්‍ර භාවිතයෙන් ඉවත් කිරීමට තීරණය කර තිබුණි. යන්ත්‍ර 30 අපහරණය කිරීමට තීරණය කර තිබුණද, 2021 අප්‍රේල් විගණන දින වන විටත් අදාල යන්ත්‍ර ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට අසමත් වීමෙන් ව්‍යාපෘතියේ සමස්ත පිරිවැයම අරමුදලට අලාභයක් වී තිබුණි . | | | |
| (ඒ) | ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයන් රු.මිලියන 5,000 ක් හෙවත් සියයට 56 ක් 2013 වර්ෂයේදී කැන්විල් හෝල්ඩින්ග්ස් හෝටල් සංකීර්ණය ඉදිකිරීම සඳහා ආයෝජනය කර තිබූ නමුත් 2020 වර්ෂය අවසානය වන විටත් එහි ව්‍යාපාර කටයුතු ආරම්භකර නොතිබූ අතර එම සමාගමේ කොටස්, කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර නොතිබුණි. සමාගමේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ ලබාදීමට හැකිවන පරිදි අවධානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කළ යුතු බව. | ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව. | අදාල හෝටල් සංකීර්ණයෙහි ව්‍යාපාරික කටයුතු ආරම්භ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දැමීමට රජය තීරණය කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයා විසින් දන්වා තිබුණි. මේ නිසා එම ආයෝජන සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තවද, 2020 වර්ෂයේ දී "ද ෆිනෑන්ස් සමාගමේ" බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් රු.මිලියන 205 ක් ද අරමුදලට අහිමි වී තිබුණි. | | | |
| (ඔ) | සාමාජිකයන් ලෙස පෙනී සිටිමින් ව්‍යාජ පුද්ගලයන් විසින් ප්‍රතිලාභ මුදල් නිදහස් කරගෙන තිබූ අවස්ථා 64 ක් හඳුනාගෙන තිබූ අතර එයින් අවස්ථා 61 ක් වෙනුවෙන් 2004 නොවැම්බර් 04 සිට 2020 පෙබරවාරි 20 දක්වා අරමුදලට වැය බරක් වන ලෙස රු.52,316,484 ක් ගෙවා තිබූ අතර අවස්ථා 3 කට අදාළව රු.3,393,727 ක මුදලක් තවදුරටත් ගෙවීමට පැවතුණි. එම අවස්ථා සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීමට හා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වුවහොත් ඔවුනට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට අරමුදල කටයුතු කර නොතිබුණි. | වංචා සහගත ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පරීක්ෂණ පවත්වා අභ්‍යන්තර නිලධාරීන්ගේ විෂමාචාරයක් සිදු වී තිබේ ද යන්න අනාවරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව. | අනු පිටපත් නිකුත් කිරීම නවතාලීමට කටයුතු කිරීම, ප්‍රතිලාභ ගෙවීම් අංශයෙහි නිලධාරීන් දැනුවත් කිරීම, තොරතුරු පද්ධතියෙහි පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒ අනුව ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පැමිණෙන සෑම සාමාජිකයෙකුගේම ඡායාරූපයක් හා ඇඟිලි සලකුණු එම අවස්ථාවේ දී ලබා ගැනීම, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමග මාර්ගගත සම්බන්ධතාවය ඇතිකර ගැනීමට කටයුතු කිරීම ආදී පියවර ගෙන ඇති බව හා වංචා සහගත | මේ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොමැති අතර තොරතුරු පද්ධතියෙහි පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රමාණවත් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇති බව. | |
| (ඕ) | සාමාජිකයින්ගේ දායක මුදල් සම්බන්ධයෙන් 2013 වර්ෂයේ දී සියයට 11 ක ප්‍රතිශතයකින් ගෙවන ලද ප්‍රතිලාභ අනුපාතය 2014 වර්ෂය වන විට සියයට 10.5 ක් දක්වා පහළ ගොස් තිබුණි. 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නොකඩවා එම අනුපාතය පවත්වාගෙන ගොස් තිබුණද, 2018 වර්ෂයේ සිට ක්‍රමයෙන් එය පහත වැටී තිබූ අතර 2020 වර්ෂයේදී එම අනුපාතය සියයට 9 ක් දක්වා අඩු වී තිබුණි. | සාමාජිකයින්ට ඉහළ ප්‍රතිලාභ ලබාදීමට හැකිවන පරිදි කටයුතු කළ යුතු බව. | අදාල වර්ෂයේ ආදායම, වියදම, සාමාජික ශේෂය හා වෙළඳපොළ සාමාන්‍ය පොලී අනුපාතිකයේ හැසිරීම යනාදී වූ කරුණු සැලකිල්ලට ගෙන පොලී අනුපාතය තීරණය ඉටුකිරීමට කටයුතු කරනු ලබන බව. | 2021 වර්ෂයේ සඳහා සාමාජිකයන්ට සියයට 9 ක ප්‍රතිලාභ අනුපාතයක් ගෙවා ඇත. |
| (ඖ) | පළමු අදියර 2007/2008 වර්ෂයන්හිදී ද, දෙවන අදියර 2010/2011 වර්ෂයන්හි දී ද, තෙවන අදියර 2016/2017 වර්ෂයන්හිදී ද, ක්‍රියාත්මක කර තිබුණු සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තුව මත මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන රු.247,153,011 ක සමස්ථ වියදමක් දරා තිබුණි. එසේ | සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම් ලෙස කටයුතු කර අදාළ ප්‍රගතිය අත්කර ගැනීමට අවධානය යොමුකළ යුතු වීම. | සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වසරේ සිට ප්‍රතිපාදන වෙන් කර ගැනීමක් සිදු නොකල අතර, එහෙත් ඉදිරියේ දී ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමේ දී වඩාත් කාර්යක්ෂමව, ඵලදායීව හා සකසුරුවම් ලෙස සාමාජික අරමුදල් වැය කිරීමට හා ඒ අනුව උපරිම ප්‍රගතියක් අත්කර ගැනිමට හැකි වන | 2021 වර්ෂය සඳහා නැවත ලියාපදිංචි කල සාමාජිකයන් ගණන 9,880 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට සාමාජිකයන් 1,070,218 ක් නැවත ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක කරා ලගා වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වුවද, ඇඟිලි සලකුණු ලබාගත් සාමාජිකයන් ගණන ඇස්තමේන්තුගත සාමාජිකයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස පළමු, දෙවන හා තෙවන අදියරයන් යටතේ පිළිවෙලින් සියයට 38 ක්, සියයට 25 ක් හා සියයට 14 ක් වූ බැවින් ලබාගෙන තිබුණු ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. | | පරිදි කටයුතු කරන බව. | |
| (ක) | ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සාමාජිකයන් විසින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල 18කට 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර තිබූ ප්‍රතිලාභ අයදුම්පත් අතරින් රු.17,923,106 ක් අයදුම්කර තිබූ අයදුම්පත් 112 ක් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමෙන් අනතුරුව විවිධ හේතු මත ප්‍රතික්ෂේප කර තිබුණි. එම අයදුම්පත් අතරින් අයදුම්පත් 90 ක් (සියයට 80ක්) සම්බන්ධයෙන් ඒවා ඉදිරිපත් කරන ලද දින සිට 2019 මාර්තු 01 දක්වා ගත වී තිබූ කාලය මාස 06 සිට අවු.03 ට වැඩි වී තිබුණද ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සාමාජිකයන්ට ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභ ලබාදීමට හැකි සෑම පියවරක්ම ගතයුතු වීම. | රාජ්‍ය අංශයේ වතු සේවකයන්ගේ ලියාපදිංචියට අදාල දත්තයන් නිවැරදි කිරීම සම්බන්ධයෙන් ආරම්භ කර ඇති නියමු වැඩසටහනෙහි ප්‍රගතිය අනුව එම වැඩසටහන අනෙකුත් ක්ෂේත්‍රයන් වෙත ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම, සාමාජිකත්වය හඳුනා ගැනීමට අපහසු ප්‍රතිලාභ ගොනු හා කල්ගත වූ ගොනු කමිටුවක් වෙත ඉදිරිපත් කර නිරාකරණය කිරීමට කටයුතු කිරීම, පළාත් මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සේවකයින් ලියාපදිංචි කිරීමේ දී හා දායක මුදල් යොමු කිරීමේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට | නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර කම්කරු නිලධාරීන් මගින් සේවායෝජකයින් දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් සකස් කළ ද, 2020 වර්ෂයේ ආරම්භයේ සිටම පැතිර ගිය **Covid -19** වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි සැලසුම් ක්‍රියාවට නැංවීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සේවායෝජකයින් දැනුවත් කිරීම ආදී පියවර ගෙන ඇති බව. | |
| (ග) | ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව 2018 වර්ෂය අවසාන වන විට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය ලෙස වාර්තා වී ඇති 3,727,217 කින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ලබාගෙන ඇති සක්‍රිය සාමාජික සංඛ්‍යාව 2,559,319 ක් හෙවත් සියයට 68.7 ක් විය. අනෙකුත් අනුමත අර්ථසාධක අරමුදල්වල සාමාජිකත්වය දරන සේවක සංඛ්‍යාව සියයට 9.7 ක් පමණක් වීමෙන් ඉතිරි සියයට 21.6 ක් වූ ප්‍රමාණය කිසිදු අරමුදලකට දායකත්වයක් දරා නොතිබුණි. මොවුන්ට අරමුදලේ සාමාජිකත්වය ලබාදීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය යුතු බව නිරීක්ෂණය විය. | පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් උපරිම සංඛ්‍යාවකට අරමුදලේ සාමාජිකත්වය ලබාදිය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි ආයතනයේ අවධානය යොමු කර වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව. | අරමුදලෙහි ලියාපදිංචි වීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය මගින් හා ජංගම සේවා මගින් සේවකයින් දැනුවත් කිරීමටත් කම්කරු නිලධාරීන් මගින් සේවායෝජකයින් දැනුවත් කිරීමටත් කටයුතු කරන බව. තවද, සෑම සේවායෝජකයෙකු විසින්ම සේවා නියුක්තිකයෙකු බඳවා ගැනීමේ දින සිට දින 30 ක් ඇතුලත අරමුදලේ ලියාපදිංචි කළ යුතු ලෙස සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනයක් කර ඇති බව. | වර්තමානයේ පවතින Covid -19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් ඉහත ජංගම සේවා හා කම්කරු නිලධාරී ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් සිදු කරනු ලබන දැනුවත් කිරීම් සිදු කිරීම අවම මට්ටමක පවතී. |
| (ච) | සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි නොවී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වී තිබූ සේවායෝජකයින් සංඛ්‍යාව 2018 දෙසැම්බර් 31 දිනට 14,156 ක් වූ අතර එම සේවායෝජකයන්ගෙන් එදිනට සේවා | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ පමණක් ලියාපදිංචි වී ඇති (ස්වයං රැකියා නියුක්තිකයන් නොවන) සාමාජිකයන්ට සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලබාදීම | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ඇති සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය වන සේවකයින් හඳුනාගෙන ඔවුන් | මේ සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ලැබී තිබූ දායක මුදල්වල එකතුව රු.148,366,135 ක් විය. ඒ අනුව එම සේවායෝජකයන් අරමුදලේ ලියාපදිංචි කර ගැනීමට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සමග එක්ව සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව. | සේවක අර්ථසාධක අරමුදලෙහි ලියාපදිංචි කරවීම සඳහා කාර්යාලීය මට්ටමින් සේවා යෝජකයින් දැනුවත් කිරීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | |
| (ජ) | 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සාමාජික අරමුදල තුල කම්කරු කොමසාරිස් නමින් පැවති ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන තිබූ රු.මිලියන 10,486 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබූ රු.මිලියන 453 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, සේවා යෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 65,865 ක ශේෂයක් අදාළ සාමාජිකයන් හඳුනාගෙන | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමට කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කළ යුතු බව. | 2020 ජුනි මස සිට දිස්ත්‍රික් කම්කරු කාර්යාල විසින් අධිකරණයෙහි පවරන ලද නඩු පිළිබඳ තොරතුරු ආකෘති 02 ක් මගින් සේවක අර්ථසාධක අරමුදලෙහි අය කිරීම් අංශය වෙත ලබා ගැනීමට ක්‍රියා මාර්ග ගෙන ඇති බව, රඳවාගත් ප්‍රතිලාභ ගිණුමෙහි ශේෂය ඉහළ යාමට විසඳුමක් ලෙස මිය ගිය සාමාජිකයන්ගේ නාමිකයන්ට තානාපති කාර්යාලය මගින් සහතික කරවා ගෙන ප්‍රතිලාභියාගේ ඉල්ලීම් ලිපියක් ද සමඟ භාර ගැනීම කෙරෙහි අවධානය යොමුව ඇති බව සහ මෙම මුදල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන | 2021 දෙසැම්බර් මස 31 කම්කරු කොමසාරිස් නමින් වූ ගිණුමෙහි රු.මිලියන 11,456 ක ද, පොදු තැන්පත් ගිණුමේ රු.මිලියන 302 ක ද, ශේෂයක් පැවතුණි. තවද "ජංගම වර්ෂයේ දායක මුදල් 01" ගිණුමේ රු.මිලියන 70,833 ක ද, රඳවා ගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ ගිණුමේ රු. මිලියන 956 කද, ඌන/අතිරික්ත දායක මුදල් ගිණුමේ රු.මිලියන 2117 ක ද, ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් ගිණුමෙහි රු. මිලියන 353 ක ද, නිරවුල් නොවූ ශේෂයන් තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 925 ක් ද ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 1,984 ක් ද ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු. මිලියන 682 ක් ද සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br>ඉහත සඳහන් සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභාව මඟින්ද නියෝගකර තිබුණි. | | පිළිබඳව නීති උපදෙස් විමසා ඇති බව. | |
| (ට) | සාමාජිකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබූ ඡායාරූප හා ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු Quick Cam Camera 12 ක්, 2019 වර්ෂයේදී රු.1,725,375 ක් වැයකර මිලදීගෙන තිබූ Quick Cam Camera 50 ක් හා 2018 වර්ෂයේදී | නිසි අවශ්‍යතා හඳුනා ගැනීමෙන් අනතුරුව වත්කම් මිලදීගත යුතු අතර ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව. | 2017 වර්ෂයේ මිලදී ගත් උපාංග තොගය භාවිතා කරමින් උපාංග කට්ටල 15 ක් සම්පූර්ණ කර එම උපාංග කට්ටල කලාප කාර්යාලවලට බෙදා හැරීමට කටයුතු කර ඇති බව. | 2017 හා 2019 වර්ෂයන්හිදී මිලදී ගත් Logitech Quick Cam 62 න් කැමරා 41 ක් හා 2017 වර්ෂයේ දී මිලදී ගත් Laptop පරිගණක 24 න් 2 ක් තව දුරටත් නිශ්කාර්යව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.3,261,600 ක් වැය කර මිලදීගෙන තිබූ Laptop පරිගණක 24 ක් 2019 වර්ෂය අවසන් වන විට බෙදා නොහැර ගබඩාවේ නිශ්ක්‍රියව පැවතුණි. | | | |
| (ඩ) | මෙහෙවර පියස කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර නිර්මිත (Interior Partitions) සැකසීමේ කාර්යය වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.මිලියන 135.3 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමතකර එම සම්පූර්ණ මුදලම 2020 දෙසැම්බර් 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 4.3.1 සහ 4.3.2 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහා සහ මාර්ගෝපදේශ අංක 2.14.1 ප්‍රකාරව අදාල දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මාර්ගෝපදේශ අංක 8.9.3 ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුමකට ද එළඹ නොතිබුණි. එසේම, | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින්ද, අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් උපයෝජනය කරමින්ද ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු බව. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කරන බව. | මෙහෙවර පියස කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර නිර්මිතයන් සැකසීමේ කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගෝපදේශ අංක 5.4.4 (i) ට පටහැනිව සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම කටයුතු ආරම්භ කිරීමට පෙර ගෙවා තිබුණු අතර මාර්ගෝපදේශ අංක 5.4.6 (ආ) ප්‍රකාරව රඳවා ගැනීමේ මුදලක් තබාගෙන නොතිබුණි. තවද, 2021 මාර්තු 31 දින වන විටත් අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | | | |
| (ත) | කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීමේ උපාය මාර්ගය යටතේ ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදල් අංකය බවට පත් කිරීමේ හා ඇඟිලි සලකුණු ලබාගැනීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට සැලසුම් කර තිබූ නිතිරීති සම්පාදනය කිරීම, දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීම, නියමු ව්‍යාපෘතියක් (Pilot Project) දියත් කිරීම හා ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදල් අංකය ලෙස ලියාපදිංචි කිරීම යන ක්‍රියාකාරකම් 2018 වර්ෂයේදී ඉටුකර | ක්‍රියාකාරී සැලැස්ම තුළ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීමට කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු බව. | නීති, රෙගුලාසි සම්පාදනය කිරීමට අමතරව දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය තාක්ෂණික ධාරිතාවය වැඩිදියුණු කිරීම ද සිදු කළ යුතු බැවින්, ඒ සඳහා අදාළ අධ්‍යයනයන් මේ වන විට සිදු කරමින් පවතින බව. | ජාතික හැඳුනුම්පත් අංකය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් හඳුනා ගැනීමේ ප්‍රමුඛ දත්තය බවට පත් කිරීමේ ක්‍රියාවලිය සිදු කර නොමැත. |

නොතිබුණි.

| | | | | |
|---|---|---|---|---|
| (ද) | 2016 පෙබරවාරි 26 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී ලබා දුන් අංක 9 දරන නිර්දේශ අනුව, අරමුදලේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ වී එක් පරිගණක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව පිළිබඳව වාර්තාවක් 2016 මාර්තු 23 දිනට පෙර කාරක සභාවට යොමු කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් රජයට ලබාදෙන ණය ප්‍රතිපාදනයක් යටතේ ක්‍රියාත්මක වන ප්‍රාග්ධන වෙළඳපල දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීමට එකඟතාවය ලබාදී ඇති බවත් ඒ යටතේ ඒකාබද්ධ නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරී විසින් විගණනය වෙත වාර්තා කර තිබුණි. එසේ වුවද එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ණය ගිවිසුම, ව්‍යාපෘති වාර්තාව හා ව්‍යාපෘති සැලැස්ම ආදී | රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් ඒවායේ ප්‍රගතිය සහ අනෙකුත් අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතු බව. | ප්‍රාග්ධන වෙළඳපල දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිම කිරීමට අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචන ක්‍රියාවලිය අදියර දෙකක් යටතේ සිදුකර අවසන් අතර එහි නිරීක්ෂණයන් ඇතුළත් වාර්තාව සේවක අර්ථසාධක අරමුදල වෙත ලබාදී ඇති බව. | කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ වී ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින් එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | | | |
| (න) | සේවක අර්ථසාධක අරමුදලට ස්වාධීන වූ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැති අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කර තිබුණි. අරමුදලේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 14 ක් හා තථ්‍ය සංඛ්‍යාව 09 දෙනෙකුට සීමාවී තිබුණි. අරමුදල විසින් රු.ට්‍රිලියන 2.8 ක පමණ සාමාජික අරමුදලක් කළමනාකරණ කරනු ලබන බැවින් අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත් කළ යුතු බව නිරීක්ෂණය කෙරේ. දෙපාර්තමේන්තුව සතුව ප්‍රාදේශීය කාර්යාල 57 ක් පැවතීම හා සිදුවන ගනුදෙනුවල ප්‍රමාණය අනුව තත්‍ය සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීමෙන් සේවක අර්ථසාධක අරමුදලේ | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු බව. | මුදල් මණ්ඩලයෙහි සාමාජිකයෙකු විසින් සහභාගීත්වය දරන උපදේශාත්මක විගණන කමිටුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ විගණන කටයුතු සමාලෝචනය කිරීමට පියවර ගෙන ඇති බව. | කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු සම්පූර්ණ කර නොමැති අතර සේවක අර්ථසාධක අරමුදලට අදාල අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොමැත. |

විගණන කටයතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට අවස්ථාව නොමැති බව නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළයුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම් වලදී නියෝග කර තිබුණද, ඒ අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. එසේම, අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම හා සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

38. විගණන අස්තිත්‍යයේ නම - **පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ විගණන මතය

2019 - තත්ත්වාගණනය කළ විගණන මතය

2020 - තත්ත්වාගණනය කළ විගණන මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ------------------------- | ------------------- | ------------------------- | ---------------------- |
| (අ) | 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත දීමනා ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත විමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවිම නිසා 1993 සැප්තැම්බර් 03 දින සිට අරමුදලට නව සාමාජිකයින් එකතු විමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජිකයින්ගේ මුදල් එකතු නොවීම හා සිටින සාමාජිකයින්ගේ දායකය විශ්‍රාම වැටුප් ගෙවිමට තරම් ප්‍රමාණවත් නොවිම නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් විශ්‍රාම වැටුප් වියදම් දරා තිබූ අතර 2019 | අරමුදලේ පැවැත්ම පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදුකර කළමනාකරණය විසින් සුදුසු තීරණගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකල යුතු බව. | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම විශ්‍රාම වැටුප් වැය ශීර්ෂය යටතේ සිදු කරන බැවින් පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණ ඉටු වන බව. | අරමුදලේ පැවැත්ම පිළිබඳව තීරණයක් කළමනාකරණය විසින් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ එසේ දරන ලද වියදම රු.1,085,161,850 වී තිබුණි. මේ හේතුවෙන් අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණි. | | | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලට දායක මුදල් ගෙවනු ලබන පාලන ආයතන සංඛ්‍යාව 302ක් වූ අතර එම ආයතන වලින් අයකර ගත යුතු හිඟ දායක මුදල රු.1,143,420,252 ක් විය.එසේ වුවද,2020 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 256කින් විගණනයට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව,පලාත් පාලන ආයතන 97කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු.760,406,356 ක් වුවද,එම වටිනාකම පළාත් පාලන ආයතනවල ගෙවිය යුතු දායක මුදල් ලෙස දක්වා නොතිබුණි.තවත් පළාත් පාලන ආයතන 103කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු.278,494,348 වුවත් පළාත් පාලන ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු.184,054,767 ක් වූයෙන් රු.94,439,581 ක් වැඩියෙන්ද ,පළාත් පාලන ආයතන 22 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු.14,868,309ක් වුවත් එම පළාත් පාලන | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු අතර වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතු බව. | එක් එක් පළාත් පාලන ආයතන මගින් මාසිකව එවනු ලබන චෙක්පත් වල අගයන් අඩුකර පළාත් පාලන ආයතන වෙත මාසිකව බිල්පත් යැවීම මඟින් එම ආයතන ගෙවීමට ඇති මුදල් පිලිබඳ දැනුම් දීමක් සිදු කරනු ලැබේ.ඔබ විසින් පෙන්වා දී ඇති වෙනස්කම් සම්බන්ධයෙන් එම ආයතන වලින් විමසීම් සිදුකර වෙනසක් පවතී නම් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ අතර වෙනස්කම් මේ වන විටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතන මුල්‍යා අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු.19,567,394 ක් වුයෙන් රු.4,699,085ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | | | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට මුල්‍යා ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 302 කින් ලැබිය යුතු දායක මුදල් රු.1,143,420,252 ක් විය.එම ශේෂය සම්බන්ධයෙන් මුල්‍යා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව පළාත් පාලන ආයතන 88කින් ලැබිය යුතු රු.459,007,662 ක දායක මුදල් සම්බන්ධයෙන් වූ කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබුණි. | මාසිකව දායක මුදල් අයකරන බවට සුපරීක්ෂණය කල යුතු අතර හිඟ හිටි විශ්‍රාම වැටුප් දායක මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතු බව. | පළාත් පාලන ආයතන මඟින් ගෙවිය යුතු දායක මුදල් අයකර ගැනීමට මේ වන විටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒ අනුව පළාත් පාලන සේවා පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කරන මෙන් ඉල්ලා මුදල් කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීමක් කර ඇත.එමෙන්ම සියලු පළාත් පාලන ආයතන වෙත යැවෙන මාසික බිල්පත් මඟින්ද ගෙවීමට ඇති මුදල් පිලිබඳ දැනුම් දීමක් සිදු කරන අතර දුරකථන ඇමතුම් ලබා දීම මගින් ආයතන දැනුවත් කර මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. තවද මගේ අංක විවැ/ප/පා/ගි/ලිගො/02 හා 2021.11.03 දිනැති ලිපි මගින් 2020 වර්ෂයේදී කිසිදු දායක මුදලක් නොගෙවූ ආයතන වෙත ඒ පිළිබඳව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | පළාත් පාලන ආයතන මඟින් ගෙවිය යුතු දායක මුදල් අය කර ගැනීමට ක්‍රියා මාර්ග ගනිමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 අගොස්තු 28 දිනැති අංක 2/2018 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති 1/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15(2) (ආ) ඡේදය ප්‍රකාරව පසුගිය වසර 02 තුල ක්‍රියාත්මක නොවුනු යම් අරමුදල් පවතින්නේ නම් එකී අරමුදල් වල කටයුතු අවසන් කල යුතු බව හා අරමුදල් මගින් අපේක්ෂිත අරමුණු රජයේ අයවැය යටතේ ඉටු කර ගත හැකි නම් එකී අරමුදල් වල කටයුතු අවසක් කල යුතු බවද දක්වා තිබුණි.ඒ අනුව මෙම අරමුදලේ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසා ගෙන සිදු කරන බැවින් හා අරමුදල අක්‍රීය තත්වයේ පවතින බව ගිණුම් සටහන් අංක 04 මගින් හෙලිදරව් කර ඇතත් පවතින චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුබව. | මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවේ 2017 මාර්තු 31 දිනෙන් නිකුත් කරන ලද කමිටු වාර්තාවට අනුව පලාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ඇතුළු අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත.එසේ වුවත් එකී වාර්තාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්ති තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් පිලිබදව මෙතෙක් වාර්ථා වී නොමැති බව. | අරමුදල වසා දැමීමට යම් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් සිදුවී නොමැත. |

39 . විගණන අස්ථිත්‍යයේ නම - **ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය කළ විගණන මතය

2019- තත්ත්වාගණනය කළ විගණන මතය

2020- තත්ත්වාගණනය කළ විගණන මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | --------------------- | --------------------- | ----------------------- | ---------------------- |
| (අ) | පිරිවෙන් හා පෞද්ගලික / උපකෘත පාසැල්වල ගුරුවරුන්ගෙන් වැන්දඹු අනත්දරු දායකය හා ඔවුන් රාජ්‍ය නිලධාරීන් ලෙස පූර්ණ වශයෙන් පිළි නොගන්නා බැවින් විශ්‍රාම වැටුපට මාසික වැටුපෙන් සියයට 6 බැගින් වෙන වෙනම දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවිය යුතුය. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය ගිණුම් සාරාංශ මඟින් 2019 වර්ෂයේ දී පළාත් 3 ක් සඳහා බැර කරන ලද රු.137,818,157 ක්ද 2018 වර්ෂයේදි පළාත් 3 ක් සඳහා බැර කරන ලද රු. 66,918,348 ක මුදල් කුමන නිලධාරීන්ගේ කවර දායකත්වයක් ද යන්න හඳුනාගත නොහැකි විය. | මාසික ගිණුම් සාරාංශ මඟින් බැර කර ඇති මුදල් කුමන දායකත්වය සඳහා බැර කරන ලද්දේදැයි නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව. | දායක මුදලේ වර්ගීකරණයක් ගෙන්වා ගැනීමට මාගේ 2019.06.27 දිනැති විවැ/ගිදාමු/ටී.ඩබ්. පී/13/2019 දරන ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව අරමුදලට පිටපතක් සහිතව සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. මෙම කාර්යය සාර්ථක කර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාලයන්ගේද පූර්ණ සහාය දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු බව. | දායක මුදල් වර්ගීකරණයක් ගෙන්වා ගැනීමට ලිපි යවා ඇත. |
| (ආ) | දායක මුදල් හා වෙනත් ආදායම් රැස් කිරීම සහ දායක මුදල් ආපසු ගෙවීම් සඳහා අවසන් ගිණුමෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ශේෂය නාමික ශේෂයක් බව ගිණුම් සටහන් | එකඟ වෙමි. | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම්ගේ ගිණුම පවත්වාගෙන ගොස් තිබුණද, 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍ර යේ නිරූපණය කර තිබූ රු. 1,039,177,078 ක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ශේෂය නාමික ශේෂයක් බව නිරීක්ෂණය විය. | මගින් හෙළිදරව් කළයුතු බව. | | |
| (ඈ) | 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත නියෝග අංක 9(අ) එක් එක් ආධාර මුදල් ගෙවීමට සුදුසුකම් ලැබූ හා මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයන් පවත්වා නොතිබුණි. | දායක මුදල් ගෙවන්නන් පිළිබඳ විධිමත් තොරතුරු පද්ධතියක් පැවැත්වීම කලමනාකරණයේ වගකීම වන බව. | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි වූ පිරිවෙන් හා රජයේ ආධාර ලබන පෞද්ගලික පාසල් වල සේවය කරනු ලබන ගුරුවරුන් වෙනුවෙන් පාසලේ නමින් වෙන් වෙන් වශයෙන් ඔවුන්ගේ තොරතුරු ඇතුලත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් පවත්වාගෙන යනු ලබන බව. | එක් එක් දායක මුදල් ගෙවීම් වෙනුවෙන් කේවල ගිණුම් ක්‍රමයක් පවත්වා ගෙන යාම ප්‍රායෝගික නොවන බව පෙන්වා දුනි. |
| (ඇ) | නියෝග අංක 04 ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුයි. එසේ වුවද දායක මුදල් රැස් කිරිම හා ගෙවීම් කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට | පනතේ නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුබව. | 1953 වර්ෂය වන විට මෙවැනි අරමුදලක් පැවතීම අත්‍යවශ්‍ය වුවත් වර්තමාන රාජ්‍ය හා මූල්‍ය ප්‍රතිපත්ති විධිවිධාන අනුව මෙම අරමුදල අත්‍යවශ්‍ය නොවේ. පිරිවෙන් හා පෞද්ගලික පාසල් වල සේවය කරනු ලබන ගුරුවරුන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම වාර්ෂික විසර්ජන පනත මඟින් වෙන් වන ඒකාබද්ධ අරමුදලේ 253 දරන | නියෝග අංක 04 අනුව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල්වලින් අරමුදලක් ගොඩනගා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රැස්කර තිබීම හා උක්ත වියදම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම් කිරීමත් සිදු කර තිබුණි. | | විසර්ජන ශීර්ෂයෙන් සිදුවන බැවින් මෙම අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන නොයන අතර ලැබීම් ගෙවීම් සටහන් කිරීමට මුදල් පොතක් පවත්වා ගෙන යනු ලබන බව. | |
| (ඉ) | උපකෘත පාසලක, අරමුදලට සාමාජිකත්වය ලබා ගැනීම පිළිබඳ නියැදි පරීක්ෂාවකදී, වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ලබා දී තිබුනද, එම සාමාජිකයින් වෙනුවෙන් දායක සාමාජික අංක ලබාදී නොතිබුණි. | අරමුදලේ සාමාජිකයන්ට සාමාජික අංක ලැබීම පිළිබඳව සුදුසු වැඩපිළිවෙළක් සකස් කලයුතු බව. | වැන්දඹු අනත්දරු දායක සාමාජික අංකය ලබා දීම සම්බන්ධව දායක මුදල් අංශය කටයුතු නොකරන අතර එය අදාල නිලධාරියාගේ හා ඔහු සේවය කරන ආයතනයේ වගකීමකි. මේ පිළිබඳව නව චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව. | නිවැරදි කිරීම් කර නැත. |
| (ඊ) | දායක මුදල් ලැබීම් විස්තර ඇතුළත්, අරමුදලේ සාමාජිකත්වය පිළිබද සාමාජික අංක ඇතුලත් දත්ත පද්ධතියක් අරමුදල සතු නොවීම හේතුවෙන් දායක මුදල් ආපසු ගෙවිමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය වර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් ප්‍රමාණයම නිවැරදිව අරමුදලට ලැබුනේද යන්න තහවුරු කර ගත නොහැකි වී තිබුණි. | දායක මුදල් අරමුදල වෙත නිශ්චිත ලෙස ලැබුනේදැයි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. | මේ වන විට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් 2020/12/31 දිනැති 03/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම සම්බන්ධව 2021/02/10 දිනැති 26/2017(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කර ඇත.තවද කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් | නව චක්‍රලේඛ අනුව කටයුතු කරමින් පවතී. |

අංක DMS/SYS.AUD/Check List/01 හා 2020.09.07 දිනැති ලිපිය මඟින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අය කිරීම් පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. ඒ අනුව දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව, අඛන්ඩව ලැබුනේද යන්න තහවුරු කර ගනු ලබන බව.

40. විගණන අස්ථිත්‍යයේ නම - **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 -මතය ව්‍යාචනය

2019 - මතය ව්‍යාචනය

2020 - මතය ව්‍යාචනය

| | **විගණන නිරීක්ෂණය** | **විගණකාධිපතිගේ නිර්දේශය** | **ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග** | **ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය** |
|---|---|---|---|---|
| | ------------------- | -------------------- | --------------------- | ------------------- |
| (අ) | සේවක අර්ථසාධක අරමුදලේ දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2020 වර්ෂයේ ආරම්භක හා අවසාන සාමාජික සංඛ්‍යාවන් තහවුරු කර ගැනීම සඳහා සාමාජික ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.28,972,771,536 ක් ස්වෙච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු.44,799,765 ක් හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු.44,820,450,342 ක් වූ ශේෂයන් දායකයන්ගේ හිමිකම අනුව වෙන්කර හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | දායකයින්ගේ කේවල ගිණුම් පිලිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනිම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත යුතු බව. | ශේෂ තහවුරු කර ගැනීමට පද්ධතිය හරහා තොරතුරු යොමු කරන ලෙස අවධාරණය කර ඇත. එම දැනුවත් කිරීම් හා සිහිකැඳවීම් වලට අනුව මේ වන විට ආයතන 80-90 අතර ප්‍රමාණයක් පද්ධතිය හරහා දායක මුදල් යොමු කිරීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේ දී මෙම ප්‍රමාණය තවදුරටත් වර්ධනය කර ගැනිමට අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර මාර්ග ගත ක්‍රමය තුලින් ලැබීම් 8% හා 12% දායක ගිණුම් අනුව වර්ග කර කේවල ශේෂ ඉදිරිපත් කිරිමට කටයුතු සැලසුම් කරමින් පවතින බව. | දායකයින්ගේ හිමිකම් අනුව ශේෂයන් වෙන් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රජයේ ආයතන විසින් අරමුදලේ ගිණුමට සිදු කරන ලද හර හා බැර කිරීම්වලට අදාළ හඳුනා නොගත් ශේෂ | වාර්ෂිකව ගැලපුම් ගිණුමේ ශේෂ, වෙන වෙනම අදාල ආයතන සමඟ සැසඳුම් කර නිවැරදි ගිණුම්වලට | උපලේඛන අනුව වසර ගණනකට පෙර සිට ආරම්භක ශේෂය රු. 29,807,957 පෙන්නුම් කරන අතර | නිවරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමක සටහන් කර තිබුණි. මේ අනුව 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් ගැලපුම් ගිණුමෙහි පවතින වසර ගණනාවක සිට එකතුවෙමින් එන ශේෂය රු.29,811,314 ක් විය.විස්තරාත්මක උපලේඛණයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂය පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු බව. | එය අපගේ ගැලපුම් ගිණුමේ ශේෂය හා නොගැලපේ. මෙම ශේෂ නිරවුල් කර ඇති ද යන්න ආයතන වෙතින් විමසීම් දිගින් දිගටම කරන ලද අතර ඉදිරියේ දී කළමනාකරණ කමිටුව හරහා මෙම වැරදි හර කිරීම් ඉවත් කිරිමට සුදුසු පියවර ගැනීමට අපේක්ෂා කරන බව. | |
| (ඇ) | අරමුදලේ සාමාජිකයන් විසින් ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද මුළු අයදුම්පත්‍ර 5,188 ක් අතරින් අයදුම් පත්‍ර 987 ක් සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් කර නොතිබුණි. | අයදුම්පත් සඳහා නොපමාව ගෙවීමට කටයුතු කළ යුතු බව. | 2020 වර්ෂයේ මාර්තු මස දී සහ 2020 ඔක්තෝබර් මස අවසානයේ COVID 19 වෛරස ව්‍යාප්තිය සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වසා තැබීමට සිදු වීම මත නිළධාරින් කැඳවීමට නොහැකි වීම හේතුවෙන් වසර අවසානයේ ගෙවීම් නොකරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 987 ක් බව. | අයදුම්පත්‍ර වලට ගෙවීමේ ප්‍රමාදයක් පවතී. |
| (ඇ) | අරමුදලේ දායකයින්ගේ තොරතුරු පවත්වාගෙන යාම සඳහා මාර්ගගත පද්ධතියක් හඳුන්වා දී තිබුනද විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් 2019 වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ රු.68,246,168,683ක්වූ | අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා මගින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතු බව. | ගිණුම් සකස් කල ආකාරය පිළිබඳව පැහැදිලි කිරීම් කර ඇත. | කේවල ගිණුම් පවත්වා නොගනී. |

| | | | |
|---|---|---|---|
| දායක මුදල් ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් කේවල ගිණුම් පවත්වාගෙන නොතිබීම. | | | |
| (ඉ) 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරි)25 වන වගන්තියට අනුව එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම් වල ඇති ශේෂයන් දායකයන් වෙත දැනුම් දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | සාමාජික ගිණුම් ශේෂ දෙසැම්බර් 31 දිනට දැන්වීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම විවිධ ප්‍රයෝගික ගැටළු හේතුවෙන් ප්‍රමාද වී ඇත. | නවකයින්ගේ සාමාජික ගිණුම් ශේෂ දෙසැම්බර් 31 දිනට දැන්වීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම කර නොතිබුණි. |

41. විගණන අස්ථිතායේ නම - **ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්වාගණනය නොකළ මතය

2019 - තත්වාගණනය නොකළ මතය

2020 - තත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | -------------------- | ------------------ | -------------------- | --------------------- |
| (අ) | යෝජනා ක්‍රමය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රු. මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක රු. මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර තිබුණි. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වූ සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි.<br>ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රු. මිලියන 144.25 ක් වූ හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2020 අගෝස්තු 19 දින ගනු ලැබූ මණ්ඩල තීරණයට අනුව, 2015 සිට ඉහත ආයෝජනය ප්‍රතිආයෝජනය කිරීම, නතර කිරීමට තීරණය කර | අනාගතයේදී එවැනි අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ අලාභය පියවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව. | ක්‍රියාමාර්ග ගෙන නොමැත | ආයෝජිත මුදල් අය කර ගැනීමට කටයුතු කර නොමැත. |

තිබුණි. 2015 සිට එම ආයෝජනය ප්‍රතිආයෝජනය කිරීමෙන් එකතු වූ පොළිය රු. මිලියන 61.83 ක් 2020 සැප්තැම්බර් දක්වා හඳුනා ගෙන නොතිබුණි.

42. විගණන අස්ථිත්‍යයේ නම - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය නොකල මතය

2019 - තත්ත්වාගණනය නොකල මතය

2020 - තත්ත්වාගණනය නොකල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පුනරුත්ථාපන වැඩසටහන යටතේ අන්ධ ජන සම්මේලනය මඟින් දෘශ්‍යාබාධිත පුද්ගලයින් 15 දෙනෙකු පුහුණු කිරීම සඳහා සැළසුම්කර තිබුණද, දෘශ්‍යාබාධිත පුද්ගලයින් 4 දෙනෙකුට පමණක් පුහුණුව ලබාදී තිබුණි. ඒ සඳහා පුහුණු නිලධාරීන් ඇතුළු 06 දෙනෙකු වෙනුවෙන් අරමුදලින් දීමනා ලබාදී තිබුණි. තව ද ඉකුත් වර්ෂ 04ක කාලය තුල මෙම තත්ත්වය පැවති අතර පුහුණුලාභීන් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි පුහුණු කටයුතු ඵලදායී ලෙස සැළසුම්කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව. | කොළඹින් දුර බැහැර ප්‍රදේශවල සිටින සේවාලාභීන් හට එම පහසුකම් ලබාගැනීමට පැමිණීමේ අපහසුව මත සේවාලාභීන් සංඛ්‍යාව වර්ධනය කල නොහැකි බව. | සැලසුම් කළ පරිදි පුහුණුලාභීන් සංඛ්‍යාව වර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සීදුව වෘත්තීය පුහුණු ආයතනයේ කාන්තා සුහසාධන හා පේෂ කර්මාන්ත පුහුණු අංශයේ කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් වටිනාකම රු.57,867ක් වූ අමුද්‍රව්‍ය තොග හා අත්‍යන්ත්‍ර නිමැවුම් තොග අභාවිතව පැවතුණි. | පුහුණු අංශයේ කටයුතු නොපමාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | නිෂ්පාදන උපදේශකවරිය ඉවත්ව ගොස් ඇති අතර නව උපදේශකවරියක් බඳවාගැනීමට කටයුතු කළ ද අයදුම්කරුවන් ඉදිරිපත් වී නොතිබු බව. | නිෂ්පාදන උපදේශකවරියක් බඳවාගෙන පුහුණු අංශයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් සැපයීම සහ දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම යනාදි අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | දෘශ්‍යාබාධිතයින් සඳහා අත්‍යවශ්‍ය පුහුණු අවස්ථා වන බැවින් එම අරමුණු ක්‍රියාවට නැංවීමට කටයුතු කළයුතු බව. | අරමුදල වෙත ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නිවාස පහසුකම් සැපයීම සීමා වී ඇති බව හා දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සීදුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ දිරිය පොළ මඟින් අලෙවි කිරීමට කටයුතු සැලසුම්කර ඇති බව. | නිවාස පහසුකම් ලබාදීමට අවශ්‍ය අවධානය යොමු වී නොතිබුණු අතර නිශ්පාදන අලෙවි පහසුකම් ලබාදීම ප්‍රමාණවත් තත්ත්වයක නොවීය. |

43. විගණන අස්ථිත්‍යයේ නම - **උද්භිද උද්‍යානභාර අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 -තත්ත්වාගණනය කළ මතය

2019 -අහිතකර මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ---------------------- | ------------------------ | -------------------- | ---------------------- |
| (අ) | දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන වියදම්, විශේෂිත වූ පුනරාවර්තන වියදම් ලෙස සලකා 2018 වර්ෂයේදී රු.23,690,558 ක මුදලක් අරමුදල මඟින් ගෙවා තිබුණි. | අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමේදී විශේෂිත වූ වැඩ සටහන් සඳහා පුනරාවර්ථන අරමුදල් හිඟයන් පිරිමැසීම සිදු කලයුතු අතර වෙනත් පුනරාවර්ථන වියදම් ගෙවීම සිදු නොකළ යුතු බව. | 2018 වර්ෂයෙන් පසු මේ දක්වා ආරක්ෂක සේවා වියදම්, වැසිකිලි පවිත්‍රතා, අතිකාල වැනි සාමාන්‍ය පරිපාලන වියදම් උද්‍යානභාර අරමුදලින් දරා නොමැත. | නිර්දේශ පරිදි කටයුතු කර ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය ප්‍රකාරව වත්කම්, දේපල පිරියත උපකරණ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දි රු. 560,010,287 ක් වූ දෙපාර්තමේන්තුවේ දේපල පිරියත හා උපකරණ අරමුදලේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | මෙම වත්කම් දෙපාර්තමේන්තු වත්කම් ලෙස සලකා CIGAS වැඩසටහනේ ඇතුලත් කිරීමටත් උද්‍යානභාර අරමුදල් අවසන් ගිණුම් තුල නාමිකව එම වත්කම් ඇතුලත් කිරීමටත් කටයුතු කර ඇත. | නිර්දේශ පරිදි කටයුතු කර ඇත. |
| (ඇ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මෙම | අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමට හෝ | අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ඉදිරියට පවත්වා ගැනීමට කටයුතු කර | මේ දක්වා කටයුතු සිදු කර නැත. |

| | | |
|---|---|---|
| අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු වේ. 2021 අප්‍රේල් 23 දින වන විටත් එය ව්‍යවස්ථාපිත අරමුදලක් පිහිටුවීමකින් තොරව 2020 වර්ෂය වෙනුවෙන්ද රු.64,689,090 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඇවර කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව. | ඇති බව කාරුණිකව දන්වමි. |

44. විගණන අස්ථිතායේ නම - **තුරුසවිය අරමුදල**

මූලා ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ----------------------- | ------------------- | -------------------- | ------------------- |
| (අ) | කළුතර, කෑගල්ල, රත්නපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක 04 හි තුරුසවිය සමිති 30 ක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් සහ ණය මුදල්වලින් රු.826,109 ක් වූ ලැබිය යුතු ශේෂයක් වර්ෂ 05 ක කාලයක් පැවති නමුත් අයකර ගැනීමට නොහැකිව පැවතිණි. එසේම මෙම සමිති 2020 වර්ෂය වන විට සක්‍රීය මට්ටමේ පවතින්නේද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. | ණය අයකර ගැනීම සඳහා පියවර ගත යුතු බව. | මෙම සමිති සඳහා වාර කිහිපයකදි ලිපි මගින් දැනුවත් කරන ලද බව. | ණය අයකරගෙන නොමැත. |
| (ආ) | 2008 මාර්තු 03 දිනැති අංක 1/2008 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය අනුව රාජ්‍ය බැංකුවල කළ ආයෝජන කල් පිරුන විට නැවත ආයෝජනය කළ යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා භාණ්ඩාගාරය විසින් මැදිකාලීන ආයෝජන සඳහා ගෙවනු ලබන පොලී අනුපාතයට යටත්ව වසර දෙකකට හෝ ඊට වැඩි කාලපරිච්ඡේදයක් | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධාන වලට අනුව මුදල් ආයෝජනය කළ යුතු බව. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයන් ගෙන නොමැත. | පෙන්වාදී ඇති අඩුපාඩු එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා වන බැංකු තැන්පතු හෝ භාණ්ඩාගාර බැඳුම්කරවල වුවද, 2017 වර්ෂයේ සිට මාස 06 ක කෙටිකාලීන තැන්පතුවල රාජ්‍ය බැංකුවක ආයෝජනය කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන මුදල රු.9,201,093 ක් විය. | | | |
| (ඈ) | කුඩා රබර් වතු හිමියන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 14 ක ලියාපදිංචි තුරුසවි සමිති සංඛ්‍යාව 815 ක් වූ අතර මෙම සමිතිවලින් අක්‍රීය මට්ටමේ පවතින සමිති මෙතෙක් හඳුනාගෙන නොතිබුණි. | අක්‍රිය සමිති හඳුනාගත යුතු බව. | දිස්ත්‍රික් මට්ටමින් විශේෂ සමිති ප්‍රතිසංවිධාන වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතින බව. | බහුතර සමිති ප්‍රමාණයක් ක්‍රියාකාරි තත්ත්වයට පත්කර ඇති බව ප්‍රකාශ කළද නිශ්චිතව එම සමිති මොනවාද යන්න සහ සමිති සංඛ්‍යාව දක්වා හඳුනාගත නොහැකි විය. |
| (ඇ) | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මොනරාගල දිස්ත්‍රික්කයේ කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ස්ථාපිත කරනු ලැබූ ග්‍රාමීය රබර් සංසද 130 ක් හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන 31 ක් ඵලදායි වන අයුරින් ක්‍රියාකාරීව පවත්වාගෙන යාමට තුරුසවිය වෙත පවරා ගන්නා ලෙස වැවිලි අමාත්‍යාංශයෙන් | අප්‍රමාදව පවරාගැනීමේ කටයුතු කළ යුතු බව. | තුරුසවිය අරමුදල පනත ප්‍රකාරව එම සංසද තුරුසවිය අරමුදල යටතේ ලියාපදිංචි කිරීම විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතින බව. | සංසද 53 ක් මේවන විට ලියාපදිංචි කර ඇති අතර, සමූහ සැකසුම් මධ්‍යස්ථාන 26 ක් ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝග දී තිබුණ ද, 2020 වර්ෂයේ අවසානය දක්වා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඉ) | 2005 වර්ෂයයේදී ඇරැපොල සහ 2008 වර්ෂයේදී ගණේපල්ල රබර් ෂීට් සමුහ සැකසුම් මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීම ආරම්භ කර රු.1,000,184 ක් වියදම් කර තිබුණි. කෙසේ වුවද සැකසුම් මධ්‍යස්ථාන දෙකෙහි ඉදිකිරීම් ආරම්භකර 2020 වර්ෂයට වර්ෂ 15 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම් වැඩ කඩිනමින් නිම කරවා ගත යුතු බව. | සමිතියේ දායකත්වය ලබාගෙන ඉතිරි වැඩකටයුතු සිදු කිරීමට අරමුදලේ සභාපති විසින් දැනුවත් කර ඇති බව. | පෙන්වාදී ඇති අඩුපාඩු එලෙසම පවතී. |
| (ඊ) | 2020 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් අරමුදල වෙත ලැබී තිබුණු රු.2,000,000 ක් වටිනාකමැති මෝටර් වාහනයක් ධාවනය කිරීමට නොහැකිව පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වාහනය අලුත්වැඩියා කළ යුතු බව. | ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති බව. | පෙන්වා දී ඇති අඩුපාඩුව එලෙසම පවතී. |

45. විගණන අස්ථිත්‍යයේ නම - **වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018- තත්ත්වාගණනය කළ විගණන මතය

2019- තත්ත්වාගණනය කළ විගණන මතය

2020- තත්ත්වාගණනය කළ විගණන මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2013 ජූලි මාසයේදීඑළැඹි ගිවිසුම 2018 ජූලි මස අවසන් වී තිබුණ ද, සංසරණ වායු තත්ත්ව මැනීමේ ජංගම රථය වායු විමෝචන අරමුදල වෙත පවරා ගැනීමට, ගිවිසුම්ගත කාලය දීර්ඝ කිරීමට හෝ නව ගිවිසුමකට එළැඹීමට 2019 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | පොදුවේ පිළිගත් නෛතික තත්ත්වයන්ට අනුකූලව කටයුතු කළ යුතු බව | 2016.09.08 දිනැති මධ්‍යම පරිසර අධිකාරියේ ලිපිය මඟින් මෙම ජංගම වායු තත්ත්වය මැනීමේ ඒකකය අක්‍රිය වී ඇති බව දැනුම් දී ඇති අතර, අක්‍රිය වූ එම ඒකකය නැවත අළුත්වැඩියා කරන තෙක් නව ගිවිසුමක් සඳහා එළඹීම ප්‍රමාද කර ඇති බව. | මේ වනවිට මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජංගම වායු තත්ත්වය මැනීමේ ඒකකයේ අළුත්වැඩියා කටයුතු සඳහා නව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. |
| (ආ) | ඩිපෝ 09ක පරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට රු.21,937,500ක වියදමින් පාරාන්ධතා මනු 10ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට 2018 වර්ෂයේදී ලබා දී තිබුණි. එසේ වුවද, එම උපකරණ රැඳවීමට අවශ්‍ය ස්ථාන ඉදි නොකිරීම, ඉදි කිරීම් අත්හැර දැමීම හා ඉදිකළ ස්ථාන 02හි පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් මිල දී ගත් දින සිට වර්ෂයකට වැඩි කාලයක්, පාවිච්චියට ගැනීමෙන් තොරව පවතී | උපරිම කාර්යසාධනයක් ලබාගත හැකි වන පරිදි රාජ්‍ය මුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව. | අදාළ මධ්‍යස්ථාන සඳහා දුම් පරීක්ෂණ උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදක කටයුතු 2017.08.09 දින ආරම්භ කර තිබූ අතර එම උපකරණ 2018.01.15 දින වායු විමෝචන කාර්යාලය වෙත ලැබී තිබුණු බව සහ මෙම උපකරණ භාවිතා කිරීම සම්බන්ධව සැපයුම්කාර සමාගම විසින් ශ්‍රීලංගම තාක්ෂණික ශිල්පීන් පුහුණු කර භාරදෙන ලද බව. | වාහන වායු විමෝචන සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා නව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට විරුද්ධව පවත්නා නඩු කටයුතු නිසා තෙවන පාර්ශවයකට දුම් පරීක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා අවසර දිය නොහැකි බැවින් මෙම පරීක්ෂණ උපකරණ භාවිතා කර ශ්‍රී ලංගම වාහන සඳහා පමණක් දුම් පරීක්ෂණ සහතික නිකුත් කර ආදායම් බලපත්‍ර ලබා ගැනීමට 2021.01.07 දින මෝ.ප්‍ර.කො.ජ විසින් අනුමැතිය ලබා දී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | අක්‍රීය වායු විශ්ලේෂක 07ක අළුත්වැඩියා සිදු නොකර ප්‍රධාන කාර්යාලයේ රඳවා තිබුණු අතර වායු විශ්ලේෂක 03 ක් අස්ථානගත වී තිබුණි. එමෙන්ම, පාරාන්ධතා මනු 04 ක් අක්‍රීයව හා අනාරක්ෂිතව පැවති අතර 01ක් අස්ථානගත වී තිබුණි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු වන ක්‍රමවේද ක්‍රියාවේ යෙදවීමට කටයුතු කළ යුතු බව. | උපකරණ අස්ථානගත වී නොමැති බව සහ පවතින උපකරණ නිසි ලෙස ගබඩා කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | අක්‍රීය වී තිබූ වායු විශ්ලේෂක උපකරණ මේ වනවිට ප්‍රයිම් ඉන්ජිනියරින් පුද්ගලික සමාගම වෙත අළුත්වැඩියාව සඳහා ලබා දී ඇති අතර එයින් උපකරණ 7 ක් අළුත්වැඩියා කර භාර දී ඇත. |
| (ඈ) | 2019 වර්ෂයේදී වාහන 5,200,407 ක් සඳහා දුම් සහතික නිකුත් කර තිබුණ ද, අරමුදල මගින් මාර්ගස්ථ පරීක්ෂා සිදුකර තිබුණේ ඉන් වාහන 9317 ක් සඳහා පමණි. එය නිකුත් කළ දුම් සහතිකවලට සාපේක්ෂව සියයට 0.18ක් වැනි ඉතා අවම අගයක් විය. | ඉටු කරන කාර්යන් හි උසස් කාර්යසාධනයක් තිබිය යුතු බව | අධික ලෙස දුම් නිකුත් කරනු ලබන, වායු විමෝචන ප්‍රමිතීන්ට අනුකූල නොවන වාහන පමණක් පරික්ෂාවන්ට ලක් කෙරෙන බව. | පවත්නා කාර්ය මණ්ඩලය තුළ මේ වන විට හැකි උපරිම ප්‍රමාණයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලබයි. |
| (ඉ) | දුම් සහතික නිකුත් කිරීම සඳහා පෞද්ගලික සමාගම් 02 ක් සමග 2007 වර්ෂයේදී ඇති කරගත් ගිවිසුමේ 4.1 කොන්දේසිය පරිදි එම සමාගම් රැස්කරන ආදායමින් සියයට 10ක් දින 07ක් ඇතුළත අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු අතර එම දින 07 ඉක්ම වූ සෑම දිනකටම සියයට 03ක දඩ මුදලක් ගෙවිය යුතු විය. එසේ වුව ද, අරමුදල විසින් මෙම දින 07 වැඩකරන දින 07ක් ලෙස සලකා තිබීම නිසා ප්‍රමාද | ගිවිසුම් කොන්දේසි නෛතිකව නිර්වචනය කර ගත යුතු වීම හා දඩ මුදල් නිවැරදිව අය කළ යුතු බව. | අදාල ගිවිසුමේ රජයේ නිවාඩු හෝ සති අන්ත දින ඇතුළත් වේ ද යන්න පැහැදිලිව සඳහන් කර නොමැති බව,<br>සමාගම් විසින් රැස් කරගන්නා ආදායම් වාර්තා පිළිබඳ විස්තර සතිපතා මෙම කාර්යාලයට එවනු ලබන බව සහ ඒ අනුව මේ වන තෙක් අදාළ ආයතන නිවැරදි දිනට මුදල් ප්‍රේෂණය කර ඇති බව. | මේ පිළිබඳව භාරකාර මණ්ඩලය වෙත පාලක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද බව, එහිදී සියයට 10 ක පරීක්ෂණ ගාස්තුව එකතු කල දින සිට දින 7ක් ඇතුළත අරමුදල වෙත මුදල් ප්‍රේෂණය කල යුතු බවට අනුමැතිය ලැබී ඇත. තවද, අදාළ සමාගම් වෙත 2020.02.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒ බව දන්වා ඇති බව ග.නි විසින් දක්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවීම්වලට අදාළ දඩ මුදල් ලෙස 2018 වර්ෂය තුළ දී පමණක් රු. 41,137,584ක් අය කරගත යුතු ව තිබුණි. | | | |
| (ඊ) | වායු විමෝචන පරීක්ෂණ සිදුකරන සමාගම් විසින් අයකරන ගාස්තු පරීක්ෂා කිරීමට පවතින තොරතුරු පද්ධතිය (ICTA) අක්‍රීය වීම හේතුවෙන් එම සමාගම්වලින් ලැබෙන තොරතුරුවල නිවැරදිතාවය පරික්ෂා කර රජයට ලැබිය යුතු ආදායම නිවැරදිව ලැබුණේ ද යන්න පරීක්ෂා කිරිම සඳහා වූ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | අරමුදලේ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා යොදා ඇති ක්‍රමවේද අඛණ්ඩව පවත්වාගත යුතු වීම | දැනට ICTA ආයතනයේ ERL මඟින් මෙම දත්ත සම්ප්‍රේෂණය කරන අතර එමගින් අරමුදලට ලැබෙන සියයට 10 ක මුදල නිවැරදි බවට තහවුරු කර ගැනීම සඳහා වාර්තාකරණ මොඩියුලයක් සකස් කරන ඇති බව සහ එම සමාගම්වලින් ලැබෙන තොරතුරුවල නිවැරදිතාවය පරික්ෂා කර රජයට ලැබිය යුතු ආදායම නිවැරදිව ලැබුණේ ද යන්න පරීක්ෂා කිරිම සඳහා එම මොඩියුලයෙන් මෙම කාර්යාලයට අවශ්‍ය දත්ත ලබා ගැනීමට තවදුරටත් නොහැකි වී ඇති බව.<br><br>තවද ඒ පිළිබඳව අවස්ථා ගණනාවකදී ICTA ආයතනය දැනුවත් කර ඇති බව. | දැනට අරමුදල විසින් ලබාදෙන ලද පිරිවිතර අනුව අදාළ කොන්ත්‍රාත්කාර ආයතන දෙක විසින්ම නිර්මාණය කරන ලද මෘදුකාංගයක් භාවිතයෙන් මෙම කාර්යය ඉටුකර ගනු ලබන බව සහ ICTA ආයතනය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ERL 02 වැඩසටහනේදී පැවති අඩුපාඩු මගහරවා නැවත දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමට නව යෝජනා ICTA වෙත ඉදිරිපත් කර ඇති බව. |
| (උ) | ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල වසා දැමීමට තීරණය කළ බව භාණ්ඩාගාර ලේකම්ගේ 2018 අගෝස්තු 18 දිනැති | අදාළ නෛතික පරිසරය තුළ අවශ්‍ය කටයුතු ඉටු කළ යුතු බව. | මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය දක්වා අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර ඇති බව සහ ඒ සඳහා අංක | 2019.04.25 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස් වී අරමුදලේ පැවැත්ම පිළිබඳව සාකච්ඡා කොට |

අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි තහවුරු විය. කෙසේ නමුත්, චක්‍රලේඛය පරිදි ඇවරකරුවෙකු පත්කර වත්කම්වලින් වගකීම් නිරවුල්කර ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට 2021 මාර්තු 15 දිනවන විටත් කටයුතු කර නොතිබුණි. 2020වර්ෂය අවසානයේදී අරමුදලේ ඉතිරි කිරීම් ගිණුමේ ශේෂය පමණක් රු. මිලියන 686 ක් විය. භාර ඔප්පුවක් යටතේ ස්ථාපනය කර තිබුණු මෙම අරමුදලෙහි දෙපාර්ශවයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා එක් පාර්ශවයක් වූ බැවින්, භාර ඔප්පුවේ 11 (අ) ඡේදය පරිදි, භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රකාශය මත මෙම අරමුදල අහෝසි වේ. ඒ අනුව, ඉහත චක්‍රලේඛය භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කිරීම මත මේ වන විටත් අදාළ ගිවිසුම්ගත බැඳීමෙන් එක් පාර්ශවයක් ඉවත් ව ඇත. මේ නිසා අරමුදල පැවතීමේ නීත්‍යානුකූලභාවය ගැටළුසහගත විය. එසේ හෙයින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් භාරකාර මණ්ඩලය රැස් වී අදාළ අරමුදල වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අමප/19/0519/123/027 හා 2019 මාර්තු 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ප්‍රවාහන ඇමති හා මුදල් ඇමති අතර සාකච්ඡාවක් පවත්වා එකඟ වන කරුණු සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සටහනක් නැවත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට තීරණය කර ඇති බව. අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තෙක් අරමුදල පවත්වා ගැනීමට සහ කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම් කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගන්නා තෙක් අරමුදල පවත්වා ගෙන යාමට තීරණය කර තිබුණි. | | | |
| (ඖ) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත කාර්යසාධන වාර්තා පිළියෙල කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි කාර්සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු බව. | දැනට මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සමඟ මෙම අරමුදලේ කාර්යසාධනය සඳහා ඡේදයක් ඇතුළත් කිරීම පමණක් සිදු කර ඇති බව සහ ඉදිරියේදී අදාළ චක්‍රලේඛය අනුව අදාළ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2021 වර්ෂය සඳහා ද වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | මිල දී ගත් සංසරණ වායු තත්ත්ව මැනීමේ ස්ථාවර උපකරණ ඒකක 02 ක් හා වායු තත්ත්ව ප්‍රදර්ශන 02ක් මධ්‍යම පරිසර අධිකාරියට ලබා දී තිබුණු අතර ඉතිරි ජංගම වායු සංසරණ ඒකකය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලබා දී තිබුණි. එම ආයතන විසින් රැස්කළ දත්ත 2019 වර්ෂයේ සිට වායු විමෝචන අරමුදල වෙත සම්ප්‍රේෂණය කළ ද, එම දත්ත ඵලදායි ලෙස වායු තත්ත්ව කළමනාකරණය වෙනුවෙන් උපයෝජනය කර ඇති ද යන්න තහවුරු නොවුණි. තවද, මුළු මිලදී ගැනීම් පිරිවැය රු. මිලියන 130ක් වූ මෙම උපකරණවල ආරක්ෂාව, | උපරිම කාර්යසාධනයක් ලබාගත හැකි වන පරිදි රාජ්‍ය මුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව | ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව ගුණාත්මකභාවය සම්බන්ධයෙන් තථ්‍ය දත්ත (Real time data) ලබා ගැනීමට පවතින එකම උපකරණ ත්‍රිත්ත්වය මෙය වන බව, මධ්‍යම පරිසර අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් Air quality index එකක් හඳුනාගෙන ඒ අනුව සංසරණ වායු තත්ත්වයේ ගුණාත්මක දත්ත මහජනතාවට ප්‍රදර්ශනය කිරීමටත් උනන්දුවක් දක්වන පාර්ශව සඳහා දත්ත ලබා ගැනීමට හැකි වන සේ ආයතන වල වෙබ් අඩවි වල ප්‍රදර්ශනය කරන බව හා වායු තත්ත්ව කළමණාකරන | මෙම උපකරණ මඟින් ලබා ගන්නා විශ්ලේෂිත දත්ත මහජනතාවට සහ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට දැන ගැනීමට හැකි වන පරිදි මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලෙස පාලක මණ්ඩල තීරණයක් අනුව මධ්‍යම පරිසර අධිකාරිය වෙත දන්වා යවා ඇති බව<br><br>අරමුදලේ පාලක මණ්ඩල අනුමැතිය 2020.01.16 දින සහ 2020.11.03 දිනැති පාලක මණ්ඩල රැස්වීම් වලදී) ලබා ගැනීමෙන් අනතුරුව එම උපකරණ වල නඩත්තු සේවා, ක්‍රමාංකනය සහ අළුත්වැඩියාවන් එම |

| | | | | |
|---|---|---|---|---|
| | භාවිතය, නඩත්තුව, මිනුම් ලබා ගැනීම, දත්ත සම්ප්‍රේෂණය යනාදී දෑ පිළිබඳ එකඟතාවක් ඇති වන පරිදි ගිවිසුම්ගත වීමකට අරමුදල විසින් කටයුතු කර නොතිබුණි. | | කේන්ද්‍රය මඟින් අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට මෙම උපකරණ වලින් මිණුම් කරන දත්ත යොදා ගන්නා බව. | ආයතන වලින්ම සිදු කර ගැනීමට හැකි වන අයුරින් සම්පූර්ණ අයිතිය මධ්‍යම පරිසර අධිකාරියට සහ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට ලබා දීමට තීරණය කර තිබුණි. |
| (ඒ) | ඉහළ පොලී ප්‍රතිශතයක් සහිත ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු රු.1,270,934,392ක් සමාලෝචිත වර්ෂය තුළ දී ඉවත්කර ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. එම හේතුවෙන් වැඩි පොලී මුදලක් ලබා ගැනීමට තිබු වාසිදායක තත්ත්වය අරමුදලට අහිමි වී තිබුණි. | රාජ්‍ය අරමුදල් වාසිදායක ලෙස මෙහෙයවීම | ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් 2020 ඔක්තෝම්බර් මාසයේ පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකි වීම මත මෙම මුදල් නැවත ආයෝජනය කිරීමට නොහැකි වූ බව. | 2022 මාර්තු මාසයේදී රුපියල් මිලියන 300 ක් මාස 6ක් සඳහා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කරන ලද බව දක්වා ඇත.කෙසේ නමුත් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සමුච්චිත අරමුදලේ ශේෂය රු 624,524,028 ක් සහ ඉතුරුම් ගිණුමේ සහ ජංගම ගිණුමේ ශේෂ වල එකතුව රු 259,514,441ක් ව පැවතිණි. |

46. විගණන අස්ථිතායේ නම - **COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය නොකළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව අනුව, විසර්ජන පනතින් අනුමත කෙරෙන අයවැයට පරිබාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අනුමත නොවූවත් පාර්ලිමේන්තු අනුමැතියකින් තොරව 2020 අප්‍රේල් 16 දින ආරම්භ කර තිබූ මෙම අරමුදල සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එදින සිට වර්ෂයක් ඇතුළත ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2021 ඔක්තෝබර් 08 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු බව. | අරමුදල පිහිටුවන අවස්ථාව වන විට පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබුණු බැවින් 2020 අගෝස්තු 29 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එම අවස්ථාවේදී පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇත. අදාල අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | 2022 මාර්තු 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | මුදල් භාර ගැනීමේ නිලධාරියකුට ලැබෙන සියළුම මුදල් ප්‍රමාණයන් මුදල් පොතේද ඒ සඳහා නියමිත වෙනත් පොත්වලද නිසි පරිදි සටහන් කළ යුතු වුවද, | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | එක් දිනක් තුළ අරමුදලේ නිල බැංකු ගිණුම වෙත පරිත්‍යාගශීලීන් විශාල ප්‍රමාණයක් සෘජු තැන්පතු ලෙස පරිත්‍යාග සිදු කර තිබුණු අතර, එම | 2022 මාර්තු 23 දින වන විටත් සෘජු තැන්පතු හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සෘජු තැන්පතු ලෙසින් දිනකදී ලැබෙන සියලුම තැන්පතු එකතුව පමණක් මුදල් පොතේ සටහන් කර තිබූ අවස්ථා විය. | | පරිත්‍යාගශීලීන්ගේ අනන්‍යතාවය හඳුනාගැනීමට නොහැකි බැවින් එවැනි සෘජු පරිත්‍යාග හා අනන්‍යතාවය හෙළි කිරීමට නොකැමැති පරිත්‍යාගශීලීන් වෙනුවෙන් දිනක ලැබීම් එකතුවක් ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී නමින් කුවිතාන්සියක් නිකුත් කර ලැබීම් ලෙස සටහන් කර ඇති බව හා එම ලැබීම් එකතුවේ විස්තරාත්මක තොරතුරු අරමුදලේ බැංකු ගිණුම් ප්‍රකාශයේ සටහන් සමඟ තහවුරු වන බව. | |
| (ඇ) | 2020 මැයි 15 දිනැති කළමනාකරණ කමිටු තීරණය ප්‍රකාරව අරමුදලට ලැබෙන පරිත්‍යාග, බදු මුදලින් නිදහස් කරගැනීමට කටයුතු කිරීම සඳහා තීරණය කර තිබුණද, 2021 නොවැම්බර් 30 දින වන විටත් අරමුදලට ලැබෙන පරිත්‍යාග බදු මුදලින් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම කළ යුතු බව. | පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීමට සමගාමීව පරිත්‍යාග බදු මුදලින් නිදහස් කර ගැනීමට හැකි වනු ඇති බව. | 2022 මාර්තු 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) COVID 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල මඟින් පහත සඳහන් අරමුණු ඉටු කළ යුතුව තිබුණි.<br><br>• ඖෂධ, ඖෂධ පරීක්ෂණ උපකරණ ඇතුලු සෞඛ්‍ය සේවා පහසුකම් සඳහා සහ COVID 19 වසංගතයට එරෙහිව සටන් කිරීමට ඇති ධාරිතාවය නඟාසිටුවීමට හදිසි මූල්‍ය අවශ්‍යතා ලබාදීම.<br><br>• සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය සේවා නිලධාරින්ගේ සහ අත්‍යාවශ්‍ය පොදු සේවා සපයන්නන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සඳහා වියදම් දැරීම.<br><br>• ළමයින්, කාන්තාවන්, අඩු ආදායම් ලබන පුද්ගලයින්, වයස්ගත, ආබාධිත සහ අවදානම් | අරමුදලේ මුදල් උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය | කොවිඩ් 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලේ අරමුණු යටතේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට හැකි ව්‍යාපෘති සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව වෙත ලැබෙන යෝජනා සැලකිල්ට ගෙන මුදල් නිදහස් කරනු ලබන අතර , කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බොහොමයක් ව්‍යාපෘති දෙස්, විදෙස් ආධාර යටතේ ක්‍රියාත්මක වූ බැවින් අරමුදල් යෙදවීමට ප්‍රමාණවත් ව්‍යාපෘති යෝජනා කළමනාකරණ කමිටුව වෙත ලැබී නොමැත. ඒ අනුව අරමුදලේ මූල්‍ය වත්කම් වසංගත තත්ත්වයේ හැසිරීම අනුව ක්ෂණිකව උපයෝජනය කර ගැනීමට මෙන්ම නිශ්ක්‍රීය ලෙස මුදල් තබාගැනීම සුදුසු නොවන බව නිරීක්ෂණය වූ බැවින්, දින 07, දින 31, මාස 03, මාස 06 හා වසර 01 ක් වශයෙන් ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට කටයුතු කර | අරමුදල සතු මුදල් අරමුදලේ අරමුණු ඉටු කිරීමට උපයෝජනය කර නොතිබුණු අතර, එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

පුද්ගලයින් සඳහා මූලික අවශ්‍යතා සැලසීම.

- ගම්බද සහ දුරස්ථ බෙහෙත් ශාලා සඳහා මූල්‍ය පහසුකම් ලබාදෙමින් පොදු සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීම.

- දේශීය අමුද්‍රව්‍ය, සම්පත්, දැනුම සහ නිපුණතා උපයෝගී කරගනිමින් සනීපාරක්ෂක නිෂ්පාදන, නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා දේශීය වෛද්‍ය ඒකකවලට උපකාර කිරීම.

- උසස් ගණයේ ආරක්ෂිත ඇඳුම් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ගෝලීය වෙළඳපලට සැපයීමට නවෝත්පාදන සහ පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,641.73 ක් වූ අරමුදලේ ශේෂය, ඉහත කී අරමුණු සඳහා ඇත. එමගින් අරමුදලේ මූල්‍ය වත්කම් වැඩිකර ගැනීමට හැකි වී ඇති බව.

උපයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ රු. මිලියන 6.25 ක් හා ඉතිරි කිරීමේ ගිණුමේ රු.මිලියන 111.06 ක් ලෙස මුදල් රඳවාගෙන තිබූ අතර ස්ථාවර තැන්පතුවල
රු. මිලියන 1,524.42 ක් ආයෝජනය කර තිබුණි.

47. විගණන අස්ථිත්‍යයේ නම - **ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති බව කළමනාකාරීත්වය විසින් තීරණය කිරීම හේතුවෙන්, අරමුදල විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ආයෝජනය කර ඇති රු.48,000,000,000 වටිනාකම ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර තිබුණද, ප්‍රායෝගිකව එය වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව මාස දොළහක් තුළදී උපලබ්ධි කළ හැක්කේ කෙසේද යන්න විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් මත ඉදිරි පියවර ගත යුතු බව. | අරමුදල අහෝසි කිරීම සඳහා ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත අතර, එයට අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2022 අයවැය තුළින් අරමුදල පිහිටුවීම, එහි ගනුදෙනු හා වගකීම් පියවීම සහ ඇවර කිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ඒ මත පදනම්ව දැනට ගිණුම් ප්‍රකාශවල සියලු වගකීම්, ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති බව. | 2022 මාර්තු 23 දින වන විටත් අරමුදල පිහිටුවීමට හා ඇවර කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර තිබුණු, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර මෙම අරමුදලට ලබාදුන් රු. 47,472,450,000 කින් | විධිමත් අනුමැතියක් මත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වගකීම් සම්බන්ධයෙන් | 2021 ජනවාරි 09 දිනෙන් පසු අධිභාර ලැබීම් නොමැත. ඒ දක්වා බැංකු ශේෂය යාවත්කාලීන කර | 2022 දෙසැම්බර් 31 දින වන විටත් බැදීම් නිදහස් කිරීමට අරමුදලේ මුදල් ශේෂය |

| | | | | |
|---|---|---|---|---|
| | තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති රු. 26,673,196,758 ක මුදල ගෙවීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව පැවති මුදල් ශේෂය රු. 379,108,419 ක පමණක් විය. ඒ අනුව මූල්‍යමය බැඳීම නිදහස් කිරීමට අරමුදල සතුව ප්‍රමාණවත් තරම් මුදල් නොතිබීම හේතුවෙන් අරමුදලෙහි නුබුන්වත් බව පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පැන නැඟී ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරි පියවර ගත යුතු බව. | ඇති අතර, එම ශේෂය රු. 1,107,728,128.74 ක් බව. | ප්‍රමාණවත් වී නොතිබුණි. |
| (ඇ) | 2020 අප්‍රේල් 02 දිනැති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 03 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීම අරමුදලේ ලේකම් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කළ යුතු විය. කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා හා තවත් එක් සාමාජිකයෙකු සහතික කොට විගණනයට ඉදිරිපත් කළයුතු වුවද ඉහත කී ලේකම්වරයාගේ අත්සනින් යුතුව පමණක් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම විධිමත් කළ යුතු බව. | නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත. | 2021 වර්ෂය සඳහා විගණනය ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල කළමනාකරණ කමිටුවේ සභාපති අත්සන් කර නොතිබුණි. |
| (ඈ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව සියලුම අයබදු, තීරුබදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම්ද, නියමිත කාර්යය සඳහා වෙන් කරනු ලැබූ ජනරජය සතු සෙසු සියලුම ආදායම් සහ ලැබීම්ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු වුවද, 2020 මාර්තු 14 දින සිට ඉන්ධන මිල මත අයකර ඇති අධිභාරය මත වූ ආදායම, එසේ බැරකර නොතිබුණි. | අරමුදල පාර්ලිමේන්තු පනතක් තුළින් විධිමත්ව පිහිටුවීමට කටයුතු කළ යුතු බව. | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල ඒකාබද්ධ අරමුදලින් පරිබාහිරව පිහිටවූ අරමුදලකි.<br><br>ප්‍රකාශිත ගැසට් නිවේදන අනුව ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් මගින් ස්වයංක්‍රීයව | 2022 මාර්තු 23 දින වන විටත් මෙම අරමුදලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා නොමැති බැවින් රැස්කර ඇති ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගණනය කර ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලේ බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කරන බව. | |
| (ඉ) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව අනුව විසර්ජන පනතින් අනුමත කෙරෙන අයවැයට පරිබාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අනුමත නොවූවත් 2020 මාර්තු මස 18 දින සිට මෙම අරමුදල ආරම්භ කර තිබූ අතර 2020 අගෝස්තු 29 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2021 සැප්තැම්බර් 06 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | අදාළ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර එයට අනුමැතිය ලබා ගැනීමෙන් පසු රා.මු. චක්‍රලේඛ 01/2020 පරිදි 2022 අයවැය තුළින් අරමුදල පිහිටුවීම, එහි ගනුදෙනු හා වගකීම් සහ ඇවර කිරීම යනාදිය ඇතුළත්ව අරමුදලේ සියලු කටයුතු සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිත බව. | 2022 මාර්තු 23 දින වන විටත් අරමුදලට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ඊ) | අරමුදල ඇතිකිරීමේ අපේක්ෂිත අරමුණ වනුයේ මිල වැඩිවීමේදී හා අඩුවීමේදී සිදුවන මිල උච්චාවචනයන් පාලනය කර ස්ථාවර මිලක් පවත්වා ගැනීමයි. ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල අඩු වී තිබියදීත් ඉන්ධන ආනයනයේදී අධිභාරයන් අයකර පැවති මිලටම ඉන්ධන අලෙවි කිරීම හේතුවෙන් 2020 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉන්ධන ස්ථායීකරණ අරමුදල රු. 21,705,911,662 ක ශුද්ධ අතිරික්තයක් උපයාගෙන තිබුණි. | මිල ස්ථායිකරණ අරමුදලක් ඇති කිරීමේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු බව. | පිළිතුරු සපයා නොමැත. | 2022 මාර්තු 23 දින වන විටත් ඉන්ධන මිල සීඝ්‍ර ලෙස වැඩි වී තිබුණත්, ඒ සඳහා මෙම අරමුදලෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මෙම අතිරික්තය ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල වැඩිවීමකදී දේශීය මිල ස්ථායිව පවත්වා ගෙන යෑම සඳහා ද්‍රවශීල වත්කමක් ලෙස පවත්වාගෙන යා හැකිව තිබුණද, අමාත්‍ය මණ්ඩල සංදේශ අනුමැතියේ හෝ එවැන්නක් සඳහන් නොවූ අතර එහි වූ අනුමැතිය පරිදිම අරමුදලේ රු. බිලියන 48 ක මුදල්, විදුලිබල මණ්ඩලය වෙත ප්‍රාග්ධන දායකත්වයක් ලෙස ලබාදී එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙටිකාලීන ආයෝජන යටතේ දක්වා තිබුණි. | | | |
| **(උ)** | අංක 20/0684/204/060 හා 2020 අප්‍රේල් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 02 ඡේදය ප්‍රකාරව, උක්ත අරමුදල කළමනාකරණය සඳහා කමිටුවක් පත්කිරීම හෝ නියෝග නිකුත් කිරීම සිදු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතු බව. | එකඟ වෙමි. | 2022 මාර්තු 23 දින වන විටත් කමිටුව පත්කිරිම හා නියෝග නිකුත් කිරිම සිදු කර නොතිබුණි. |
| **(ඌ)** | භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් ලබාගෙන ඒ හරහා ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල වෙත රු. 47,472,450,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණද, ඒ සඳහා 2020 වර්ෂයේදී විධිමත් ප්‍රතිපාදන සලසාගැනීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | විධිමත් පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතු බව. | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල සඳහා අවශ්‍ය මූලික ප්‍රාග්ධන මුදල අත්තිකාරමක් ලෙස රු.බි. 47.472 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත් මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රණය හරහා ලබාගෙන ඇත. එමෙන්ම භාණ්ඩාගාර බිල්පත් | 2022 මාර්තු 23 දින වන විටත් ලබා ගෙන තිබුණු අත්තිකාරම පියවීම සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රතිපාදන ලබා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නිකුත් කිරීම හා නිදහස් කිරීම කරනුයේ ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වේ. | |
| (එ) | 2020 මාර්තු 11 දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම් මඟින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ සටහනට අනුව, 2020 මාර්තු 09 දින වන විට අන්තර්ජාතික වෙළඳපොලේ බොරතෙල් මිල සියයට 42.5 කින් පහළ බැස ඇති බවත්, එය ඒ වනවිට බැරලයක් එ.ජ. ඩොලර් 34.63 ක් පමණ වන බවත්, 2019 සැප්තැම්බර් මස වනවිට එය එ.ජ. ඩොලර් 59.73 ක් වන බවත් දන්වා තිබුණි. | ඉන්ධන මිල විචලනය සම්බන්ධයෙන් අරමුදල අපේක්ෂා කළ අරමුණු ඉටු කළ යුතු බව. | එකඟ වෙමි. | 2022 මාර්තු 23 දින වන විටත් ඉන්ධන මිල විචලනය සම්බන්ධයෙන් අරමුදල අපේක්ෂා කර තිබුණු අරමුණු ඉටු කර නොතිබුණි. |

- මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ ගණනය කිරීම් අනුව, බොරතෙල් මිල පහළ යාම හේතුවෙන් ඉන්ධන ලීටරයක මිල පහත පරිදි පහළ යාමක් බලාපොරොත්තු වී තිබුණි.

| | **පෙට්‍රල් 92 ඔක්ටේන්** ---------- රු. | **පෙට්‍රල් 95 ඔක්ටේන්** --------- රු. | **ඔටෝ ඩීසල්** ------- රු. | **සුපිරි ඩීසල්** ------- රු. |
|---|---|---|---|---|
| මිල ගැලපුම (ලීටරයකට) (ආසන්න වශයෙන්) | 12 | 15 | 14 | 20 |

| | |
|---|---|
| - මෙම මිල පහළයාමේ වාසිය, ලබාදී ඇති බදු සහන අයකර ගැනීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම මහජනතාවට | එකඟ වෙමි. |

| | |
|---|---|
| ලබාදීම, බදු අයකිරීම ඉහළ නංවා මුළු ප්‍රතිලාභයම රජයේ ආදායමට ලබාගැනීම, ඉන්ධනවල සිල්ලර මිල පහත දැමීම හා ඉන්ධන මිලෙහි වෙනසක් නොකොට ඉන්ධන සැපයුම් ආයතන විසින් අවසාන මාස 05 තුළදී ලබා ඇති පාඩුව පූර්ණය කරගැනීම ලෙස විකල්ප 04 ක් යටතේ ඇගයීම් කර තිබුණි. | |
| • කෙසේ වෙතත්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සටහනේ (ආ) ඡේදය අනුව ඔටෝ ඩීසල් සඳහා රු. 11 ක් ද, පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා රු. 15 ක් ද, සුපිරි ඩීසල් සඳහා රු. 20 ක්ද වශයෙන් වූ මිල අඩුවීමේ ඉතිරිය සඳහා රේගු ආඥා පනත යටතේ අධිභාරයන් පැනවීම හෝ වෙළඳපොළ මිල අඩුකිරීම සඳහා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි. | එකඟ වෙමි. |
| • ඒ අනුව, අංක 2166/35 හා 2020 මාර්තු 13 වන දින පළකර ඇති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පහත පරිදි ඉන්ධන හා සම්බන්ධ තීරු බද්ද සමඟ අයකළ යුතු අධිභාරය 2020 මාර්තු 14 දින සිට මාස 02 ක කාල සීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි නියම කර තිබුණි. | එකඟ වෙමි. |

| | පෙට්‍රල් 92 ඔක්ටේන් -------- රු. | පෙට්‍රල් 95 ඔක්ටේන් ------- රු. | ඔටෝ ඩීසල් -------- රු. | සුපිරි ඩීසල් ----- රු. |
|---|---|---|---|---|
| අධිභාරය (ලීටරයකට) | 0 | 15 | 11 | 20 |

- පසුව අන්තර්ජාතික වෙළඳපලේ බොරතෙල් මිල උච්චාවචනය වූ අවස්ථාවලදී පහත පරිදි අධිභාර වටිනාකම අති විශේෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධනය කර තිබුණි.

2021 ජනවාරි 09 දිනෙන් පසු අධිභාර ලැබීම් නොමැත. ඒ දක්වා බැංකු ශේෂය යාවත්කාලීන කර ඇති අතර, එම ශේෂය රු. 1,107,728,128.74 ක් බව.

| ගැසට් පත්‍ර අංකය | දිනය | ------ | බලපැවැත්වෙන කාලය | පෙට්‍රල් 92 ඔක්ටේන් | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් රු. | සුපිරි ඩීසල් රු. |
|---|---|---|---|---|---|---|---|
| 2172/6 | 2020.04.22 | | මාස 02 | 26 | 49 | 24 | 40 |
| 2181/13 | 2020.06.24 | | මාස 02 | 0 | 20 | 12 | 30 |
| 2189/57 | 2020.08.23 | | මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2203/1 | 2020.11.23 | | මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2213/7 | 2021.02.01 | | 2021.02.02 සිට 2021.02.23 දක්වා | 0 | 0 | 0 | 0 |

- අංක 2213/7 හා 2021 පෙබරවාරි මස 01 දින නිකුත් කළ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අංක 2203/1 හා 2020 නොවැම්බර් 23 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත නියමය 2021 පෙබරවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණි. ඒ අනුව මෙම අධිභාරය පැනවීමට අදාළව වර්තමාන තත්ත්වය (2021 පෙබරවාරි 23 දිනෙන් පසු) විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

පිළිතුරු සපයා නොමැත.

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | ප්‍රවර්තන වර්ෂයේ අගොස්තු, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස වලදී පිළිවෙලින් රු.12,000,001,400 ක්, රු.6,054,992,400 ක් සහ රු.2,744,260,400 ක් ලෙස එකතුව රු.20,799,254,200 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා ඇති බාහිර වගකීම් ගිණුම තුළින් අදාළ භාණ්ඩාගාර බිල්පත් නිදහස් කිරීමට කටයුතු කර තිබුණි. | භාණ්ඩාගාර බිල්පත් නිදහස් කිරිමට කටයුතු කළ යුතු බව. | ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල තීරණ ලබා ගැනීමෙන් පසු අදාල වගකීම් මහා භාණ්ඩාගාරයේ වගකීමක් වන අතර, ඉන්පසු 100% අදාල වගකීම් පියවීමට කටයුතු කරනු ලබන බව. | 2022 මාර්තු 23 දින වන විටත් භාණ්ඩාගාර බිල්පත් නිදහස් කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති මුදල රු.26,673,196,758 ක් වුවද, එම අගයට අදාළ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම රු.29,200,746,758 ක් වීම හේතුවෙන් ඒ අතර වෙනස වූ රු.2,527,550,000 ක් පියවා ගැනීම සඳහා මෙතෙක් පැහැදිලි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. | ගෙවීමට ඇති මුදල හා භාන්ඩාගාර බිල්පත්වල මුහුණත අගය අතර වෙනස පියවා ගන්නා ආකාරය පිළිබඳ ක්‍රමවේදයක් පිළියෙල කළ යුතු බව. | -එම- | -එම- |
| (ඕ) | 2021 ජනවාරි 18 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයකට අනුව ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ශක්තිමත් කිරීම සඳහා රු. බිලයන 48 ක අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස භාණ්ඩාගාරයේ ලේකම් වෙත නියෝග කර තිබුණද, විගණිත දින වන විටත් එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු වීම. | රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හා ප්‍රමුඛතා කාර්යයන් මත මෙන්ම භාණ්ඩාගාරයේ පවතින අරමුදල් තත්ත්වය අනුව මෙතෙක් අදාල රු. බි. 48 නිදහස් කර නැත. මෙම අරමුදල අවසන් කිරීමට ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා | 2022 මාර්තු 23 දින වන විටත් අදාළ නියෝගය භාණ්ඩාගාර ලේකම් විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |

බැවින් මෙම නිදහස් කිරීම කළ යුතුද නැද්ද යන්න ඉදිරියේදී සලකා බැලෙනු ලබන බව.

48. විගණන අස්ථිත්‍යයේ නම - **ජනාධිපතිවරයාගේ අරමුදල**

මූලා‍‍ ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කළ මතය

2019 - තත්ත්වාගණනය කළ මතය

2020 - තත්ත්වාගණනය කළ මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපති ගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට මාස 06 ක් ඉකුත්වීමෙන් පසුව ප්‍රදානය නොකළ රාජසන්තක වූ මෝටර් රථ හා වෙනත් භාණ්ඩවලට අදාළ 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එකතුව රු. 24,948,809 ක් හා 2019 වර්ෂයට අදාළව එකතුව රු. 16,033,489 ක් අරමුදල මෙතෙක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාල පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු බව. | රාජසන්තක වූ මෝටර් රථ සහ වෙනත් භාණ්ඩවල මුදල් වටිනාකම ජනාධිපති අරමුදලට සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුදල් කර ප්‍රේෂණය කිරීමක් සිදු නොකෙරේ. රාජසන්තක මෝටර් රථ භාණ්ඩ වෙනත් ප්‍රවර්ධන දිනුම්වලට යොදා ගන්නා බව සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලිඛිතව දන්වා ඇති බව. | සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධානවලට පටහැනිව රාජසන්තක මෝටර් රථ, භාණ්ඩ වෙනත් ප්‍රවර්ධන දිනුම්වලට යොදා ගැනීම සිදු කරනු ලබයි. |
| (ආ) | එක් එක් රෝග සඳහා ගෙවීම් කිරීමේදී එම රෝග සඳහා අරමුදලේ පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබූ සීමාවන් ඉක්මවා 2019 වර්ෂයේදී රෝගීන් 136 දෙනෙකුට එකතුව රු.57,899,147 ක් ගෙවා තිබුණි. මෙම රෝග සඳහා ගෙවීමේ සීමා ඉක්මවීම අනුමත සීමාව හා සසඳන විට සියයට 243 ක් පමණ විය. | සමාන අවස්ථා ලැබෙන ක්‍රමවේදයක් සකස් කිරීමේ හැකියාව සලකා බැලිය යුතු බව. | අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අනුමැතිය යටතේ ගෙවීම් සිදුකර ඇති බව. | සමාන අවස්ථා ලැබෙන පරිදි ක්‍රමවේදයක් 2022 පෙබරවාරි 28 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේදී සුභසාධන කාර්යය සඳහා දරන ලද රු. 26,752,867 ක් වූ වියදම් සඳහා විශේෂ අනුමැතියක් මත අවස්ථා 66 කදී සිදු කරන ලද කරුණාසහගත දීමනාවන් විය. | පනතේ සඳහන් අරමුණු කෙරෙහිද අවධානය යොමු කරමින් සමාන අවස්ථා ලැබෙන ක්‍රමවේදයන් සකස් කිරීමේ හැකියාව සලකා බැලිය යුතු බව. | සඳහන් කර ඇති සුභසාධන කාර්යයන් වෙනුවෙන් කරනු ලැබූ ගෙවීම් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ජනාධිපති අරමුදලේ අරමුණු සහ කාර්යන්වලට අදාලව විශේෂ අනුමැතිය මත සිදුකර ඇත. | සමාන අවස්ථා ලැබෙන පරිදි ක්‍රමවේදයක් 2022 පෙබරවාරි 28 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 71 ඡේදය ප්‍රකාරව අයකර ගතයුතු වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස හෙළිදරව් කළ යුතුව තිබුණි. අරමුදල වෙත ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් අයවීමට තිබෙන රු. මිලියන 129 කින් ඉදිරි මාස 12ක කාලසීමාව තුළ අයකර ගත යුතු රු. මිලියන 12 ක් ජංගම වත්කම් ලෙස සහ ඉතිරි රු. මිලියන 117 ක් ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දක්වනවා වෙනුවට මුළු ලැබිය යුතු මුදලම ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලබන බව. | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි විය. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සිදු කර තිබුණු රු.2,200,000 ක ආයෝජන දක්වා තිබුණි. එම ආයෝජන අගය කිරීමේ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් හෙළිදරව් කර නොතිබුණි. | අදාළ හෙළිදරව් කිරීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ ඇතුළත් කිරීම කළ යුතු බව. | පැහැදිලි කිරීම් ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇති බව තහවුරු කර ගැනීමට නොහැකි විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ශිෂ්‍යත්ව විභාගය සමත් සිසුවියක් වෙනුවෙන් අරමුදලින් රු.300,000 ක ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කර එමඟින් ලබන පොළිය මාසයකට රු.1,500 ක උපරිමයකට යටත්ව සිසුවියගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඇයට වයස අවුරුදු 18 ක් සම්පූර්ණ වන තෙක් ගෙවන ලෙස බැංකුවට උපදෙස් ලබා දී තිබුණි. 2020 වර්ෂය වෙනුවෙන් එම ස්ථාවර තැන්පතුවෙන් රු. 26,908 ක පොළියක් ලැබී තිබුණු අතර, එම සම්පූර්ණ පොළියම සිසුවියට බැංකුව විසින් ගෙවා තිබුණි. බැංකුවට ලබා දී තිබුණු උපදෙස් අනුව එම සිසුවියට 2020 වර්ෂය සඳහා රු. 18,000 ක් ගෙවිය යුතුව තිබුණත්, එම සීමාව රු. 8,908 කින් ඉක්මවා රු. 26,908 ක් ගෙවා තිබුණි. තවද, අරමුදල නමින් පැවති එම ස්ථාවර තැන්පතුව අරමුදලේ වත්කමක් ලෙසත්, පොළී ආදායම රු. 26,908 ක් ආදායමක් ලෙස හා ඉන් සිදුකළ ගෙවීම වියදමක් ලෙසත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම කළ යුතු බව. | මෙම ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම මගහැරී ඇති අතර 2021 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. මෙම තැන්පතුවේ පොලිය සෘජුවම ප්‍රතිලාභියාගේ බැංකු ගිණුම වෙත බැර කෙරෙන බැවින් එය ජනාධිපති අරමුදලේ පොලී ආදායමක් වශයෙන්ද අනතුරුව ශිෂ්‍යාධාර වියදමක් ලෙසද හඳුනා නොගන්නා බව. | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් අදාළ නිවැරදි කිරීම් සිදු කර ඇති බව තහවුරු කර ගැනිමට නොහැකි විය. |
| (උ) | 2020 වර්ෂයේ විදේශ රෝහලකදී සිදු කළ වෛද්‍ය ප්‍රතිකාර වියදම් පියවීම සඳහා අරමුදලේ වියදමක් ලෙස ගිණුම්ගත කර නිකුත් කරන ලද රු. 6,083,244 ක් වූ චෙක්පත 2021 දෙසැම්බර් 15 දින වන විටත් ලේකම්, විදේශ සබඳතා කාර්යාලය වෙත නිකුත් කර නොතිබුණි. එම හේතුවෙන් | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම කළ යුතු බව. | මෙම චෙක්පතට අදාල ගොණුවෙහි කටයුතු සම්පූර්ණ කළ පසු චෙක්පත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. | 2022.01.16 දින මෙම චෙක්පත ලේකම්, විදේශ සබඳතා කාර්යාලය වෙත යවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 වර්ෂයේදී වෛද්‍යාධාර වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | | |
| (ඌ) | 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල පනත යටතේ අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කර ජනාධිපතිවරයාගේ විධානයට අනුව ගෙවිය යුතුව තිබුණත්, 2019 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා වැය කර තිබුණු එකතුව රු. 659,287,255 ක් සහ 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා වැය කර තිබුණු එකතුව රු. 1,899,195,017 ක් සඳහා 2021 දෙසැම්බර් 15 දින වන විටත් මණ්ඩලය විසින් නිශ්චය කර නොතිබුණි. | පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බව. | 2019 ඔක්තෝබර් 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා සහ 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා ජනාධිපති අරමුදලේ සිදු කරනු ලැබූ සියළුම ගෙවීම් අතිගරු ජනාධිපතිතුමන්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කර ඇත. 2019.10.18 දිනෙන් පසුව ජනාධිපති අරමුදලේ පාලක මණ්ඩල රැස්වීමක් නොපැවැත්වුන අතර පවතින කොවිඩ් වසංගත තත්ත්වය යටතේ පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් නියම කිරීම අපහසු වී ඇත. ඉදිරියේ දී පැවැත්වෙන පාලක මණ්ඩල රැස්වීමේදී මෙම කාල සීමාවට අදාලව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2022 පෙබරවාරි 28 දින වන විටත් පාලක මණ්ඩලය රැස්වී නොතිබුණු බැවින් එම වියදම් මණ්ඩලය විසින් නිශ්චිත කර නොතිබුණි. |
| (එ) | 2021 ඔක්තෝබර් මාසය වෙනුවෙන් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2020 මාර්තු 12 දින සිට 2020 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | 2021 වර්ෂය තුළ මෙම චෙක්පත් සම්බන්ධයෙන් මු. රෙ. 396 අනුව කටයුතු කරනු | 2021 දෙසැම්බර් 31 දින මෙම නිෂ්කාශනය නොවූ චෙක්පත් ජනාධිපති අරමුදලේ |

| | | | | |
|---|---|---|---|---|
| | නොවැම්බර් 11 දින දක්වා එකතුව රු.11,507,044 ක් වූ නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් 12 ක් පැවැතුණි. එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව 2021 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | ලබන බව. | ආදායමට බැර කර තිබුණි |
| (ඒ) | 2018 ජූලි 26 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 51204 (46078) දරන බැංකු ගිණුම 2020 හා 2021 වර්ෂයන්හිදී අක්‍රීය තත්ත්වයේ පැවති අතර, ඒ සම්බන්ධයෙන් අරමුදල විසින් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. | අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් අරමුදල් රැස් කිරීම සහ ගෙවීම් සිදු කිරීම වැනි විශේෂ අවස්ථාවන්හි දී භාවිතා කිරීම සඳහා 51204 අංක දරන ගිණුම පවත්වාගෙන යනු ලබන බව. | විශේෂ අවස්ථාවන්හි දී භාවිතා කිරීම සඳහා 51204 අංක දරන ගිණුම පවත්වාගෙන යන බැවින් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | 2020 වර්ෂයේදී හෘද සැත්කම්, පිළිකා රෝග, මොළය ආශ්‍රිත රෝග, දණහිස් හා උකුළ ආශ්‍රිත රෝග, වකුගඩු රෝග සහ වෙනත් ප්‍රතිකාර සඳහා රෝගීන් 5407 දෙනෙකු වෛද්‍යාධාර වශයෙන් ඉල්ලීම් කර තිබුණු නමුත්, රෝගීන් 1914 දෙනෙකු සඳහා පමණක් වෛද්‍යාධාර ගෙවීම් කර තිබුණි. 2019 වර්ෂයේදී වෛද්‍යාධාර වශයෙන් රෝගීන් 6386 දෙනෙකු සඳහා ගෙවීම් කර තිබුණි. ඒ අනුව, 2019 වර්ෂය හා සැසඳීමේදී 2020 වර්ෂයේදී වෛද්‍යාධාර ගෙවූ රෝගීන් සංඛ්‍යාව 4472 කින් හෙවත් සියයට 70 කින් අඩු වී තිබුණි. | අරමුදල් පනතේ විධිවිධාන පරිදි වෛද්‍යාධාර ඉල්ලුම් කරන රෝගීන් සඳහා වෛද්‍යාධාර ලබා ගැනීමට අවශ්‍ය මූල්‍යාධාර ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කාර්යාලය වසා තැබීම සහ අවම කාර්ය මණ්ඩලයකින් කාර්යාලීය කටයුතු පවත්වාගෙන යාම හේතුවෙන් 2020 වර්ෂයේ වෛද්‍යාධාර ගෙවීම් 2019 වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇති බව. | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් ඒ පිළිබඳ ප්‍රගතිය තහවුරු කර ගැනීමට නොහැකි විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | වෛද්‍යාධාර ගෙවීම් අනුමත කර රෝගීන් විසින් බිල්පත් ඉදිරිපත් කර තිබුණද, ලිපිගොනු සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හෝ ප්‍රමාද වීම සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වර්ෂ 1 ක සිට වර්ෂ 2 මාස 3 ක් දක්වා කාල පමාවකින් පසුව එකතුව රු.3,364,482 ක් 2020 වර්ෂයේදී රෝගීන් 23 දෙනෙකු වෙත වෛද්‍යාධාර ගෙවා තිබුණි. | වෛද්‍යාධාර ගෙවීම් කඩිනම් කිරීම කළ යුතු බව. | ලිපිගොණු සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය වන තොරතුරු එනම්, වැටුප් වාර්තා, බැංකු ගිණුම් විස්තර ආදිය ඉල්ලා සිටින අවස්ථාවලදී එම තොරතුරු ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හෝ ප්‍රමාද වීම හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇත. එසේම 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අවස්ථා කිහිපයකදීම කාර්යාලය වසා තැබීම සහ අවම කාර්ය මණ්ඩලයකින් කාර්යාලීය කටයුතු පවත්වාගෙන යාමද මෙයට හේතු වී ඇත. | *ඉහත පරිදි* |
| (ක) | 2020 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 21.25 ක අපේක්ෂිත වියදම් සහිත ක්‍රියාකාරකම් 09 ක් සිදු කිරීමට අදාල ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, අත්පත් කර ගත් ප්‍රගතිය සඳහන් වන වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 දෙසැම්බර් 15 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | ප්‍රගතිය සඳහන් වන වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු බව. | ජනාධිපති කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර ඇත. | 2022 පෙබරවාරි 28 දින වන විටත් 2021 වර්ෂයේ ජනාධිපති කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවට පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2018 නොවැම්බර් මාසයේදී අරමුදලට වසර 40 ක් පිරීම නිමිත්තෙන් පාලක මණ්ඩලය විසින් දුෂ්කර හා අඩු පහසුකම් සහිත තෝරාගත් රජයේ රෝහල් 12 ක් වෙනුවෙන් රු. මිලියන 437.81 ක රෝහල් උපකරණ ලබාදීමට 2019 ඔක්තෝබර් 11 දින විශේෂ ව්‍යාපෘති අනුමත කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මිලදීගෙන තිබුණු රු. මිලියන 90.71 ක් වටිනා වෛද්‍ය උපකරණ සඳහා වූ බිල්පත් 2020 වර්ෂයේදී අරමුදල විසින් පියවා තිබුණි. අරමුදලේ 42 වන සංවත්සරය ද එළඹ තිබුණු නමුත් 2021 දෙසැම්බර් 15 දින වන විටත් උක්ත විශේෂ ව්‍යාපෘතියේ ඉතිරි රු. මිලියන 347.1 කට අදාලව වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශේෂ ව්‍යාපෘති කඩිනම් කිරීම කළ යුතුය. | ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස සිදුකළ රු. 90,706,000 ක ගෙවීම සහ ඊට අදාළ ප්‍රගතිය ඉදිරියේදී පැවැත්වීමට නියමිත පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | 2022 පෙබරවාරි 28 දින වන විටත් පාලක මණ්ඩලය රැස්වී නොතිබුණි. |

49. විගණන අස්ථිත්‍යයේ නම - **ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල**

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති මතය 2018 - තත්ත්වාගණනය කල මතය

2019 - තත්ත්වාගණනය කල මතය

2020 - තත්ත්වාගණනය නොකල මතය

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| | ----------------- | ------------ | ----------------- | ------------------------ |
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතහි සංකල්පීය රාමුවට අනුව, වාර්තා කරන අස්තිත්වයට අදාලව සියලුම වියදම් සහ වත්කම් හඳුනාගෙන වාර්තා කරන අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. නමුත්, 2019 වර්ෂයට අදාලව අර්ථසාධක අරමුදලට සෘජුවම සම්බන්ධ රු.42,040,162 ක මෙහෙයුම් වියදම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන හෝ අනාවරණය කර නොතිබුණි. | 2003 දෙසැම්බර් 31 වැනි දින ගැසට් කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල් පනතේ රෙගුලාසි අංක 20 (i) අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිට (1969 නොවැම්බර් 1 සිට) පැවතුණ බව.<br>තවද, මෙම කරුණ ලංවිම අර්ථසාධක කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු (ගැසට් පත්‍රයෙන් පිහිටුවා ඇති පාලන ආයතනය වීම), 2021 පෙබරවාරි 11 වැනි දින පැවති කමිටු රැස්වීමේදී, අරමුදලේ කළමනාකරණ සහ පරිපාලන වියදම් මණ්ඩලය විසින් දැරීමේ දැනට පවතින පරිචය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතහි සංකල්පනාත්මක රාමුවට අනුව මේ වියදම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත නොහැක. අවම වශයෙන් මණ්ඩලය විසින් දරනු ලබන පිරිවැය මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් හෝ කළ යුතු බව. | මෙම ගැටළුව නිවැරැදි කිරීම සඳහා ගැසට් නිවේදනය සංශෝධනය කිරීමට අමාත්‍යංශ විගණන කමිටුව තීරණය කර ඇතත් තවමත් කිසිදු ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉදිරියට ද සිදු කිරීමට තීරණය කරන ලද බව. | | |
| (ආ) | ආරක්ෂණ ක්‍රියාපටිපාටි ලෙස ගිණුම්කරණ පද්ධතිය සඳහා මුරපද භාවිතාය ස්ථාපිත කර නොතිබූ අතර අරමුදල ආරම්භයේ සිටම ගිණුම්කරණ තොරතුරුවල උපස්ථයන් ද පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ හේතුවෙන් ගිණුම්කරණ පද්ධතියේ දත්ත වල ආරක්ෂාව අවදානමකට ලක්ව ඇති බව නිරීක්ෂණය විය | අරමුදලේ සහ ව්‍යාපෘති වල මෙහෙයුම් සඳහා නිසි ආරක්‍ෂාව සහ උපස්ථ පහසුකම් සහිත තොරතුරු කළමනාකරණ පද්ධතියක් (MIS) පිහිටුවීම සඳහා 2021 ජනවාරි 15 වැනි දින ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2021 ජූලි 8 වැනි දින Ms. Management System (Pvt) සමාගම වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත. එය ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2022 ජනවාරි මාසයේ සිට මාස තුනකින් (03) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව. | පවතින පද්ධතිය සහ නව පද්ධතිය සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ ක්‍රමවේද යෙදිය යුතු අතර පද්ධති තොරතුරු වල උපස්ථයන් පවත්වා ගත යුතු බව. | පවතින පද්ධතියට සමගාමීව නව තොරතුරු කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වෙමින් පවති. එහෙත් පවතින පද්ධතිය තුල ආරක්ෂණ ක්‍රියාමාර්ග සකසා නොමැත. |
| (ඇ) | 2017.12.31 දිනට ආයෝජනයෙන් ලැබිය යුතු මුදල් වන රු.2,157,483,000 ක්, එම මූල්‍ය උපකරණ වල නොපැවැත්ම හා එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී මඟින් තහවුරු කිරීම් නොලැබීම නිසා අයකර ගැනීම සැක සහිත මුදල සඳහා කිසිම ගැලපීමක් හෝ අගය අඩුවීම සඳහා වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල විසින් එන්ට්‍රස්ට් සිකියුරිටීස් පීඑල්සී සමාගමට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු අංක: DMR/1405/2018 යටතේ සිවිල් නඩුවක් ආරම්භ කර තිබුණි. මෙම ආයෝජනය සඳහා වන මුහුණත වටිනාකම සහ පැහැර හරින ලද කූපන් පොලී ආපසු අයකර ගැනීමට සහ නඩුව පූර්ව නඩු විභාගය සඳහා නියම | මේ සඳහා වෙන් කිරීමක් කල යුතු බව. | මේ සම්බන්ධයෙන් ආරම්භ කරන ලද නඩුවේ, පූර්ව නඩු විභාගය 2022 මාර්තු 22 දින සහ 2022 අගෝස්තු 01 දිනට දින නියම කර තිබූ අතර මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කරන ලදී. නැවත නඩු විභාගය 2022 මාර්තු 10 වැනි දින පැවැත්වීමට නියමිතය. තවද, අරමුදලේ වාර්ෂික ආදායම් ප්‍රකාශය මගින් මෙම ආයෝජන ප්‍රතිපාදන මත සිදුවන යම් හානිකරණයට එරෙහිව ආයෝජන සංචිතයක් නිර්මාණය කර ඇත. 2020 දෙසැම්බර් 31 අවසන් වන විට එම සංචිතය රු.1,865.333,129 කි. | | |
| (ඇ) | **අර්ථසාධක අරමුදල රෙගුලාසි- රෙගුලාසි 4 - ඉපයීම්.** මෙම විධිවිධානයට පටහැනිව, , ලංකා විදුලිබල මණ්ඩලය විසින් අරමුදලට සේවක දායකත්වය ගණනය කිරීමේදී ඉපැයීම් වලට නික්මයාම දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව/අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතරින් වැඩිම දීමනාව ද සලකා බලා තිබුණි. | අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කිරීමේදී, පුද්ගල චක්‍රලේඛ අංක: DGM/Policy/Policy හා 2007 ඔක්තොම්බර් 23 දිනැති චක්‍රලේඛය අනුව ඒකාබද්ධ වැටුපට අමතරව, ඉහළම දීමනාව (නික්මයාම දීමනාව, පශ්චාත් උපාධි දීමනාව, වෘත්තීය දීමනාව සහ අර්ධ වෘත්තීය දීමනා අතරින්) සලකා බලන ලද බව. | ගැසට් පත්‍රයේ රෙගුලාසි අංක 04 යටතේ ගැනෙන ඉපයීම් පමණක්, ඉපයීම් ගණනය සඳහා යොදාගත යුතු බව. | රෙගුලාසි අංක 4 ප්‍රකාරව ඇතුළත් කළ නොහැකි දීමනා ඇතුළත් කර දායකත්වය ගණනය කර තිබුණි. |
| | **අර්ථසාධක අරමුදල් රෙගුලාසි- රෙගුලාසි අංක 22 - සමාජික ලාභාංශ** | | | |
| | ගෙවීමේ විධිවිධානයට පටහැනිව, සමාජිකයින්ට ලාභාංශ ගෙවීමේ දී, පෙර | සාමාජිකයා විශ්‍රාම ගොස් ඇති පසුගිය වසරේ දායකත්වය සඳහා | සේවක අර්ථසාධක අරමුදලේ රෙගුලාසි අංක 22 ට අනුව | රෙගුලාසි අංක 22 ට අනුව ලාභාංශ තීරණය කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| වර්ෂය අවසානයේ පැවති සාමාජිකයින්ගේ ණය ශේෂය වෙනුවට ලාභාංශ ගණනය කර වර්ෂයේ අවසානයට පැවති සාමාජිකයින්ගේ ණය ශේෂය මත පදනම්ව ලාභාංශ ගෙවා ඇත. තවද, මෙම විධිවිධානයට පටහැනිව, | ලාභාංශ එකතු වී නැත, එබැවින් N. 22 රීතියෙන් ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වේ. | සාමාජික ලාභාංශ ගෙවිය යුතු බව. | |
| සමහර වියදම් හා සංචිත සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට පෙර අදායම් පදනම් කරගෙන ලාභාංශ ගණනය කර ඇත. | ලාභාංශ ගණනය කිරීම සංචිත සහ ප්‍රතිපාදන වෙන්කිරීමෙන් කිරීමෙන් පසු සහ අරමුදලට අය කළ හැකි වියදම් අඩු කිරීමෙන් පසුව නිසි ලෙස සිදු කෙරේ. | සමහර වියදම් හා සංචිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු ආදායම් පදනම් කරගෙන ලාභාංශ ගණනය කල යුතු බව | සංචිත සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර ආදායම් පදනම් කරගෙන ලාභාංශ තීරණය කරයි. |